سنهال
٠٣

الاصدار
العشرون

# ෂර්හ් උසූල් අල්-ඊමාන්

## (ඉස්ලාමීය විශ්වාස පද්ධති විග්‍රහය)

කතෘ

මුහම්මද් බින් සාලිහ් අල් උතෙමීන්

සිංහලෙන්

අබූෂාඉරා මුහම්මදු හුසෙයින්

# شرح أصول الإيمان

تأليف فضيلة الشيخ

محمد بن صالح العثيمين رحمه الله

ترجمه

أبو شاعره محمد حسين
مكتب الدعوة بحي الروضة



The Cooperative Office For Call & Guidance to Communities at Rawdhah Area
Under the Supervision of Ministry of Islamic Affairs and Endowment
and Call and Guidance -Riyadh - Rawdhah
4922422 - fax.4970561 E.mail: mrawdhah@hotmail.com P.O.Box 87299 Riyadh 11642

# شرح أصول الإيمان

تأليف-فضيلة الشيخ- **محمد بن صالح العثيمين** (رحمه الله)

# ෂර්හ් උසූල් අල්-ඊමාන්

## (ඉස්ලාමීය විශ්වාස පද්ධති විග්‍රහය)

ترجمه - أبو شاعره محمد حسين

مكتب الدعوة بحي الروضة

**කතෘ**

**මුහම්මද් බින් සාලිහ් අල් උතෙමීන්**

**සිංහලෙන්**

**අබූෂාඉරා මුහම්මදු හුසෙයින්**

කැඳවීමේ හා මගපෙන්වීමේ සහයෝගී කාර්යාලය,
අල්-රවදා සමාජ ඒකකය - රියාද්,
සවුදි අරාබියාව. ✆ 4922422.

ح المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالروضة، ١٤٢٥هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

العثيمين، محمد بن صالح

شرح أصول الإيمان / محمد بن صالح العثيمين - الرياض، ١٤٢٥ هـ.

١١٦ ص؛ ١٢ X ١٧ سم

ردمك: ٢ - ١ - ٩٥٣٩ - ٩٩٦٠

(النص باللغة السنهالية)

١- الإيمان (الإسلام) أ- العنوان

ديوي ٢٤٠ ١٤٢٥/٢٤٦٠

رقم الايداع: ١٤٢٥/٢٤٦٠

ردمك: ٢-١-٩٥٣٩-٩٩٦٠

بسم الله الرحمن الرحيم

# පෙරවදන

**මහා කාරුණික අතිදයාන්විත අල්ලාහ්ගේ නාමයෙන්**

إن الحمد لله نحمده ونستعينه ونستغفره ونعوذ بالله من شرور أنفسنا ومن سيئات أعمالنا من يهده الله فلا مضل له ومن يضلل فلا هادي له وأشهد أن لااله إلا الله وحده لا شريك له وأشهد أن محمدا عبده ورسوله ،صلى الله عليه وعلى آله وصحبه ومن تبعهم بإحسان إلى يوم الدين .

පැසසුම් සියල්ල සර්වබල අල්ලාහ්ට හිමිය. මහු ප්‍රශංසා කර මහුගෙන්ම සහාය පතමු. අපගේ පාපයන් හට මහුගෙන්ම පවසමා අයැදිමු. පව හා නින්දිත ක්‍රියාවන් හට ලක් නොවී සිටීමටද, මහුගෙන්ම ආරක්ෂා පතමු. අල්ලාහ් පෙන්වන යහමග කවරෙකු හට ලැබෙන්නේද, මහු නොමග යැවීමට කිසිවෙකු නැත. එමෙන්ම අල්ලාහ්ගේ යහමග කවරෙකු හට ලැබෙන්නේද, ඒ තැනැත්තා යහමග යැවීමට කිසිවෙකුට නොහැකිය. තවද, නැමදීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවද, මුහම්මද් තුමා අල්ලාහ්ගේ කීකරු අතවැසියා සහ අවසාන වක්තෘ වරයා බවත් සාක්ෂි දරමි. අප අවසාන වක්තෘ මුහම්මද් නබි තුමාටත්, එතුමාගේ උතුම්වූ පවුලේ සාමාජිකයන්ටත්, එතුමාගේ අසහාය හිතමිතුරන්ටත්, පරමාන්ත දිනය දක්වා යහමග යොමු අනුගාමිකයන්ටත් ශාන්තිය හා සමාදානය සදා අත්වේවා!

තව්හීද් නම් ඒකදේවවාද ධර්මයේ දැනුම සියලු දැනුමන්ට වඩා ප්‍රධානවේ. මන්දයත් සර්ව බලධාරී අල්ලාහ්ගේ නාමයන්, ගුණාංගයන් සහ ඔහුගේ අනවැසියන් ඔහු වෙනුවෙන් අනලස්ව ඉටු කළයුතු යුතුකම් වැනි දේවල්හී අවබෝධයක් තිරසාර ලෙස ලබා දෙයි. මෙම උත්කෘෂ්ට දැනුම හැදෑරීම මුස්ලිම් සියලු දෙනාගේ පරම යුතුකම වේ.

ඒ හැර මෙම තව්හීද් නම් ඒකදේවවාද දැනුම වනාහී අල්ලාහ් වෙත ඔහුගේ අනවැසියන් යුහුසුලුව ළඟා කරන්නාවූ මාවතෙහි දොරටුව සහ ඔහුගේ අද්විතීය ෂරිඅත් නීති මාලාවන්හී මූඛ්‍ය දැනුමද වේ.

එහෙයින් ලොවෙහි පහළවූ සියලු වක්තෘවරු අල්ලාහ්ගේ ඒකීයභාවය කෙරෙහි ඒකමතික වී ඒ කෙරෙහි කැඳවූහ.

﴿وما أرسلنا من قبلك من رسول إلا نوحي إليه أنه لاإله إلا أنا فاعبدون﴾

*(නබි තුමනි) ඔබට පෙර අප විසින් 'සැබැවින්ම (වැඳීමට සුදුසු දෙවියා) මා හැර අන් (සත්‍ය දෙවි) කෙනෙකු නැත, එහෙයින් මා පමණක් වඳින්න' යනුවෙන් දේව හෙළි දරව් පහළ නොකර පිටත් කළ කිසිදු වක්තෘ වරයෙකු මිහිපිට සිටියේ නැත.* (21 : 25)

තවද, සර්ව බල අල්ලාහ්, ඔහුගේ උධාරතර කේවලත්වය කෙරෙහි තමාම සාක්ෂි දරයි. ඒ හා අල්ලාහ්ගේ මලාඉකාවරු (සුරදූතයන්) සහ (ආගමික දැනුම් ඇති) ඥානීවරුද සර්ව බල අල්ලාහ්ගේ මහානුභාව කේවලත්වය කෙරෙහි සාක්ෂි දරමින් සිටී.

﴿ شَهِدَ اللَّهُ أَنَّهُ لاَ إِلَهَ إِلاَّ هُوَ وَالْمَلاَئِكَةُ وَأُوْلُواْ الْعِلْمِ قَآئِمَاً بِالْقِسْطِ لاَ إِلَهَ إِلاَّ هُوَ الْعَزِيزُ الْحَكِيمُ ﴾

*(නබි තුමනි, 'සැබැවින්ම ඔහු හැර වැඳීමට සුදුසු (අන්) දෙවි කෙනෙකු නැතැයි අල්ලාහ්ද, (එසේම) මලාඉකාවරු සහ (ඉස්ලාමීය) පඬිවරුද යුක්තියෙහි නිරත වෙමින් සාක්කි දරයි. ඔහු (අල්ලාහ්) හැර වැඳීමට සුදුසු අන් දෙවියෙකු නැත. ඔහු සර්ව බලසම්පන්න සර්වඥානයා වේ.*

(අල්කුර්ආන් 3 : 18)

මෙවැනි අතිමහත් සම්භාවණීය ඒකීයභාවය ගැනවූ දැනුම හැදෑරීම, ඒ කෙරෙහි විශ්වාස තැබීම සහ ඒවා අනුන් හට ඉගැන්වීම සෑම මුස්ලිම් කෙනෙකු කෙරෙහිම අනිවාර්යය වේ. එසේ අධ්‍යයනය කිරීමෙන් විනා අන් ක්‍රමයකින් මුස්ලිම් වරයෙකු තම ආගමෙහි යෙහෙන් ස්ථිරව නිරත විය නොහැකිය. තවද, මෙම දැනුම හැදෑරීමෙන් එක්සිත්ව නිදහසෙන් තෘප්තිමත්ව ඉස්ලාම් ආගම පිළිපැදීමටද, එහි උපරිම ප්‍රතිඵලය ලබාගැනීමටද හැකි වන්නේය.

සියල්ල දන්නේ අල්ලාහ් දෙවිඳු පමණි

❀ ❀ ❀

# දීනුල් ඉස්ලාම්

සර්ව බල සර්ව ඥාන දෙවියා අල්ලාහ්, අවසාන වක්තෘ වරයා වූ මුහම්මද් නබි තුමා කුමණ ආගමක් ප්‍රචාරය කිරීම සඳහා අනුමත කරන ලද්දේද, එය ඉස්ලාම් ආගම වේ. අල්ලාහ් එමගින් ලොවෙහි වූ අන් සියලු ව්‍යාජ හා සාවද්‍ය ආගම් තිමාවට පත්කරමින් තම අතවැසියන් හට ඒ ඉස්ලාම් ආගම පරිපූර්ණ කළේය. එමගින් සියලු දයාදයන් හා වරප්‍රසාදයන්ද මිනිසාට සම්පූර්ණයෙන් පිරිනමා, එය ආදර්ශමත් හා සරල මාර්ගෝපදේශයක් ලෙසද පුද කළේය. එහෙයින් අල්ලාහ් විසින්ම අනුමත කරන ලද ඒ දීන්[1] (ඉස්ලාම් ආගම) හැර, අන් කිසිදු ආගමක් අල්ලාහ් කිසිවිටෙක කිසිවෙකුගෙන් අනුමත නොකරන්නේය.

එය සනාථ කරමින් අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ماكان محمد أبا أحد من رجالكم ولكن رسول الله وخاتم النبيين﴾

*(මනුෂ්‍යයිනි) මුහම්මද් තුමා ඔබගේ පිරිමින්ගෙන් කිසිවෙකුගේ පියා නොවන්නේය. නමුදු එතුමා අල්ලාහ්ගේ වක්තෘ වරයා සහ නබිවරුන්ගේ අවසානයාද වේ.* (33 : 40)

---

[1] *දීන් යන අරාබි වචනය ආගම, ලබ්ධිය සහ භක්තිය (Religion) වැනි අපූරු ශබ්දකෝෂවල පරිවර්තනය කර ඇත. නමුදු, එහි නියම තේරුම වන්නේ මිනිස් ජීවිතයට එලොව සහ මෙලොවට අවශ්‍ය සියලු සෞභාග්‍ය උපදෙස් හා නීතිරීතින් අල්ලාහ් විසින් පහළ කළ දීන් මගිනි. දීන් මිනිස් දිවි පැවැත්මට අවශ්‍ය සියලු අවස්ථාවන් හා ස්වභාවයන් නොඅඩුව පරිපූර්ණ කරන්නේය.*

තවද පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴾ اليوم اكملت لكم دينكم و اتممت عليكم نعمتى و رضيت لكم الإسلام دينا ﴿

*අද දින මබට මබගේ දීන් (ආගම) සම්පූර්ණ කළෙමි. මාගේ ආශීර්වාදයන්ද මබ වෙත පරිපූර්ණ කළෙමි. තවද, ඉස්ලාම් මබගේ දීන් (සම්පූර්ණ ආගම් මාර්ගය) වශයෙන් අනුමත කර ගතිමි.* (අල්කුර්ආන් 5 : 3)

තවත් ශුද්ධවූ අල්කුර්ආන් වැකියක් මෙසේ පවසයි:

﴾ إن الد ين عند الله الإسلام ﴿

*අල්ලාහ් වෙත අනුමතවූ එකම දීන් (ආගම) ඉස්ලාම් පමණයි.* (අල්කුර්ආන් 3 : 19)

﴾ ومن يبتغ غير الإسلام دينا فلن يقبل منه وهو فى الآخرة من الخسرين ﴿

*යමෙකු ඉස්ලාම් නොවන දෙයක් ආගමක් වශයෙන් අපේක්ෂා කරන්නේ නම්, එය මහු වෙතින් කිසිසේත් පිළිගනු නොලැබේ. තවද, හෙතෙම අවසාන (පරමාන්ත දින)යේ නෂ්ට (අපායට නියමිත)යෙකු බවට පත් වන්නේය.* (අල්කුර්ආන් 3 : 85)

මෙම ආගම වැළඳ ඒ අනුව සිතැඟිව අල්ලාහ්ට කීකරු අතවැසියෙකු ලෙස ජීවත්වන ලෙස සියළු දෙනා කෙරෙහි බල කර ඇත.

මුහම්මද් තුමා අමතා සර්ව බල අල්ලාහ් පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ පවසයි:

﴿قل يأيها الناس إني رسول الله إليكم جميعا الذى له ملك السموات والأرض لاإله إلا هو يحى ويميت فآمنوا بالله ورسوله النبي الأمي الذي يؤمن بالله وكلماته واتبعوه لعلكم تهتدون﴾

*(නබිතුමනි!) පවසනු මැනව! 'මනුෂ්‍යයනි, අහස් සහ පොළොවෙහි ආධිපත්‍යයාවූ අල්ලාහ්, මා ඔබ (මිනිසා) වෙනුවෙන් වක්තෘවරයෙකු ලෙස පත්කර ඇත. ඔහු හැර වැඳීමට අන් සුදුස්සෙකු නැත. උපත සහ විපත සලස් වන්නේ ඔහුය. එහෙයින් අල්ලාහ් සහ ඔහුගේ ලිවීමට හා කියවීමට නොදත් වක්තෘවරයා කෙරෙහි විශ්වාස කරනු මැනව! ඔහු (මුහම්මද් තුමා), අල්ලාහ් සහ ඔහුගේ වචන කෙරෙහි විශ්වාස තබයි. එහෙයින් ඔබ යහමග යනුවස් ඔහු අනුගමනය කරනු මැනව!* (7 : 158)

අබූ හුරෙයිරා තුමා හෙළි කළ හදීසයක් මෙසේය:

මුහම්මද් තුමා මෙසේ දෙසූහ: මාගේ ප්‍රාණය කාගේ අතෙහි වේදෝ, ඒ අල්ලාහ් මත දිවුරා කියමි, මෙම සමාජයේ කෙනෙකු හෙතෙම යුදෙව්වෙකු හෝ වේවා ක්‍රිස්තියානියෙකු හෝ වේවා ඔහු මා ගැනවූ පුවතට සවන්දීමෙන් පසු, මා මගින් ඉදිරිපත්වූ සුභ පණිවුඩය පිළිනොගෙන මිය යන්නේ නම් ඔහු නිරයේ කෙනෙකු මිස අන් කෙනෙකු නොවන්නේය.(ග්‍රන්ථය : මුස්ලිම්)

❀❀❀

# වක්තෘ මුහම්මද් තුමා කෙරෙහි විශ්වාසය

මුහම්මද් තුමා කෙරෙහි සහ එතුමා ප්‍රචාරය කළ සද්ධර්ම දේ කෙරෙහිද මුලුහදින් විශ්වාස කිරීම මෙයින් අදහස් කෙරේ. එමෙන්ම, එය හිතෛෂිව පිළිගෙන එතුමාගේ අනුශාසනානුකූලව ජීවත්වීමද වේ. එහෙයින් එතුමාගේ පියාගේ සහෝදරයෙකු වන අබූතාලිබ්, එතුමා විසින් ප්‍රචාරය කරන ලද ආගම සත්‍ය හා දිව්‍යමය ආගමක් ලෙස අවබෝධ කරගෙන සිටියද, එය විශ්වාස කර නොපිළිගත් හෙයින් ඔහු විශ්වාසවන්තයින්ගේ සණයෙහිලා සැළකිය නොකැකිය.

ඉස්ලාම් ආගම මෙයට පෙර පහළවූ ආගම්වල සඳහන් වූ සත්‍ය විශේෂ ලක්‍ෂණ සහ සුභසිද්ධීන් සියල්ල අන්තර් ගතවූ ආගමක් වේ. එමෙන්ම මෙම ඉස්ලාම් ආගම භේදයෙන් තොර සියලු දනන් හට ඔබින කාලෝචිත ආගමක් නිසා එය අනෙකුත් ආගම්වලට වඩා විශේෂත්වයක් ලබන්නේය.

දහම පහළ කිරීම ගැන අල්ලාහ් දෙවිඳු මුහම්මද් නබි තුමා අමතා පරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ පවසයි :

﴿وَأَنزَلْنَا إِلَيْكَ الْكِتَابَ بِالْحَقِّ مُصَدِّقًا لِّمَا بَيْنَ يَدَيْهِ مِنَ الْكِتَابِ وَمُهَيْمِنًا عَلَيْهِ﴾

*තවද, (නබි තුමනි සම්පූර්ණයෙන්ම) සත්‍යයෙන් හෙබි මෙම දහම අප ඔබ වෙත පහළ කළෙමු. මෙ එයට පෙරවූ ශුද්ධ ග්‍රන්ථන්හි ශේෂවූ වැදගත් (සත්‍ය) කරුණු හට අනුකූලතා දක්වමින් ඒවා ආරක්‍ෂා කරන්නේය.*

(අල්කුර්ආන් 5 : 48)

ඉස්ලාම් ආගම සියලු සමාජයන් හට සුදුසු කාලෝචිත ආගමක් යන්නෙහි තේරුම, ඒ ආගම නිසිලෙස පිළිපැදීම කෙරෙහි කිසිකලෙක කිසිවෙකු හට කිසිදු අපහසුවක හෝ පීඩාවක් හෝ නොවී මිනිසාගේ සුභසිද්ධීන්ට කිසිසේත් හරස් නොවන නිසාය. මෙහි අදහස සමහර අයගේ අමූලික අදහස් සේ, මෙම සත්‍ය ආගම කවදත් සියලු සමාජයන්හී සැමගේ බලයට යටත් වූවක්ද නොවේ.

මෙම ආගම එය විධිමත්ව පිළිපදින්නන් හට පිටුවහල වීමටද, ඒ අය අනුන්ට වඩා සමෘධිමත් ලෙස ඉස්මතුවීම කෙරෙහිද සර්ව බලධාරි වූ අල්ලාහ් පොරොන්දු වී ඇත.

﴿هُوَ الَّذِي أَرْسَلَ رَسُولَهُ بِالْهُدَى وَدِينِ الْحَقِّ لِيُظْهِرَهُ عَلَى الدِّينِ كُلِّهِ وَلَوْ كَرِهَ الْمُشْرِكُونَ﴾

*මිසදිටුවන් (එය) පිළිකුල් කළද, මෙම (සත්‍ය) ආගම අන් සැම දහමන් අභිබවීම පිණිස (අල්ලාහ්) මහු (මුහම්මද් තුමා) තුමාගේ වක්තෘවරයා යහමඟ සහ තමාගේ සත්‍ය වූ ආගම කෙරෙහි පිටත් කළේය. (අල්කුර්ආන් 61 : 9)*

﴿وَعَدَ اللَّهُ الَّذِينَ آمَنُوا مِنكُمْ وَعَمِلُوا الصَّالِحَاتِ لَيَسْتَخْلِفَنَّهُم فِي الْأَرْضِ كَمَا اسْتَخْلَفَ الَّذِينَ مِن قَبْلِهِمْ وَلَيُمَكِّنَنَّ لَهُمْ دِينَهُمُ الَّذِي ارْتَضَى لَهُمْ وَلَيُبَدِّلَنَّهُم مِّن بَعْدِ خَوْفِهِمْ أَمْنًا يَعْبُدُونَنِي لا يُشْرِكُونَ بِي شَيْئًا وَمَن كَفَرَ بَعْدَ ذَلِكَ فَأُوْلَئِكَ هُمُ الْفَاسِقُونَ﴾

*(මිනිසුනේ,) ඔබලගෙන් අල්ලාහ් විශ්වාස කර කුසල් කර්මයන් කරනා අය වේද, ඔවුන්ට පෙරවූ සමාජයේ අය අධිපතිවරු කළා සේ නිසැකයෙන්ම ඔවුන් හටද මිහිපිට*

*අධිපතිවරු කරනා බවත්,අල්ලාහ් මවුන් වෙනුවෙන් ස්ථාපිට ආගමෙහි, සැබැවින්ම ස්ථිර කරනා බවත්, මවුන්ගේ බිය සැක දුරුකර අභය දෙන බවත් සර්ව බලධාරී අල්ලාහ් පිළින දුන්නේය. මවුන් මා හට ආදේශයන් නොකර මා වඳිනු ඇත. මින් මතු (මාහට මබගෙන්) ආදේශ කරන්නේ කවරෙක්ද, සැබැවින්ම මවුන් (අල්ලාහ්ගේ අණ නොපිළිපදිනා) දුදනන් වේ.* (අල්කුර්ආන් 24 : 55)

ඉස්ලාම් ආගම යනු අද්විතීය ප්‍රතිපත්ති මාලාවන් රාශියක් සහ ෂරීආ (අල්ලාහ් විසින් විධානය කරන ලද පරමාදි පත්‍යවූ නීතිමාලා) වන් වලින් සර්ව සම්පූර්ණවූ එකකි.

ඒවායෙන් සමහරක් මෙසේය:

1. ඒකදේවවාදය තහවුරු කර, දෙවියන් හට ආදේශ කිරීම වළක්වන්නේය.
2. සත්‍ය පමණක් පැවසීම කෙරෙහි අණ කර, මුසාවාදයෙන් ඈත් කරන්නේය.
3. යුක්තිය කෙරෙහි අමතා, අයුක්තිය තුරන් කරයි.
4. විශ්වාසය හා සාමූහික එකාග්‍රතාවය සනාථ කර, විශ්වාස කඩකර ද්‍රෝහිකම් කිරීම වළකන්නේය.
5. පොරොන්දු ඒ ආකාරයෙන්ම ඉටුකර, දුන් පොරොන්දු කඩ කිරීම වළක්වන්නේය.
6. දෙමාපියන් හට අවශ්‍ය යුතුකම් ඉටුකර, මවුන් නොසළකා හැරීම වළක්වන්නේය.
7. නෑදෑයන් හා එකමුතුව ජීවත්වීම කෙරෙහි අණ කර මවුන් කෙරෙන් ඈත්වී ජීවත්වීමෙන් වළක්වන්නේය.

8. අසල්වැසියා සමග සාමයෙන් හා සහයෝගයෙන් ජීවත්වී ඔවුන් අසමගිකම් ඇතිකර ගැනීමෙන් වළක් වන්නේය.

සැකෙවින් පවසනවානම්, ඉස්ලාම් දහම ශිෂ්ඨ සම්පන්න අංගසම්පූර්ණ විනයත්වයක් රකින ලෙස පවසමින් දුෂ්ට හා අනෙකුත් නොමනා ක්‍රියාවන් සියල්ලන්ගෙන් වළකී සිටින ලෙස අනතරු අඟවයි. තවද, සියලු කුසල් කර්මයන් කෙරෙහි අමතා අකුසල් කර්මයන්ගෙන් ඉවත් වන ලෙසද තරයේ කියා සිටී. (කෙටියෙන් පවසනවානම් ඉස්ලාම් දහම සරිසමාප්ත විනයගරුක හා අධ්‍යාත්මික ජීවිතයක් කෙරෙහි මිනිසා අමතන්නේය)

﴿إِنَّ اللَّهَ يَأْمُرُ بِالْعَدْلِ وَالإِحْسَانِ وَإِيتَاءِ ذِي الْقُرْبَى وَيَنْهَى عَنِ الْفَحْشَاءِ وَالْمُنكَرِ وَالْبَغْيِ يَعِظُكُمْ لَعَلَّكُمْ تَذَكَّرُونَ﴾

*සැබැවින්ම අල්ලාහ් යුක්තිය ඉටුකරන ලෙසත්, කුසල් කර්මයන්හී යෙදෙන ලෙසත්, (ද්‍රව්‍ය මගින්) නෑදැයින් හට උදව් කරන ලෙසත් (ඔබ හට) අණ කරයි. තවද දූෂණ හා වැරැදි ක්‍රියාවන්ගෙන් (ඔබ) වළක්වයි. මේවා ඔබ අවබෝධ කර පරෙස්සම් වීම පිණිස අල්ලාහ් ඔබ හට උපදෙස් දෙයි.* (අල්කුර්ආන් 16 : 90)

❀ ❀ ❀

# ඉස්ලාමයේ මූලික කුළුණු

අබ්දුල්ලාහ් ඉබ්නු උමර් තුමා මගින් හෙළිවූ හදීසයක් මගින් ඉස්ලාමයේ මූලික යුතුකම් පහක් බව පැහැදිළිවේ.

بني الإسلام على خمس شهادة أن لاإلـه إلا الله وأن محمدا عبـده ورسـوله وإقام الصلاة وإيتاء الزكاة وصيام رمضان والحج .

ඉස්ලාමයේ මූලික කුළුණු පහ මෙසේ වේ.

1. 'අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහ් වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහූ වරසූලුහූ' යනුවෙන් ප්‍රකාශ කර සාක්ෂි දැරීම වේ. (එනම් 'වැඳීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැත. තවද, මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දාසයෙකු සහ අවසාන වක්තෘවරයාද වේ.)
2. සලාත් (දෛනික නැමදුම) හී අඛණ්ඩව නිරත වීම.
3. සකාත් නම් දුගී බද්ද ගෙවීම.
4. රමළාන් මාසයේ සවම් නම් උපවාසයෙහි යෙදීම.
5. හජ් කර්තව්‍යය ඉටු කිරීම.

'හජ් කිරීම, (පසුව) රමළාන් මාසයේ උපවාසයෙහි යෙදීම යන (අනු) පිළිවෙලින්ද?' යනුවෙන් කෙනෙකු විමසූ කළ, 'නැත. රමසාන් මාසයේ උපවාසයෙහි යෙදීම සහ හජ් කිරීම' යනුවෙන් මුහම්මද් තුමා පවසනු මම අසා ඇත්තෙමි' යි ඉබ්නු උමර් තුමා පැවසූහ.

(ග්‍රන්ථ : බුහාරි සහ මුස්ලිම්)

**වැඳීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් දෙවියෙකු නැත. තවද, මුහම්මද් නබිතුමා අල්ලාහ්ගේ දාසයා සහ අවසාන වක්තෘවරයාද වේ යනුවෙන් සාක්ෂි දැරීම:**

මෙය ස්ථිර විශ්වාසයක පදනම වේ. මෙම වදන් පෙළ තිරසරව ප්‍රකාශ කරන්නා, මහුගේ ස්ථිරතාවය නිසා එය සියැසෙන් දුටුවෙකු සේ වන්නේය. සාක්ෂි දරන කරුණු එකට අධික වූවද, දිවුරුම එක් ප්‍රකාශයකින් සීමා කිරීමට හේතු:

1. වක්තෘ මුහම්මද් තුමා සර්ව බලධාරි අල්ලාහ් වෙතින් ලබා ගත්තා දිව්‍යමය පණිවුඩය රැගෙන ප්‍රකාශ කරන්නෙකි. මහු අල්ලාහ්ගේ කීකරු අනාවැසියෙකු හා වක්තෘවරයෙකුද වේ යනුවෙන් වදන් මගින් තිරසාරව සාක්ෂි දැරීම 'ලාඉලාහ ඉල්ලල්ලාහ්' යනුවෙන් සාක්ෂි දැරීමෙහි පරිපූරණත්වය වේ.

2. ක්‍රියාවන් විධිමත් වීමට හා ඒවා පිළිගැනීමටද මෙම සාක්ෂි දෙක පදනම් වේ. යම් කරුණක් විධිමත් වීම සහ පිළිගැනීම කරුණු දෙකක් මත රඳා පවතී.

අ. සෑම කාර්යයක්ම අල්ලාහ් වෙනුවෙන් පමණක් ඉටුකිරීම

ආ. එම කාර්යයන් සඳහා නබි තුමා ආදර්ශයට ගැනීම.

යමෙකු අල්ලාහ් උදෙසා පමණක් සියලු කාර්යයන් ඉටු කිරීමෙදී 'වැඳීමට සුදුසු අල්ලාහ් හැර අන් කෙනෙකු නැත' යන්නාවූ සාක්ෂිය ස්ථිර වන්නේය.

සියලු කටයුත්තන් වෙනුවෙන් මුහම්මද් තුමා ආදර්ශයට ගැනීමෙන් එතුමා අල්ලාහ්ගේ දාසයා සහ අවසාන වක්තෘ වරයාද වේ යන සාක්ෂියද ස්ථිර වේ.

ඒ ඒකීයවාද සාක්ෂි දැරීමෙහි ඇති ප්‍රතිඵල:

නිර්මාණයන් හට යටත් වී සිරස නොනැමීම කෙරෙහි සහ වක්තෘවරුන් හැර අන් අය ආදර්ශයට ගැනීම වෙතින් සිත සහ හැඟීම් නිදහස්වීම ඒකීයවාදයේ ප්‍රධාන ඵත්මාවන්ගෙන් එකක් වෙ.

2. දෛනික සලාත් (නැමදුම) අඛණ්ඩව ඉටු කිරීම:

නැමදුම ක්‍රමවත්ව, වෙලාවන් පැහැර නොහැර නියමාකාරයෙන් ඒ ඒ වෙලාවන්හී ඉටුකිරීමෙන් අල්ලාහ්ට කීකරුවීම.

සලාත් නිසිලෙස ඉටුකිරීමෙන් ඇතිවන ප්‍රතිඵල:

සිතට සැනසීම, දෙනුවන් පිනවීම, ලැජ්ජා සහගත සහ අශීලාචාර ගතිවලින් මිදීම වැනි කාර්යයන් වෙ.

3. සකාත් (දුගී බද්ද) නිසියාකාරව ගෙවීම:

සකාත් ගෙවීමට අනුමතවූ ද්‍රව්‍යයන්ගෙන් ගෙවීමට නියමවූ ප්‍රමාණය සුදුස්සන්ට ගෙවීම මගින් අල්ලාහ්ට කීකරුවීම.

සකාත් නිසි ලෙස ගෙවීමෙන් ඇතිවන ප්‍රතිඵල:

මසුරුකම හා තණ්හාව වැනි අධම ගුණයන්ගෙන් සිත පිරිසිදු කිරීම සහ ඉස්ලාමීහී හා මුස්ලිම්වරුන්ගේ සහෝතුක උවමනාවන් ඉටුකිරීම.

4. රමළාන් මාසයේ සවම් (උපවාස ශීලයෙ)හි යෙදීම.

රමළාන් මාසයේ උපවාස ශීලය රැක දිවා කාලයේ එය නිෂ්ප්‍රභා කරන කාර්යයන්ගෙන් වැළකී සිට අල්ලාහ්ට කීකරු වීම.

උපවාස ශීලය රැකීමෙන් ඇති ප්‍රතිඵල:

අල්ලාහ්ගේ තෲප්තිය පතා තමා ඇලුම් කරන දේ වෙතින් මද වේලාවකට හෝ ඉවත්වී සිටීම.

5. හජ් කටයුත්ත ඉටුකිරීම පිණිස මක්කාහී අධාල සුද්ධස්ථානයන් වෙත යෑමෙන් අල්ලාහ්ට කීකරු වීම.

හජ් කටයුත්ත ඉටුකිරීමෙහිලා ඇති ප්‍රතිඵල :

අල්ලාහ් කෙරෙහිවූ බැතියුත්භාවය නිසා මුදල් වියදම හා කායික වෙහෙසද දරා සිත අල්ලාහ් කෙරෙහි මුලුමනින්ම යොමු කිරීම වේ. මෙම හේතුවෙන් කෙනෙකුගේ ඍජු හජ් මෙහෙයුම ජිහාද් ෆීසබීලිල්ලාහ් (අල්ලාහ්ගේ මාවතෙහි සටන කිරීම වෙනුවෙන් පරිශ්‍රමය වීම) බවට පත්වේ.

පෙර සඳහන් වූයේ ඉස්ලාම්හී සමහර මූලික යුතුකම්හී සාමාන්‍ය ප්‍රතිඵල වේ. අප සඳහන් නොකළ බොහෝ ප්‍රතිඵලද ඒවායේ වේ. ඒවා මෙම සමාජය ඉස්ලාමීය සමාජයක් ලෙස සහ සත්‍ය කෙරෙහි අල්ලාහ්ට කීකරු විය හැකි යුක්තිගරුකව ජනයන් ආශ්‍රය කළ හැකි විනීත සමාජයක් ලෙස ගොඩ නගන්නේය.

මේ හැරෙන්නට ඉස්ලාම් පවසන අනෙකුත් යුතුකම් යහපත් වන්නේ ඉස්ලාමීය නීතිමාලාවන් වන ෂරීඅත් නීතින් ඉටුකරන ඍජුභාවය මත වේ. තවද, සමාජයක් විනයගරුක උසස් සමාජයක් ලෙස හැඩගැසෙන්නට නම් එහි නීතිමාලාවන් හා කොන්දේසි ව්‍යාකූල් සහිත නොවිය යුතුය. එහි නීතිරීතින් ආරක්ෂා වන තරමට ඒ් සමාජ උසස් සමාජ ලෙස පිළිගනු ලබනු ඇත.

මතු සඳහන් අල්කුර්ආන් වැකි එය සනාථ කරයි:

﴿ولو أن اهل القرى آمنوا واتقوا لفتحنا عليهم بركات من السماء والأرض ولكن كذبوا فأخذناهم بما كانوا يكسبون ﴾

﴿ أفأمن أهل القرى أن يأتيهم بأسنا بياتا وهم نائمون﴾

﴿ أوأمن أهل القرى ان يأتيهم بأسنا ضحى وهم يلعبون﴾

﴿ أفأمنوا مكر الله فلا يأمن مكر الله إلا القوم الخاسرون﴾

*තවද, ඒ ගම වැසියන් විශ්වාස කර (අල්ලාහ්ට) බියකරු වූවානම්, ඔවුන් වෙනුවෙන් අහස් සහ පොළොවෙහි වූ සුබිතභාග්‍යයන් (හී දොරටු) විවෘත කර ඇත්තෙමු. නමුදු ඔවුන් (නබිවරු අවිශ්වාස කර) ප්‍රතික්ෂේප කළහ. එමනිසා ඔවුන් උපයාගත් (පාප කර්ම) දේ මගින් අප ඔවුන් (අඬුවම මගින්) අල්ලා ගත්තෙමු.*

*(නබිතුමනි, ප්‍රතික්ෂේප කළ) ඒ ගම වැසියන් (සිය නිවසෙහි) ඔවුන් රෑ නින්දෙහි පසුවන කළ අපගේ අඬුවම ඔවුන් කෙරෙහි පැමිණීම ගැන ඔවුන් නොබියව සිටිනවාද?*

*එසේ නොවන්නට (ප්‍රතික්ෂේප කළ) ඒ නගර වැසියන් (දුක් නොවී) දිවා කාලයේ කෙළියෙහි ප්‍රීතිමත් වෙමින් සිටින කළ අපගේ අඬුවම ඔවුන් කෙරෙහි පැමිණීම ගැන ඔවුන් නොබියව පසුවෙනවාද?*

*අල්ලාහ්ගේ කුමන්ත්‍රණ සැලැස්ම කෙරෙහි ඔවුන් බිය නොවී සිටින්ද? (සම්පූර්ණයෙන්ම) නෂ්ට විය හැකි සමාජයක් හැර (අන් කිසිවෙකු) අල්ලාහ්ගේ කුමන්ත්‍රණයන් කෙරෙහි බිය නොවී නොසිටිනු ඇත.* (7 : 96-99)

ඔවුන්, ඔවුන්ට පෙර මිහිපිට විසූ ජන සමාජයන් ගැන සළකා බැලිය යුතුය. බුද්ධිමත් අය හට ඒවාහී කදිම

නිදසුන් ඇත. අඥානය නම් තිරය කිනම් අයෙකුගේ සිතෙහි නොඇතිරී දෝ, මවුන් හට මෙය කදිම නිදසුනකි.

❀❀❀

# ඉස්ලාමිය ප්‍රතිපත්තියේ මූලික කරුණු

ඉහත සඳහන් වූයේ ඉස්ලාමීය සද්ධර්මයේ ප්‍රතිපදාවන් හා ෂරීඅත් නීතිමාලාවෙන් හෙබි ඉස්ලාමීය මූලික කරුණු වෙ. එයට අධාල සමහර නීතිමාලාවන් ගැනද ඒ නීතීන් ගැනවූ මූලික පදනම ගැනද අප කෙටියෙන් සුපැහැදිලි කෙළෙමු.

ඉස්ලාමිය ප්‍රතිපත්තියෙහි කුළුණු හයක් වෙ. ඒවා මතු සඳහන් වන ආකාරයට වෙ.

1. අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම.
2. අල්ලාහ්ගේ සුරදූතයන් කෙරෙහි විශ්වාස කිරීම.
3. අල්ලාහ්ගේ ආගමික ග්‍රන්ථ කෙරෙහි විශ්වාස කිරීම.
4. අල්ලාහ්ගේ වක්තෘවරු කෙරෙහි විශ්වාස කිරීම.
5. පරමාන්ත දිනය කෙරෙහි විශ්වාස කිරීම.
6. හොඳ සහ නොහොඳ සියල්ල අල්ලාහ්ගේ කද්ර්[2] (පූර්ව සැලැස්ම) මත සිදුවන බව විශ්වාස කිරීම.

මෙම විශ්වාස කරුණු සඳහා අල්කුර්ආනය සහ නබි තුමාගේ රුවන් වැකි සාධකව පවතී.

පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ليس البر أن تولوا وجوهكم قبل المشرق والمغرب ولكن البر من آمن بالله واليوم الآخر والملائكة والكتاب والنبيين﴾

---

[2] කද්ර් යනු සමර්ථය හා හැකියාව යන අරුත් ගෙන දේ. අල්ලාහ් කලින් නියම කළ අයුරු සහ ඉතා නිවැරදි අනතෝර්ථය ප්‍රමාණය අනුව නම සදානය, ඒවා සටහන් කිරීම, කැමැත්ත පරිදි ඒවා නිර්මාණය කිරීම (බලන්න ආචාර්ය සාලිහ් අල් සාලිහ්ගේ 'කදා වල් කද්ර්' - ඉංග්‍රීසි කෘතිය)

*ඔබගේ මුහුණු පෙරදිග සහ අවරදිග දෙසට හැරවීමම (පමණක්) යහකම් (කළ බව) නොවන්නේය. නමුදු නියම යහකම නම් (ඔබගෙන්) අල්ලාහ් ගැනද, පරමාන්ත දිනය ගැනද, සුර දූතයන් ගැනද, ආගමික පුස්ථකය ගැනද වක්තෘවරු ගැනද විශ්වාස කිරීම වේ.* (2 : 177)

පූර්ව සැලැස්ම හෙවත් දෛවය ගැන පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿إنا كل شيء خلقناه بقدر وماأمرنا إلا واحدة كلمح بالبصر﴾

*සැබැවින්ම සියලු දේ අප කලින් නියම කරන ලද (කද්ර්) අයුරු නිර්මාණය කළෙමු. අපගේ එකම වචනයකි. අපගේ අණ එය (ඉටුවීම) ඇස්පිල් ගැසීම වැනි මොහොතක් හැර අනෙකක් නොව.* (54 : 49-50)

එක්තරා අවස්ථාවක ශ්‍රේෂ්ට සුරදූතයා වන ජිබ්රීල් (අලෛ), මුහම්මද් තුමා වෙත පැමිණ ඊමාන් ගැන විමසූ කළ එතුමා මෙසේ උත්තර දුන්හ.

الإيمان أن تؤمن با لله وملائكته وكتبه ورسله واليوم الآخر وتؤمن بالقدر خيره

وشره،

ඊමාන් (විශ්වාසය) යනු අල්ලාහ්, අල්ලාහ්ගේ සුරදූතයන්, දේව හෙළිදරව් වන ආගමික ග්‍රන්ථ, වක්තෘවරු, පරමාන්ථ දිනය කෙරෙහි විශ්වාස කිරීම සහ අල්ලාහ්ගේ පූර්ව සැලැස්ම වන දෛවයේ විශ්වාසයද සම්පූර්ණයෙන්ම පිළිගැනීම වේ. (ග්‍රන්ථ : මුස්ලිම්)

# ශ්‍රේෂ්ඨවූ අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම

අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම සිව කරුණු මත රැඳේ.

1. අල්ලාහ් විද්‍යාමාන බව විශ්වාස කිරීම.

ස්වභාවය, ඥාණය, ආගමික සාධක[1] සහ හැඟීම අල්ලාහ්ගේ පැවැත්ම කෙරෙහි සාක්ෂි දරයි. අල්ලාහ්ගේ පැවැත්ම කෙසේ දැනගත හැකිද?

ස්වභාවය මගින් දැන ගැනීම:
සියලු නිර්මාණයන් තමා නිර්මාණය කළ නිර්මාතෘවරයා කෙරෙහි විශ්වාස කිරීමේ ස්වයං ඥාණය මත රැඳා පවතී. ඉගැන්වීමකින් හෝ හැඟවීමකින් හෝ මතක් කිරීමකින් හෝ තොරව මෙම හැඟීම සෑම මිනිසා කෙරෙහිම පිහිටා ඇත. යමෙකුගේ සිතෙහි නොමග යැවීමේ අදහස් ඇතුල් කරනු ලැබුවේද, ඔහු හැර අන් කිසිවෙකු මෙම මතයෙන් ඇත් නොවන බව නොරහසකි.

මුහම්මද් තුමාගේ කියමනක් මෙසේ වේ.

ما من مولود إلا يولد على الفطرة ؛ فأبواه يهودانه أو ينصرانه أو يمجسانه.

ඉපදෙන්නාවූ සියලු බිළිඳුන් දෙවියන් විශ්වාස කරනා සහජ ලක්ෂණය මත ඉපදෙන්නෝය. නමුදු ඒ බිළිඳාගේ දෙමාපියන් හේ යුදෙව්වෙකු හෝ ක්‍රිස්තියානියෙකු හෝ අග්නි පූජකයෙකු හෝ ලෙස පත් කරන්නෝය. (බුහාරි)

---

[1] සුද්ධවූ අල්කුර්ආනය සහ වක්තෘ මුහම්මද් තුමාගේ ස්ථිරවූ සුන්නා සංකල්පය මගින් වූ සාධක.

## 2. අල්ලාහ්ගේ පැවැත්ම ඥානය මගින් එත්තු ගැන්වීම:

පෙරවූ සහ වත්මන් සියලු නිර්මාණයන් හට ඒවා නිර්මාණය කළ නිර්මාතෘවරයෙකු සිටිය යුතු බව නොරහසකි. ඒ නිර්මාණයන් ස්වභාවිකව හෝ ස්වයංසිද්ධව හෝ තමා තමන් විසින්ම හෝ මවා ගැනීමට හැකියාවක් නැත. තවද ඒවා හදිසියේ නිර්මාණය වූවායැයි කීමටද නොහැක. දැනට ඇති විද්‍යාමාන වූ ඒ නිර්මාණයන් පෙර කිසිවක් හා මිශ්‍රව හෝ යමක් ලෙස හෝ තිබුණේද නැත. එසේ නම් කිසිවකින් තොරව වූවක් කෙසේ යමක් ලෙස නිර්මාණය කළ හැකිද?

නිර්මාණයක් නිතැතින් ඇතිවීමට සාධකයක් නැත්තේ නිර්මාණයවූ සියලු දේ හට එහි මුල් නිර්මාතෘවරයෙකු සිටිය යුතු නිසාය. එපමණක්ද නොව. ඒ නිර්මාණයන් විධිමත්ව ආශ්චර්යමත් ලෙස නිමවී, එකිනෙක කෙරෙහි සුහද සම්බන්ධතාවයක් මත කාර්යයන් ඉටුකරමින් විපරීත නොවී ක්‍රමිකව ක්‍රියාවීම, ඒවා සහජයෙන් නිර්මාණය නොවීය යන්න තරයේ ප්‍රත්‍යක්ෂ කරයි.

උදාහරණයක් වශයෙන් වත්මන් යුගයේ නිර්මාණය වන නිපදුමක් සදහටම ඒ ආකාරයෙන්ම නොපැවතී කාලයෙන් කාලයට එහි ස්වභාවය සහ හැඩය වෙනස් වන්නේය. නමුදු අහස, පොළොව සහ ඒවා අතරවූ නිර්මාණයන් (කුඩා මැස්සෙකු පවා) එදාමෙන් අදත් නොවෙනස්ව පවතින්නේ කෙසේද? මේවා සහජයෙන්ම නිර්මාණය නොවිය. ඒවා සැලැස්මකින් තොරව නිර්මාණය වූවක්ද නොව. එසේ නම් අනිවාර්යයෙන්ම මේවායේ නිර්මාතෘවරයෙකු සිටිය යුතුය. ඒ නිර්මාතෘවරයා මුලු විශ්වයම නිර්මාණය කළ

නිර්මාතෘවරයා සර්ව බලධාරි අල්ලාහ් වේ. ප්‍රඥාගෝචර මෙම ස්ථිර සාධකය ගැන පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿أم خلقوا من غير شيء أم هم الخالقون﴾

*නො එසේ නම් (පෙර) මවුහු නිර්මාපකයෙක් නොමැතිව (ස්වයංසිද්ධව) නිර්මාණය වූවෝද? නැතිනම් මවුන් නිර්මාපකයෝද?* (අල්කුර්ආන් 52 : 35)

එනම්, නිර්මාතෘවරයෙකු නොමැතිව මවුන් නිර්මාණය වූයේද නැත. තමන් විසින්ම තම හැඩය නිර්මාණය කර ගත්තේද නැත. එහෙයින් සර්ව බලධාරිවූ අල්ලාහ් මවුන් සියලු දෙනාගේම නිර්මාතෘවරයා බව පැහැදිලිවේ.

ජුබයිර් ඉබ්නු මුත්ඉම් තුමා මෙසේ පවසයි:

නිර්මාතෘවරයෙකු නොමැතිව මවුන් ඉබේ බිහිවූනාද? නොවන්නට නිර්මාතෘවරයා ලෙස තමන්ම වූවාද? නොවන්නට අහස් සහ පොළොව මොවුන් නිර්මාණය කළාද? සැබැවින්ම මොවුන් සත්‍ය ලෙස විශ්වාස කළේ නැත. නොඑසේනම් ඔබ දෙවියාගේ භාණ්ඩාගාර මොවුන්ගේ ග්‍රහණයෙහිද? නොවන්නට ඒවා කෙරෙහි මොවුන්ගේ පාලනයක් වේද? යන (අල්කුර්ආන් 52 : 35-38) වාක්‍යයන් මුහම්මද් තුමා පාරායනය කරනු ඇසූකල මාගේ සිත අත්තටු සළමින් කොහේදෝ පියාසර කරන්නට විය. මගේ සිතෙහි ඊමාන් (විශ්වාසය) කෙමෙන් බරවන්නට පටන් ගත්තේය. (එවිට ජුබයිර් බින් මුත්ඉම් ඉස්ලාමය නොපිළිගත් මිසදිටුවෙකු ලෙස සිටියේය)

මෙම කරුණ හා සම්බන්ධ මතු සඳහන් උදාහරණය මඳක් සිතා බලන්න.

කෙනෙකු සුවිසල් මන්දිරයක් ගැන ඔබට පවසයි. ඒ මන්දිරය වටා මනස්කාන්ත උයන් වේ. ඒවා අතරින් නිසංසලේ ගලා බසිනා රමණීය ගඟුලැල් වේ. මන්දිරය තුල අතුරන ලද පලස් සුඛෝපභෝගි ඇඳන් සහ ඒවා මත මනරම් ඇතිරිලිද වේ. ඒවා රමණීය ලෙස විවිධ සැරසිලිවලින් සමන්විතය. මෙම මන්දිරය සහ එහි සියල්ල ක්‍රමවත්ව කිසිවෙකු විසින් නිම නොකර ඉබේ එතැනට පත්වූවා යැයි කියා ඔහු කීවා නම් ඔබ ඔහුගේ කියමන පිළිගන්නවාද? නිසැයෙන්ම ඔහු පිස්සෙක් මොලේ අවුල්වූ කෙනෙක් යැයි ඔබ පවසනු ඇත. කාරණාව එසේ නම් තිරසාර විශ්මිත නිමවුම් වන අහස පොළොව සහ තාරකාවන් සහ ඒවායේ විධිමත් සංග්‍රමණය ඉබේ ඇති වී යැයි කීමට හැකිද?

3. අල්ලාහ්ගේ පැවැත්ම ගැන (ෂරීආ) ධර්මාශ්‍රයෙන් සාධක :

දෙවිඳු විසින් පහළ කළාවූ සියලු ආගමික ග්‍රන්ථ දෙවියෙකු ඇති බවට සාක්කි දරයි. මානව යහපත සඳහා වූ නීතිරීතින් ඒ ආගම් මගින් ප්‍රධානය කර තිබීම සර්වඥ හා සර්වබල දෙවියෙකුගෙන් ඒ ආගම් පහළ වූ බවට සාධක වේ. තවද ඒ ආගම් විශ්වය සහ එහි පැවැත්ම ගැන සඳහන් කරන සමහර කරුණු සත්‍ය බව යථාර්ථය සහ වත්මන් සොයාගැනීම් සාක්කි දැරීමද ඒ දේ ග්‍රන්ථ සර්වබලවූ අල්ලාහ් විසින් පහළ කළ ඒවා බවටද, අල්ලාහ් ප්‍රකාශ කළ ඒවා ඒ ආකාරයෙන්ම ක්‍රියාවෙහි යෙදීමට සමර්ථයෙකු බවද මෙයින් ප්‍රත්‍යක්ෂ වේ.

4. අල්ලාහ් ඇති බවට හැඟීම් මගින් දැනගත හැකි සාධක දෙයාකාර වේ.

අ) බැරෑරුම් අවස්ථාවන්හිදී ප්‍රාර්ථනා කරන්නාගේ ප්‍රාර්ථනාව පිළිගැනීමෙන්ද කරදරවලට පත්වන්නා එයින් ගැලවීම ගැනද අප නිරතුරුව අසා ඇත්තෙමු. අප්‍රමාණව දැක ඇත්තෙමු. අල්ලාහ් විද්‍යාමාන බවට මේවා ස්ථිර සාධක වලින් සමහරක් වෙ.

සාධකයක් ලෙස අල්කුර්ආනය මෙසේ පවසයි :

﴿وَنُوحًا إِذْ نَادَى مِن قَبْلُ فَاسْتَجَبْنَا لَهُ﴾

*(මෙම දයාව) නූහ් හටද කළෙමු. පෙර ඔහු අප කෙරෙහි ප්‍රාර්ථනා කළ අයුරු ගැන මදක් සිතන්න. අප ඔහුගේ ප්‍රාර්ථනාව අනුමත කළෙමු.* (අල්කුර්ආන් 21 : 76)

තවත් සාධකයක් අල්කුර්ආනයේ මෙසේ විස්තර වෙයි :

﴿إِذْ تَسْتَغِيثُونَ رَبَّكُمْ فَاسْتَجَابَ لَكُمْ﴾

*ඔබ, ඔබගේ දෙවියාගෙන් උදව් පැතූ කළ ඔහු ඔබ හට පිළිවදන් දුන්නේය.* (අල්කුර්ආන් 8 : 9)

අනස් බින් මාලික් තුමා මෙසේ පවසයි :

ජුම්ආ දිනයක මුහම්මද් තුමා කුත්බා දේශනය පවත්වමින් සිටින කළ ගැමි අරාබියෙකු පැමිණ මෙසේ පැමිණිලි කළේය. 'අල්ලාහ්ගේ වක්තෘ තුමනි, තද නියඟය නිසා සේසත් සියල්ල විනාශ වී ගොස්ය. පවුලේ සියලු දෙනා සාගින්නෙන් පෙළෙති. අප වෙනුවෙන් ප්‍රාර්ථනා කරනු මැනවි'. මුහම්මද් තුමා දෑත් ඔසවා ප්‍රාර්ථනා කළහ. අහසේ වහා වලාකුළු කඳුමෙන් පෙල ගැසිණ. මුහම්මද් තුමා දේශන වේදිකාවෙන් බසින්නට පෙර වැසි ජලය එතුමාගේ රැවුල අතරින් බේරෙන්නට විය.

ඊළඟ ජුම්ආ දිනයේ ඒ ගැමි අරාබියා නොඑසේනම් වෙනත් කෙනෙකු පැමිණ 'අල්ලාහ්ගේ වක්තෘ තුමනි, තද වැස්ස නිසා ගොඩනැගිලි සියල්ල කඩා වැටී සේසත් සියල්ල ජලයෙන් යටවී විනාශ වී ඇත. අප වෙනුවෙන් අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා කරනු මැනව' යනුවෙන් පැවසූ කළ නබි තුමා වහා දෑත් ඔසවා ප්‍රාර්ථනා කළහ. 'යා අල්ලාහ් අප කෙරෙහි නොව. අප අවට වසින්නට සළස්වනු මැන' යනුවෙන් ප්‍රාර්ථනා කර, නබි තුමා ඇඟිල්ල දික්කර පෙන්වූ (අහස්) කොණ්වල වළාකුළු වහා ඉවත්වී ගියේය.

(ග්‍රන්ථය : බුහාරි)

බැතිසිතෙන් ප්‍රාර්ථනා කරන්නාගේ ප්‍රාර්ථනාව පිළිගන්නා බව අදද නොරහසකි. ඉතා බැගෑපත්ව පසුතැවිලිවී යදින්නාගේ ප්‍රාර්ථනාව අල්ලාහ් පිළිගෙන ඉටු කරන්නේය.

ආ) අල්ලාහ් විසින් වක්තෘවරු වෙත ලබාදුන් විශේෂ හාස්කම් 'මුඃජිසා' යනුවෙන් පැවසේ. මිනිස්සු ඔවුන් කළ හාස්කම් සියැසෙන් දුටුහ. ඇසූහ. මෙවන් සාධක සර්වබල දෙවියෙකු ඇති බවට කදිම නිදසුන්ය. අනෙක, එවන් විශේෂ හාස්කම් මිනිස් ශක්තිය ඉක්මවූ ක්‍රියාවන්ද වෙ. අල්ලාහ් තම වක්තෘවරුන්ට උදව් කර ඔවුන්ගේ ක්‍රියාවෙහි තිරසාරයක් ඇති කිරීමට මෙවන් විශේෂ හැකියාවන් ඔවුන් මගින් පවත්වයි.

මූසා නබි තුමා හට දෙවියන් විසින් ලබාදුන් හාස්කම් ඉතා වැදගත් ඒවා වෙ. තම සැරයටිය ගෙන මුහුදෙහි ගසන ලෙස අල්ලාහ් එතුමාට අණ කළේය. මූසා තුමා එසේ කළහ. එය වියළුණු මාවත් දොළහක් බවට පත්වී ඒවා අතර ජලය කඳුමෙන් වූයේ විශ්මිත අන්දමිණ.

ඒ කරුණු අල්ලා ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:
﴿فأوحينا إلى موسى أن اضرب بعصاك البحر فانفلق فكان كل فرق كالطود العظيم﴾

*(එම අවස්ථාවෙහි) 'ඔබ, ඔබගේ සැරයටිය මුහුදෙහි ගසව' යනුවෙන් මූසා හට වහි (මගින් දැනුම) දුන්නෙමු. (මුහු ගැසීමෙන්) එය පැළිණ. එක් එක් පැළීම මහා කඳු බවට පත්විය.* (අල්කුර්ආන් 26 : 63)

අනෙක් උදාහරණය මර්යම් තුමියගේ පුත්‍ර ඊසා නබි තුමාගේ වෙ.

අල්ලාහ්ගේ කැමැත්ත අනුව මැරුණු අය නැවත ජීවත් කිරීමට හැකියාවත්ද, මිනිවලේ අය ආපසු පන පොවා පිට කරවීමට හැකියාවක්ද එතුමාට ලැබිණ. ඒ සිදුවීම ගැන ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ وأحي الموتى بإذن الله﴾

*තවද, මම අල්ලාහ්ගේ අනුමැතිය මත මල අයද නැවත පන පොවමි.* (අල්කුර්ආන් 3 : 49)

﴿ وإذ تخرج الموتى بإذني﴾

*ඔබ, මාගේ අණ පරිදි මල අය (ආපසු පන පොවා මිනිවලෙන්) නැගිටෙවූ වණමද....* (අල්කුර්ආන් 5 : 110)

තුන්වන උදාහරණය අල්ලාහ් මුහම්මද් තුමා හට ලබා දුන් හාස්කම වෙ. මුහම්මද් තුමාගේ සමයේ ජීවත්වූ කුරෙෂ් ගෝත්‍රිකයන් හාස්කම කර පෙන්වන ලෙස එතුමා ගෙන් ඉල්ලා ඇවිටිලි කළ අවස්ථාවක එතුමා අහසේ බැබැලුණු සඳ වෙත අත දික් කර පෙන්වූහ. සඳ දෙබැවනු ඔවුහු ආශ්චර්යමත් ලෙස සියසෙන් දුටුහ.

﴿إقتربت الساعة وانشق القمر؛ وإن يروا آية يعرضوا ويقولوا سحر مستمر﴾

*(පරමාන්ත) පැය ළඟාවී ඇත. (ඒ ගැන දැනුම් දීමට) සඳ දෙබෑ විය. ඔවුන් කුමණ භාස්කමක් දුටුවද (එය) නොසළකා 'මෙය (සැමදා) සිදුවන ඉන්ද්‍රජාලයකි' යනුවෙන් පවසති.* (අල්කුර්ආන් 54 : 1-2)

අල්ලාහ් තම වක්තෘවරුන් ස්ථිර කරවීමට සහ උදව් කිරීම පිණිස ප්‍රසිද්ධියේ පෙන්වන මෙවන් භාස්කම් අල්ලාහ්ගේ පැවැත්මට ප්‍රධාන සාධකයන්ය.

## 2. <u>අල්ලාහ්ගේ දිව්‍යමය භාවය කෙරෙහි විශ්වාසය:</u>

(අල්ලාහ්ගේ නිර්මාතෘභාවය කෙරෙහි සහ සර්ව බලය කෙරෙහි) නිර්මාතෘවරයා අල්ලාහ් හැර අන් කෙනෙකු නැත, සර්ව බලය කෙරෙහි ඔහු හට ආදේශකයෙකු හෝ උදව්කරුවෙකු හෝ උවමනා නැත යනුවෙන් විශ්වාස කිරීම.

<u>**රබ්**</u> (සර්ව බලධාරි දෙවියා): නිර්මාණය කිරීමේ බලය, පාලයන කිරීමේ බලය සහ නීති සම්පාදනය කිරීමේ නති බලය ඇත්තේ සර්ව බල අල්ලාහ්ට පමණි. තවද, ඔහු හැර අන් නිර්මාපකයෙකු නැත. ඔහු හැර අන් සර්ව පාලක යෙකු නැත. ආඥා හා නීති පැනවීමට ඔහු හැර වෙනත් සුදුස්සෙකු නැත. තවද අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ذلكم الله ربكم له الملك والذين تدعون من دونه ما يملكون من قطمير﴾

*(මෙවන් බලයක් ඇති) මහු, ඔබගේ දෙවියා අල්ලාහ් වේ. සියලු රාජධානි මහුට අයත්වේ. තවද, මහු හැර ඔබ අමතන අය (රට ඉඳි) ඇටයක් මතවූ සිවියක් තරම්වූ බලයක් පවා නැති අය වෙත්.* (අල්කුර්ආන් 35 : 13)

අල්ලාහ්ගේ නිර්මාතෘභාවය සහ පරිපාලනාධිකරණය, වක්තෘ මූසා තුමාගේ සමයේ මිසරයේ රජ කළ කෲර පාලකයෙකු වන ෆිර්අවුන් වැනි උඩගු අය හැර අන් කිසිවෙකු ප්‍රතික්ෂේප කර නැත. ෆිර්අවුන් තම සමාජයේ වැසියන් අමතා උඩගු ලෙස මෙසේ පැවසූ බව ශුද්ධවූ අල්කුර්ආනය සඳහන් කරයි.

﴿أنا ربكم الأعلى﴾

*ඔබගේ ශ්‍රේෂ්ඨ දෙවියා මම වෙමි.* (අල්කුර්ආන් 46 : 24)

තවත් අල්කුර්ආන් වැකියක් මෙසේ විය:

﴿وقال فرعون يا أيها الملأ ما علمت لكم من إله غيرى﴾

*එයට ෆිර්අවුන් 'ප්‍රධානිවරුනි, ඔබ වැඳීමට සුදුසු මා හැර අන් කෙනෙකු මම නොදනිමි' යි කීවේය.*

(අල්කුර්ආන් 28 :38)

මහු එසේ පැවසූවේ කිසිදු ප්‍රතිපත්තියක් මත නොවේ.

අල්කුර්ආන් මෙසේද පවසයි:

﴿ وجحدوا بها واستيقنتها أنفسهم ظلما وعلوا﴾

*මවුන්ගේ සිත් ඒවා (සත්‍යයැයි) පිළිගනිමින් සිටි අතර උඩගු ලෙස සත්‍ය ප්‍රතික්ෂේප කළහ.* (27 : 14)

*මූසා නබි තුමා ෆිර්අවුන් අමතා මෙසේ පැවසූ බව අල්කුර්ආනය මෙසේ සඳහන් කරයි:*

﴿قال لقد علمت ما أنزل هؤلاء إلا رب السموات والأرض بصائر وإني لأظنك يا فرعون مثبورا﴾

*(එයට) මූසා, 'අහස් සහ පොළොවෙහි දෙවියා (අල්ලාහ්) හැර (අන් කෙනෙකු) මේවා ඔබ හට සාධක ලෙස පහළ නොකළ බව ඔබ පැහැදිලිව දන්නෙහිමය. එම්බා ෆිර් අවුන්, සැබැවින්ම මට හැඟෙන්නේ ඔබ විනාශ විය හැකි කෙනෙකු ලෙසටය' යැයි පැවසුහ.* (අල්කුර්ආන් 17 : 102)

ආදේශ කරන්නන් මෙලෙස අල්ලාහ්ගේ දිව්‍යමයභාවය පිළිගත්තද, වැඳුම්පිදුම් කෙරෙහි මිථ්‍යා දෙවිවරුන් හවුල් කර ගත්හ.

ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿قل لمن الأرض ومن فيها إن كنتم تعلمون . سيقولون لله أفلا تذكرون . قل من رب السموات السبع ورب العرش العظيم . سيقولون لله قل أفلا تتقون . قل من بيده ملكوت كل شيء وهو يجير ولا يجار عليه إن كنتم تعلمون . سيقولون لله قل فأنى تسحرون﴾

*(නබිතුමනි) 'ඔබ දන්නෙහි නම් පොළොව සහ එහි ඇති දේ අයත් වන්නේ කා හටද?' යි මට පවසනු.*

*එයට ඔවුහු 'අල්ලාහ්ටය' යනුවෙන් පවසනු ඇත. (එසේ නම් වැඳීමට එකම සුදුස්සා අල්ලාහ් බව) 'ඔබලා මෙනෙහි කරන්නේ නැත්ද?'යි විමසනු මැනව.*

*(හැර) 'සප්ත අහස සහ උධාරතර සිංහාසනයේ දෙවියා කවරෙක්දැ' යි අසන්න. (එයට) ඔවුහු 'ඒවා සියල්ල අයත්වන්නේ අල්ලාහ්ටමවේ'යනුවෙන් පවසනු ඇත. (එසේනම්) 'ඔබ (ඔහුගේ අඩුවමට) බිය නොවන්නෙහිද?' යනුවෙන් පවසන්න.*

සියල්ලෙහි ස්වාධිපත්‍ය කා අතෙහි වේද, මහු සියල්ලන්ගේ ආරක්ෂකයාය. මහුට එරෙහිව කිසිවෙකු ආරක්ෂා ලබන්න නොහැකි නොවේද? ඔබ දන්නෙහි නම් මහු කවරෙක්දැ' යි (පවසන්න) යනුවෙන් අසනු මැනව.

එයට මවුහු 'සියල්ල අයත්වන්නේ අල්ලාහ්ටය' යනුවෙන් පවසනු ඇත. 'එසේ නම් ඔබ කෙසේ මුළාකර හරවනු ලද්දේද?' යනුවෙන් අසනු මැනව.
(අල්කුර්ආන් 23 : 84-89)

තවද ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ ولئن سألتهم من خلق السموات والأرض ليقولن خلقهن العزيز العليم ﴾
'(නබි තුමනි,) අහස්ද පොළොවද නිර්මාණය කළේ කවරෙක් දැ?' යි ඔබ මවුන්ගෙන් ඇසුවා නම් 'සැබැවින්ම සර්වඥාන සර්ව බලධාරී (වූ අල්ලාහ්) ඒවා නිර්මාණය කළේය' යනුවෙන් පවසනු ඇත. (අල්කුර්ආන් 43 : 9)

තවත් අල්කුර්ආනි වැකියක් මෙසේ වේ:

﴿ولئن سألتهم من خلقهم ليقولن الله فأنى يؤفكون ﴾

තවද, මවුන් නිර්මාණය කළේ කවරෙක්දැ?යි ඔබ මවුන් ගෙන් විමසුවා නම් අල්ලාහ් බව පවසනු ඇත. එසේ නම් මහු හැර මවුන් කෙසේ හරවනු ලද්දේද? (43 : 87)

අල්ලාහ්ගේ ආඥාවන් යනු නිර්මාණදායි ස්ථායි ආඥා සහ ෂරීආ (විධාන හා පරමාදිපත්‍ය නීතිරීති) වේ. අල්ලාහ් මෙම විශ්වය පාලනය කරනා සේ, තම සර්ව ඥානානුකූලව තමා අදිටන් කරනා දේ ක්‍රියාවෙහි යොදන්නා සේ, වැඳුම්පිදුම් (ඉබාදත්)ද අනිවාර්යය කර

අණ කරන්නා ලෙසද සම්පූර්ණ කටයුත්තන්හි නීති සම්පාදකයා ලෙසද පසුවෙයි.

එහෙයින් කෙනෙකු, වැඳුම්පිදුම්හි ආගමික නීතින් සම්පාදනය කරන්නා ලෙසද, සම්පූර්ණ කටයුත්තන්හි නීති සම්පාදනය කරන්නා ලෙසද, අල්ලාහ් හැර අන් කෙනෙකු පිළිගන්නේ නම් හෙතෙම අල්ලාහ්ට ආදේශ (ෂිර්ක්) කළ කෙනෙකු මෙන්ම විධියානුකූලව ඊමාන් (විශ්වාසය) සම්පූර්ණ කළ කෙනෙකුද නොවන්නේය.

3. <u>වැඳීමට එකම සුදුස්සා අල්ලාහ් පමණක් බව පිළිගැනීම</u>

(එනම් වැඳුම්පිදුම් කිරීමට එකම සුදුස්සා අල්ලාහ් පමණක් වේ, මහුට සමානව කිසිවෙකු හෝ කිසිවක් නැති බව පිළිගැනීම)

<u>අල්-ඉලාහ්:</u> හෘදයාංගව ගෞරවණීය ලෙස වැඳුම් පිදුම් කිරීමට එකම සුදුසු දෙවියා යන අදහස වේ.

ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿وإلهكم إله واحد لآ إله إلاهو الرحمن الرحيم﴾

*(මනුෂ්‍යයනි,) තවද ඔබගේ (වැඳීමට සුදුසු) දෙවියා, කෙනෙකු පමණකි. මහා කාරුණික අති දයාන්විත මහු හැර වැඳීමට සුදුසු අන් දෙවියෙකු නැත.* (2 : 163)

තවත් ශුද්ධවූ අල්කුර්ආන් වැකියක් මෙසේ සඳහන් වේ:

﴿شهد الله أنه لا إله إلا هو والملائكة وأولو العلم قائما بالقسط لاإله إلا هو العزيز الحكيم﴾

*(නබි තුමනි!) 'සැබැවින්ම මහු හැර වැඳීමට සුදුසු (අන්) දෙවි කෙනෙකු නැතැයි අල්ලාහ්ද (එසේම) මලාඉකාවරු*

*සහ (ඉස්ලාමීය) ඥානවරුද යුක්තියෙහි නිරතවෙමින් සාක්ෂි දරති. ඔහු (අල්ලාහ්) හැර වැඳීමට සුදුසු අන් දෙවියෙකු නැත. ඔහු (සර්ව) බලසම්පන්න සර්ව ඥානයා වේ.*

(අල්කුර්ආන් 3 : 18)

අල්ලාහ්ට සමානව ඇති කරගන්නාවූ සහ අල්ලාහ් හැර වඳිනා සියල්ල ප්‍රතික්ෂේප කළ යුතු ඒවා වේ.

ශුද්ධවූ අල්කුර්ආනය වදනක් මෙසේ පවසයි:

﴿ذلك بأن الله هو الحق وأن ما يدعون من دونه هو الباطل وأن الله هو العلي الكبير﴾

*(එය) මක්නිසාද යත්, සැබැවින්ම අල්ලාහ් ඔහු සත්‍ය වේ. තවද, සැබැවින්ම ඔහු හැර (අන්) කුමක් ඔවුහු අමතුවද, ඒවා අසත්‍ය ඒවා වේ. තවද සැබැවින්ම අල්ලාහ්, ඔහු අති ශ්‍රේෂ්ඨ අති උසස් වේ.* (අල්කුර්ආන් 22 : 62)

තමා ස්වයංව වඳිනා සියල්ල හට දෙවියන් යනුවෙන් ආමන්ත්‍රණය කර ඇමතීමෙන් ඒවා කිසිවිටෙක සත්‍ය දෙවියන් නොවන්නේය. එදා අරාබිකරයේ මිසදිටුවන් වන්දනාමාන කළ ප්‍රසිද්ධ ලාත්, මනාත් සහ උස්සා වැනි පිළිමයන් ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿إن هي إلا أسماء سميتموها أنتم وآباؤكم ما أنزل الله بها من سلطان﴾

*මේවා සියල්ල ඔබ සහ ඔබගේ පෙර පියවරුන්ද තබා ගත් (ව්‍යාජ) නම් මිස (අනෙකක්) නොව. ඒවා (දෙවියන්*

*බව)ට අල්ලාහ් කිසිදු සාධකයක් (පෙරවූ ආගම්හී) පහළ කර නැත.* [4](අල්කුර්ආන් 53 : 23)

යූසුෆ් නබි තුමා සිර අඩස්සියෙහි තම සගයින් හා කළ කතාව අල්ලාහ් මෙසේ අල්කුර්ආනයේ පවසයි:

﴿ياصاحبي السجن أأرباب متفرقون خير أم الله الواحد القهار ما تعبدون من دونه إلا أسماء سميتموها أنتم وآباؤكم ما أنزل الله بها من سلطان إن الحكم إلا لله أمر ألا تعبدوا إلا إياه ذلك الدين القيم ولكن أكثر الناس لا يعلمون ﴾

*දෙගෙහි මාගේ සගයිනි, (කිසිදු බලයක් නැති) නානා දෙවියන් උසස්ද? නොඑසේනම් (සියල්ල) පාලන (බල)යට යටත් කළ එකම අල්ලාහ්ද? ඔහු හැර ඔබ වඳිනා සියල්ල ව්‍යාජ නම් හැර අනෙකක් නොවේ. ඔබ සහ ඔබගේ පෙර පියවරුන් ඒවා නම් කර ගත්හ. (නමුදු) ඒවා හට කිසිදු සාධකයක්ද පහළ කෙළේ නැත. අල්ලාහ් හැර (අන් කිසි වෙකුට කිසිදු) බලයක් නොවන්නේය. ඔහු හැර අන් කිසි වෙකු නොවඳිනා ලෙස ඔහු ඔබ හට අණ කර ඇත. මෙය (ස්ථිර) ඍජු ආගම වේ. නමුදු මිනිසුන්ගෙන් බොහෝ දෙනෙකු (මෙය) නොදනිති. (යනුවෙන් යූසුෆ් නබි තුමා පැවසූහ)* (අල්කුර්ආන් 12 : 39-40)

---

[4] *හූද් නබිතුමා තම ජනයන්ට පැවසූ බව අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසයි: (ඔබ දෙවියන් ලෙස නැමදූ) ඔබ සහ ඔබ පෙර පියවරුන් තබා ඇති) සමහර නම් මගින් ඔබ මා වෙත තර්ක කරන්නෙහිද? ඒ (නම්) වෙනුවෙන් අල්ලාහ් කිසිදු සාධකයක් පහළ නොකෙළේය. (7: 71)*

මේ හේතුවෙන් මෙලොව පැමිණි සියලු වක්තෘවරු තම සමාජයන් හට 'අල්ලාහ්ට පමණක් කීකරු වන්න. මහු හැර ඔබ හට වැඳීමට සුදුසු අන් දෙවියෙකු නැත' යනුවෙන් දේශනා කළ බව පැහැදිලිය.

නමුදු ආදේශ කරන්නන් ඒවා ප්‍රතික්ෂේප කළහ. අල්ලාහ් හැර තම සිත්සේ ව්‍යාජ දෙවියන් ඇති කරගනිමින් සිත්සේ ඒවා වන්දනා කළහ. ඒවා පූජා කළහ. එමගින් උදව් උප කාර පැතූහ. ආදේශ කරන්නන්ගේ මෙම මතය සත්‍යයට පටහැනි බව මතු සඳහන් කරුණු දෙක මගින් සනාථ වේ.

1. මොවුන් ආරූඪ කරගත් මෙම මිථ්‍යා දෙවිවරුන් හට කිසිදු දිව්‍යමය භාවයක් නැත. ඒවාද අල්ලාහ්ගේ මැවීම මිස මැවීමේ ශක්තියක් ඒවාට නැත. තමන් වඳින්නන්ට කිසිදු සෙතක් හෝ නපුරක් හෝ කිරීමට නොහැකිය. මරණයක් හෝ ජීවයක් හෝ ඇති කිරීමට නොහැකිය. අහස සහ පොළොවෙහි ඇති දේවල්හී හවුල් කරුවන්ද නොවේ. ඒවායේ කොටස්කරුවන් ද නොවේ.

මෙම කරුණ අළලා අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿واتخذوا من دونه آلهة لا يخلقون شيئاوهم يخلقون ولايملكون لأنفسهم ضرا ولا نفعا ولايملكون موتا ولا حيوة ولا نشورا﴾

*මවුහු (මිසදිටුවන්) මහු (අල්ලාහ්)හැර අරගත් අන් (ව්‍යාජ) දෙවියන්, කිසිවක් නිර්මාණය කිරීමට ශක්තියක් නැත. ඒවාද (අල්ලාහ්ගේ) මැවීම වේ. තමන් හට (පවා) කිසිදු සැපතක් හෝ විපතක් කරගැනීමට බලයක් නැත. තවද, මරණයක් හෝ ජීවයක් හෝ දීමටද පුනරුත්ථානයක් දීමට හෝ බලයක් නැත.* (අල්කුර්ආන් 25 : 3)

තවද අල්කුර්ආනය මෙසේ සඳහන් කරයි:

﴿قل ادعو الذين زعمتم من دون الله لا يملكون مثقال ذرة فى السموات ولا فى الأرض وما لهم فيهما من شرك وماله منهم من ظهير؛ ولا ينفع الشفاعة عنده إلا لمن أذن له﴾

*(නබිතුමනි) පවසන්න, අල්ලාහ් හැර ඔබ ඇතිකරගෙන ඇති දෙවියන් අමතන්න. අහස්හී සහ පොළොවෙහි අණු ප්‍රමාණ බරකටවත් ඔවුන්ට හිම නැත. ඒවායේ කොටස් කරුවන්ද නොවේ. ඔවුන්ගෙන් කිසිවෙකු අල්ලාහ්ට උදව් කරනා අයද නොවේ. තවද, අල්ලාහ් කෙරෙහි අභියාචනා කිරීමට ඔහු අවස්ථා ලබා දුන් අය නොවන්නට අන් කිසිවෙකුට ඔහු කෙරෙහි මැදිහත්වී ආයාචනා කිරීම ප්‍රයෝජන නොවන්නේය.* (අල්කුර්ආන් 34 : 22)

﴿أيشركون ما لا يخلق شيئا وهم يخلقون . ولا يستطيعون لهم نصرا ولا أنفسهم ينصرون﴾

*මොවුන්, කිසිවක් මැවීමට නොහැකි දේ අල්ලාහ්ට ආදේශ කරති. ඒවාද (අල්ලාහ්) මැවූ ඒවා වේ. ඒවාට කිසිදු උදව්වක් කළ නොහැකිය. තමන්ටද කිසිදු උදව් උපකාරයක් කර ගැනීමටද නොහැකිය.* (7 : 191-192)

ආදේශ කරන්නන් අදහන දෙවිවරුන්ගේ තත්වය මෙසේ නම්, ඒවා දෙවිවරු ලෙස ඇදහීම අනුවණකාර සහ අසත්‍ය මත වේ.

2. මෙම ආදේශ කරන්නන් පවා, නිර්මාතෘවරයා සර්ව බලධාරී අල්ලාහ් බවත්, සියලු දෑහී පරිපාලනය අල්ලාහ් යටතෙහි ඇති බවත්, ඔහුට විරුද්ධව ආරක්ෂා සැපයීමට කිසිවෙකු හට බලයක් නැති බවත් පිළිගතිති. මැවුම්කරු

වා සහ පරිපාලකයා අල්ලාහ් බව මවුන් පිළිගන්නා සේ වැඳීමට, උදව් උපකාර පැතීමට සහ භාරභාර මප්පු කිරීමට සුදුස්සා අල්ලාහ් බව පිළිගැනීමට මැලිවෙති.

﴿يأيها الناس اعبدوا ربكم الذي خلقكم والذين من قبلكم لعلكم تتقون . الذي جعل لكم الأرض فراشا والسماء بناء وأنزل من السمآء ماء فأخرج به من الثمرات رزقا لكم فلا تجعلوا لله أندادا وأنتم تعلمون﴾

*මිනිසුනේ, ඔබ ශ්‍රැධාවතු වස් ඔබ සහ ඔබට පෙරවූ අය නිර්මාණය කළාවූ ඒ දෙවියා (පමණක්) වදින්න. ඔහු ඔබ වෙනුවෙන් මහපොලොව ඇතිරිල්ලක් ලෙසද, අහස (උඩු) වියනක් ලෙසද නිමවා, අහසෙන් (වර්ෂා) ජලය පහළ කර, එමගින් ඔබ ආහාරය පිණිස එළදාවන්ද පිට කරයි. එම නිසා (මේවා) ඔබ දැනගෙන අල්ලාහ්ට ආදේශ නොකරන්න.*
(2 : 21-22)

තවද ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ولئن سألتهم من خلقهم ليقولن الله فأنى يؤفكون﴾

*මොවුන් නිර්මාණය කළේ කවුරුන්දැයි ඔබ මවුන්ගෙන් විමසූ කළ, අල්ලාහ් යයි පවසනු ඇත. එසේනම් මවුන් කෙසේ නොමග හැරෙන්නේද?* (අල්කුර්ආන් 43 : 87)

තවත් ශුද්ධවූ අල්කුර්ආන් වාක්‍යයක් මෙසේ පවසයි:

*(නබිතුමනි) 'අහස සහ පොලොවෙන් ඔබ හට පෝෂණය කරන්නේ කවරෙක්ද? නැත්නම් දෘෂ්ටිය සහ ශ්‍රවණය හිමි වන්නේ කවරෙකුටද? තවද මළවුන්ගෙන් ජීවයද, ජීවයෙන් මරණයද ගෙනෙන්නේ කවරෙක්ද?'(ලෝවැසියන්ගේ) සියලු කාර්යයන් සම්පාදනය කරන්නේ කවරෙක්ද? යනුවෙන් ඔබ මවුන්ගෙන් අසනු මැනව'. එයට මවුහු 'අල්ලාහ්'*

යැයි පවසනු ඇත. 'එසේ නම් ඔබ (අල්ලාහ්ට) බිය නොවන්නේ මක් නිසාද?' යනුවෙන් පවසනු මැනව.

(මෙවන් සුදුස්සෙක්වූ) 'ඔහු ඔබගේ නියම දෙවියා අල්ලාහ් මවි. මෙම සත්‍යයෙන් පසු නොමග හැරෙන්නට (ඉතිරිව) ඇත්තේ කුමක්ද? (මෙම සත්‍යයෙන්) ඔබ නොමග හර වන්නේ කුමණ දිසාවකටද?' (යනුවෙන් අසනු මැනව)

(අල්කුර්ආන් 10 : 31-32)

## 4. අල්ලාහ්ගේ ප්‍රනාමයන් සහ ගුණාංගයන් කෙරෙහි විශ්වාස:

අල්ලාහ් තම ග්‍රන්ථය වන පරිශුද්ධවූ අල්කුර්ආනයේ සහ මුහම්මද් තුමා අල්ලාහ්ගේ කිනම් නාමයන් සහ ගුණාංග ගැන පැහැදිලි කර දී තිබේදෝ, ඒවායේ කිසිදු වෙනසක් නොකර හෝ එයින් යමක් ප්‍රතික්ෂේප නොකර හෝ සිත් සේ උපමා හෝ විස්තර හෝ නොකර ඒලෙසම අල්ලාහ්ගේ තේජසෙහි බල මහිමය අනුව ඒවා පිළිගත යුතුය.

﴿ولله أسماء الحسنى فادعوه بها وذروا الذين يلحدون فى أسمائه سيجزون ما كانوا يعملون﴾

තවද, අල්ලාහ්ට ලක්ෂණ නම් වේ. එමනිසා ඒවා මගින් ඔබ ඔහු අමතන්න. ඔහුගේ නාම (ව්‍යාජ අදහස් කර) වැරද හා විකෘති ලෙස ප්‍රචාරය කරන්නන්ගෙන් ඉවත්වනු. ඔවුන් කරනා ක්‍රියාවන් හට ප්‍රතිවිපාක ලැබෙනු ඇත.

(7 : 180)

තවත් ශුද්ධවූ අල්කුර්ආන් වැකියක් මෙසේය:

﴿وله المثل الأعلى فى السموات والأرض وهو العزيز الحكيم﴾

*අහස්හි සහ පොළොවෙහි ඉතා උසස් වර්ණනාවන් ඔහු (අල්ලාහ්) සතුය. තවද ඔහු අති උධාර සර්වඥායා වේ.*
(30 :27)

අල්කුර්ආනයේ තවත් වාක්‍යයක් මෙසේ පවසයි:

﴿ليس كمثله شيء وهو السميع البصير﴾

*(අල්ලාහ්) ඔහුට සමාන කිසිවක් නැත. ඔහු සියල්ල සවන් දෙන්නා, බලන්නා වේ.* (42 : 11)

අල්ලාහ්ගේ ප්‍රනාමයන් හා ගුණාංගයන් කෙරෙහි දෙකොටසක් නොමග ගොස් ඇත.

1. හිස් (ශුන්‍ය) කරන්නන් : මොවුහු අල්ලාහ්ගේ නාමයන් සහ ගුණාංගයන් හෝ එයින් සමහරක් හෝ ප්‍රතික්ෂේප කරති. (අල්ලාහ්ට කිසිදු ගුණාංගයක් හෝ ස්වභාවයක් හෝ නැතැයි ප්‍රතික්ෂේප කිරීම)

ඒ නාමයන් හා ගුණාංගයන් අල්ලාහ්ට පැවරීමෙන්,විද්‍යා මාන අල්ලාහ් යමක් හා උපමා කිරීමට සිදුවෙනු ඇතැයි (මවුහු) කියති. එනම් අල්ලාහ්ගේ ගුණාංගයන් මනුගේ මැවීම් හා සැසඳීමට සිදුවෙනු ඇතැයි පවසති. කරුණු දෙකක් මත මෙය වැරැදි නිගමණයක් බව පැහැදිළි වේ.

මුල් කරුණ: මෙම හේතුව නිසා අල්ලාහ්ගේ ආගමෙහි පරස්පර විරෝධතාවයන් ඇත යනුවෙන්වූ ප්‍රශ්නයක් මතු විය හැකිය. අල්ලාහ් හට නාමයන් හා ගුණාංගයන් ඇති නමුදු, ඒවා කිසිවක් හා සමාන නැත යනුවෙන් සුද්ධ වූ අල්කුර්ආනය පවසයි. අල්ලාහ් හට නාමයන් සහ ගුණාංගයන් ඇත යනුවෙන් පැවසීම, අනෙක් මැවීම් හා

උපමා කිරීම නම්, අල්ලාහ්ගේ වචන අසත්‍ය වී අල්කුර්ආනයේ සමහර වාක්‍යයන්ද අසත්‍යය වීම වේ.

දෙවැනි කරුණ: ද්‍රව්‍යයන් දෙකක් ප්‍රමාණයෙන් සහ ගුණයෙන් සමානවීමෙන් පමණක් ඒ දෙක සියයට සියයක්ම සමානව තිබිය යුතු නැත. මිනිසුන් දෙදෙනෙකු ඇසීම, බැලීම සහ කතාකිරීම වැනි ගුණාංගවලින් සමාන වුවද, ඒ දෙදෙනා මිනිස් හැකියාවන් වන ඇසීමෙන්, බැලීමෙන් සහ කතා කිරීමෙන් සමාන විය යුතු නැත.

අනෙකුත් ජීවයන් හට බැල්ම සහ සවනෙන් සමන් විතය. මවුන් හට ඇස්, අත්, පා සහ අනෙකුත් අවය වයන්ද ඇත. ඒ අවයවයන් මගින් ඒවා සමානවීමෙන් සියලු ජීවින් හරි සමාන විය යුතුද නැත.

ජීවින් අතරවූ නම් සහ ගුණාංගයන් එක් සමාන නිසා, ඒ ජීවින් හරි සමාන වීමටද උවමනා නැත. නම් සහ ගුණාංගයන් අතින් සමානව ඇති මැවීම් අතර පවා වෙන සක් වේනම්,මැවුම්කරුවා හා මැවීම් අතරවූ වෙනස ඉතා පැහැදිලි සහ විශාල වේ.

දෙවැනි කොටස : උපමා කරන්නන්

මොවුන් අල්ලාහ්ගේ නාමයන් සහ ගුණාංගයන් පිළිගත් තද ඒවා අල්ලාහ්ගේ නිර්මාණයන් හා සසඳති. උපමා කරති. අල්කුර්ආන්හි මූල්‍ය වාක්‍යයන්හී නියම අර්ථ කථයද මෙය වේ යැයි සිතන්නෝය. මන්දයත් අල්ලාහ් තම අනවැසියන් හා මවුන් පැහැදෙන අයුරු කතා කරයි යනුවෙන් සිතන්නෝය. ඒ අදිෂ්ඨානය හේතු රාශියක් මත

1. අල්ලාහ් තම නිර්මාණයන් හට සමානව ඇත්තේය යන්න වැරදි නිගමණයකි. ශුද්ධවූ අල්කුර්ආයේ වැකි සහ ප්‍රඥාඥානය ඒවා වැරදි බව තීරණය කරයි. තවද, කිසිවිටෙක ශුද්ධවූ අල්කුර්ආනයේ සහ හදීසයේ අර්ථ වැරදි අවබෝධයක් ඇති නොකරන්නේය.

2. අල්ලාහ් තම අනාවැසියන් හා ඔවුන් වටහා ගන්නා වචන මගින් කතා කිරීම යන්න ඒ වචනයේ නියම අර්ථය මත වේ. නමුදු ඒ අර්ථය කුමණ යථාර්ථය මත පවතීද, ඒ යථාර්ථය කෙරෙහි වූ අල්ලාහ් තම ඥානයේ සත්‍යය සහ යථාර්ථයේ නියම තේරුම මත කුමක් තෝරා ගන්නේද, ඒ සත්‍යයේ සහ යථාර්ථයේ නියම තේරුම අල්ලාහ්ගේ නාමයන් සහ ගුණාංගයන් පවති.

'සියල්ල සවන් දෙන්නා' යනුවෙන් අල්ලාහ් තමා ගැන පවසන්නේ නම්, සවන්දීම යන (ශබ්දයක් ඇසීම යන එහි) නියම තේරුම පසක්වේ. නමුදු අල්ලාහ්ගේ සවන් දීමේ බලය ගැනවූ යථාර්ථය අප කෙසේ දනිමුද? සවන්දීමේ ශක්තිය නිර්මාණයන් අතර පවා විශාල පරතරයක්ව තිබියදී නිර්මාතෘවරයා සහ නිර්මාණයන් අතර වූ ඒ වෙනස අති විශාලය.

අල්ලාහ් තමා ගැන ඔහු අර්ෂ් (සිංහාසනයෙ) හි (මහානුභාව සම්පන්න ලෙස) වාඩිවිය යනුවෙන් පවසද්දී වාඩිවිය යන්නෙහි නියම අර්ථය යමක් මත සාමාන්‍යයෙන්

වාඩිවීය යනුවෙන් පැහැදිලි වුවද, අල්ලාහ් වාඩිවිය[5] යන්නෙහි නියම තේරුම අප ඥානයට නොවැටහේ. එහි නියම තේරුම සහ යථාර්ථ ස්වරූපය දන්නේ අල්ලාහ් පමණි. වාඩිවීමේ ස්වභාවය සාමාන්‍යය ලෙස නිර්මාණයන් කෙරෙහිද වෙනස්වේ. කෙනෙකු සාමාන්‍යයෙන් පුටුවක් මත වාඩිවීම, මුරණ්ඩුව අති වේගයෙන් දුවන අශ්වයෙකු පිට කෙනෙකු වාඩිවීම හා සමාන නොවන්නේය.

මෙසේ වාඩිවීම පවා මැවීම් අතර විවිධ වන කළ, මැවුම් කරුවා සහ මහුගේ මැවීම් අතර වූ වෙනස අති විශාලය.

ඉහත අප සඳහන් කළ අපූරු සර්ව බල අල්ලාහ් තආලා කෙරෙහි විශවාස (ඊමාන්) කිරීම විශ්වාසවන්තයන් හට ඉතා ප්‍රයෝජන වේ. ඒවායෙන් සමහරක්:

1. අල්ලාහ්ගේ කේවලභාවය පිළිගැනීම මත, මහු හැර අන් කිසි කෙනෙකු කෙරෙහි විශ්වාස නොතැබීම සහ බිය නොවීම, මහු හැර අන් ඒවා හට වැඳුම්පිදුම් නොකිරීම කෙරෙහි ස්ථිර වීම.

2. අල්ලාහ්ගේ ප්‍රසංසනීය නාමයන් සහ උසස් ගුණාංගයන් මගින් අල්ලාහ් ගෞරව කිරීම සහ අල්ලාහ් කෙරෙහි සම්පූර්ණ ප්‍රියමනාපවීම කෙරෙහි ස්ථිරව සිටීම.

---

[5] (අල්කුර්ආන්හි 'ඉස්තවා' යන අරාබි වචනය පාවිච්චි කර ඇත. බලන්න පරිශුද්ධවූ අල්කුර්ආන්හි 7 : 54, 10 : 3, 20 : 5, 32 : 4, 25 : 59, 57 : 4 සහ 13 : 2 යන වැකි)

3. මහුගේ ආඥාවන් ඒ අයුරින්ම ඉටු කිරීමෙන්ද, ඔහු වැළැක්වූ දෙයින් වැළකී සිටීමෙන්ද ඉබාදත් හෙවත් වැඳුම්පිදුම්, ප්‍රාර්ථනා, බාරවීම සහ පවසමා ඇයැදීම ආදියෙන් සමන්වූ කුසල් ක්‍රියාවන් ස්ථිර කිරීම.

# මලාඉකාවරු (සුරදූතයන්) කෙරෙහි විශ්වාස කිරීම

මලාඉකාවරු මිනිස් දෘෂ්ටියට නොපෙනෙනා මිනිස් භාවෙන් බැහැරවූ අල්ලාහ්ගේ නිර්මාණයකි. මොවුහු සදා අල්ලාහ් ඉබාදත් (වන්දනා) කරමින් පසුවන කොටසකි. නිර්මාණය කිරීමේ ශක්තියක් හෝ දිව්‍යමය භාවයක් හෝ මොවුන් හට නැත. අල්ලාහ් මොවුන් ආලෝකයෙන් නිර්මාණය කර තම ආඥාවන් හට කීකරුවීමේ ස්වභාවය සහ ඒවා කඩිනමින් ඉටු කිරීමේ කුසලතාවයක්ද මොවුන්ට ලබා දී ඇත. මවුන් ගේ සංඛ්‍යාව අල්ලාහ් හැර අන් කිසිවෙකු නොදනී.

මොවුන් ගැන ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ومن عنده لا يستكبرون عن عبادته ولا يستحسرون﴾

*තවද, ඔහු වෙත වූ (මලාඉකා) අය ඔහු වන්දනාය කිරීම කෙරෙහි උඩඟු නොවන්නෝය. අල්ලාහ් දිවා රෑ ප්‍රශංසා කිරීමෙහිද විඩාවට පත් නොවන්නෝය.* (21 : 19-20)

මිඃරාජ්[6] සිද්ධිය ගැන අනස් (රලි) තුමා මෙසේ පවසති:

අහසෙහි බෙයිතුල් මඃමූර් නම් ස්ථානය මුහම්මද් තුමාට පෙන්වන ලදී. එහි සැමදා හැත්තෑ දහසක්වූ මලාඉකාවරු පිරිසක් අල්ලාහ්ට නමස්කාර කරමින් සිටිති. මවුහු ඒ

---

*6 මෙය නබිතුමා සප්ත අහස සිසාරා තරනය කර අල්ලාහ් වෙත ගිය සාමාන්‍ය මිනිස් චින්තනයෙන් ඈත්වූ ගමණකි. දවසක්දා මැදි රැය පසුවීමෙන් පසු අග්‍ර සුරදූත ජිබ්රීල්ගේ මෙහෙයුම යටතේ ජෙරුසලමේ මස්ජිදුල් අක්සා නම් දෙවස්ථානයටයද, ඉනික්බිති සප්ත අහස තරණය කර අල්ලාහ් වෙත ගියහ. මේ ගමණේදී දෛනික පස්වතා දේව නැමදුම පිරිනමන ලදී (පරි)*

වෙතින් පිටවන්නේ නම් ආපසු නොහැරෙන්නේය. එය මවුන්ගේ අවසාන පැමිණීමද වනු ඇත.

(ග්‍රන්ථ : බුහාරි සහ මුස්ලිම්)

මලාඉකාවරු කෙරෙහි විශ්වාසය සිව් කරුණු මත රඳා පවතී:

1. එවැනි නිර්මාණයක් ඇති බව විශ්වාස කිරීම.

2. මවුන්ගෙන් කවරෙකුගේ නම් අප දැනගෙන ඇත්තෙමුද ඒවා ඒ ආකාරයෙන්ම විශ්වාස කිරීම. (උදාහරණයක් වශයෙන් ජිබ්රීල් (අලෛ). සාමාන්‍යයෙන් ඒ නම අප සියලු දෙනා දන්නා බැවින් එය එසේම විශ්වාස කිරීම) ඒ හැරෙන්නට අනෙකුත්, නම් වශයෙන් නොදන්නා මලාඉකාවරු ඒ ආකාරයෙන්ම විශ්වාස කිරීම.

3. මවුන්ගේ ස්වභාවය කෙරෙහි දන්නා දේ පමණක් විශ්වාස කිරීම. (උදාහරණයක් වශයෙන් ජිබ්රීල් (අලෛ) ගැන අප දැනගත් දැනුම අනුව) ජිබ්රීල් (අලෛ)ගේ නියම ස්වභාවය අනුව, මුහම්මද් තුමා ජිබ්රීල් (අලෛ) මුල් අහසෙහි පියාපත් හත්සියයකින් සමන්විතව දුටු බව පවසා ඇත. සමහර අවස්ථාවන්හී මලාඉකාවරු මිනිස් වෙසින්ද පැමිණ ඇත. එක්තරා අවස්ථාවක අල්ලාහ් මර්යම් තුමිය වෙත ජිබ්රීල් මිනිස් වෙසින් පිටත් කළේය. ඒවිට ජිබ්රීල් සම්පූර්ණ මිනිස් වෙසින් එතුමිය ඉදිරිපිට පෙනී සිටියේය.

එක් මොහොතක මුහම්මද් තුමා තම කළණ මිතුරන් හා පිළිසඳරෙහි යෙදී සිටින කළ ජිබ්රීල් නම් අග්‍ර සුරදූතයා සුදෝසුදු හැඳිවතින් හා තද කළු පැහැති හිසකෙසින් යුතුව මිනිස් ස්වරූපය ගෙන පැමිණියේය. ගමනෙහි විඩාවක් හෝ මහන්සියක් හෝ මහු කෙරෙහි දකින්නට

නොවිය. නබිතුමාගේ යහළුවන් ආගන්තුකයා ගැන පෙර දැන සිටියේ නැත. පැමිණි ආගන්තුකයා තම දණහිස නබිතුමාගේ දණහිසට ගැටෙන (නොගැටෙන) තරමෙන් එතුමාට සමීපව වාඩිවිය. තම දැත් තම කලවා මත තබා ගත්තේය. පසුව ඊමාන්, ඉස්ලාම්, ඉහ්සාන් සහ පරමාන්ත දින සහ එහි සලකුණු ගැන එතුමාගෙන් විමසන ලදී. නබිතුමා ඒවා හට නිසියාකාරව පිළිතුරු දුන්හ. පිළිතුරු දීමෙන් පසු ආගන්තුකයා පිටවී ගියේය. පසුව නබිතුමා මෙසේ පැවසූහ. 'ඒ දැන් පැමිණියේ ජිබ්රීල් ය. ඔබ ආගම ඔබ හට ඉගැන්වීම පිණිස පැමිණියේය.'

(ග්‍රන්ථය : සහීහ් මුස්ලිම්)

මෙ හැරෙන්නට, අල්ලාහ් සමහර සුරදූතයන් ඉබ්රාහීම් සහ ලූත් නබි තුමා වෙතද මිනිස් වෙසින් පිටත් කළේය.

4. අල්ලාහ් සමහර මලාඉකාවරු සමහර ක්‍රියාවන් සඳහා පත්කර ඇති අයුරු දැනගත් පරිදි එසේම විශ්වාස කිරීම. උදාහරණයක් වශයෙන් මලාඉකාවරු සදා අල්ලාහ්ගේ තේජස වර්ණනා කරමින් විඩාවකට හෝ ආයාසයට හෝ පත් නොවී දිවා රෑ නොනකා වන්දනයෙහි යෙදී සිටිති.

ඔවුන්ගෙන් සමහරුන් හට සමහර වගකීම් පැවරී ඇත. ඒවායේ සමහරක් මෙසේය.

* ජිබ්රීල් (අලෛ) තුමා: නබිවරු සහ රසූල්වරු වෙත වහි නම් දිව්‍යමය පණිවුඩය රැගෙන යැම සඳහා අල්ලාහ් විසින් පත්කර ඇත. ජිබ්රීල් ශ්‍රේෂ්ඨ පඨක්තියේ සුරදූතයෙකි.

* මීකායීල් (අලෛ) තුමා: වර්ෂා කර රෝපනය කිරීමෙ හා පෝෂණය කිරීමෙ කාර්යයන් සඳහා පත් කර ඇත.

* පරමාන්ත දිනයේ, නිර්මාණයන් සියල්ල නැවත පනපොවා නැගිටවීම පිණිස සූර් නම් කාහලය පිඹීම පිණිස ඉස්රාෆීල් නම් මලක් වරයා පත් කර ඇත.

* මිනිසුන්ගේ පණ ඩැහැගැනීම පිණිස මලකුල් මවුත් නම් මලක්වරයා පත් කර ඇත.

* නිරයේ ආරක්ෂකයා ලෙස අල්ලාහ් විසින් මාලික් නම් මලක්වරයා පත් කර ඇත.

* ගැබිණි මව්වරුන්ගේ ගර්භාෂය තුල ඇති නොමේරූ කලලයන් සඳහා අල්ලාහ් මලක් වරයෙකු ඒ වෙත යවා එහි වැටෙන කලලයේ ආයුෂ, පෝෂණය, ක්‍රියා සහ අවයවයන් සහ යහපත්, අයහපත් ගැනවූ තොරතුරු ලිවීම පිණිස පත් කර ඇත.

* මිනිසුන්ගේ මෙලොව ක්‍රියාවන් සටහන් කර සුරක්ෂා කරනු වස්ද අල්ලාහ් මලක්වරු දෙදෙනෙකු පත් කර ඇත. මිනිසාගේ ලෞකික ක්‍රියාවන් ග්‍රන්ථාරූඪ කර තබනු වස් ඔවුන් දෙන්නා මිනිසාගේ වම් සහ දකුණ පසෙහි පසුවෙති.

* මල අය භූමදානය කළායින් පසු ඔවුන්ගේ කුසල් අකුසල් කර්මයන් ගැන විමසනු වස්ද අල්ලාහ් විසින් මලක්වරුන් පත් කර ඇත. මෘතදේහය මිනිවලේ තැන්පත් කළායින් පසු මිණිවල වෙත පැමිණෙන ඒ මලක් වරුන් දෙන්නා ඔහුගේ දෙවියා, දහම සහ වක්තෘ වරයා වැනි දේ ගැන ප්‍රශ්ණ කරනු ලබනු ඇත.

මලක්වරුන් කෙරෙහි මුලුමනින්ම විශ්වාස කිරීමෙන් මතු සඳහන් වන ප්‍රයෝජන ඇත.

1. අල්ලාහ්ගේ ගුණාංගයන්හී ස්වභාවය සහ මහුගේ ආධිපත්‍ය වැනි දේ ගැන අවබෝධ කර ගැනීමට හැකිය. මන්දයත් නිර්මාණයන්හී තේජස නිර්මාතෘවරයාගේ තේජස මත පිහිටා ඇති හෙයිණ.

2. අල්ලාහ් ආදම්ගේ පෙලපතට ප්‍රමුඛත්වයක් ලබා දී ඇති හෙයින් ඒ සඳහා අල්ලාහ්ට ස්තුති වන්ත වීම. මවුන් ආරක්‍ෂා කර, මවුන්ගේ ක්‍රියාවන් සටහන් කර, මවුන්ගේ යහපත සඳහා අල්ලාහ් මලක්වරු පත්කර ඇති හෙයින් ඒ වෙනුවෙන් අල්ලාහ් දෙව්දුට ස්තුති වන්ත වීම.

3. ඒ මලක්වරු සදා සර්වබල අල්ලාහ්ගේ තේජස ප්‍රශංසා කරමින් නිරන්තරව මහුට ශාෂ්ඨාංග කරමින් සිටින හෙයින් මවුන් කෙරෙහි ප්‍රියමනාප වීම.

මලක්වරුන් ගැන පවසන කළ, මවුන් හට ස්ථිර දේහයක් ඇති බව සමහරු ප්‍රතික්ෂේප කරති. සමහර නිර්මාණයන් තුල සැඟවී ඇති සමහර හැදියාවන් මලක්වරුන් යැයි කියති. මෙසේ සිත්සේ නිගමණය කිරීම අල්කුර්ආනය සහ මුස්ලිම්වරුන්ගේ ඒකමතික තීරණය (ඉජ්මඋ) සහ හදීස් හට මුලුමනින්ම පටහැනිය.

﴿الْحَمْدُ لِلَّهِ فَاطِرِ السَّمَاوَاتِ وَالْأَرْضِ جَاعِلِ الْمَلَائِكَةِ رُسُلًا أُولِي أَجْنِحَةٍ مَّثْنَىٰ وَثُلَاثَ وَرُبَاعَ﴾

*සියලු පැසසුම් අහස් සහ පොළව නිර්මාණය කර, පියාපත් දෙක, තුන, හතර ලෙසින් වූ මලාඉකාවරු (සුරදූතයන්) නිර්මාණය කළ අල්ලාහ්ටය.* (25 : 1)

තවද පරිශුද්ධ අල්කුර්ආනය මෙසේ පවසයි :

﴿ولو ترى إذ يتوفى الذين كفروا الملائكة يضربون وجوههم وأدبارهم﴾

*(නබි තුමනි) මලාඉකාවරු ප්‍රතික්ෂේප කරන්නන්ගේ ප්‍රාණයන් ඩැහැගන්නා අයුරු (ඔබ) දකින්නේ නම්, ඔවුහු (මලාඉකාවරු) ඔවුන්ගේ මුහුණෙහි සහ පිටුපසෙහි දරුණු ලෙස පහර දෙනු ඇත.* (අල්කුර්ආන් 8 : 50)

තවත් අල්කුර්ආන් වාක්‍යයක් මෙසේ පවසයි:

﴿ولو ترى إذ الظالمون في غمرات الموت والملائكة باسطوا أيديهم أخرجوا أنفسكم﴾

*තවද, මෙම අපරාධකරුවන්ගේ මරණාසන්න මොහොතෙහි ඔබ ඔවුන් දකී නම් මලාඉකාවරු තම අත් දික්කර (ඔවුන්ගෙන්) 'ඔබගේ ප්‍රාණයන් පිටමං කරනු' (යනුවෙන් පවසනු ඇත.)* (අල්කුර්ආන් 6 : 93)

තවත පරිශුද්ධවූ අල්කුර්ආන් වැකියක් මෙසේ පවසයි:

﴿حتى إذا فزع عن قلوبهم قالو اماذا قال ربكم قالوا الحق وهو العلي الكبير﴾

*මෙසේ ඔවුන් (මලක්වරුන්)ගේ සිතෙහිවූ චකිතය තුරන්වේ නම (ඔවුන්ගෙන් කෙනෙකු අත් අය අමතා) 'ඔබගේ ආරක්ෂකයා කුමක් පැවසුවාද? යනුවෙන් විමසනු ඇත. (එයට ඔවුන්) 'සත්‍යය පැවසුවේය. ඔහු අතිශ්‍රේෂ්ඨ අති උසස්ය' යනුවෙන්ද පවසනු ඇත.* (34 : 23)

අල්ලාහ් පරිශුද්ධවූ අල්කුර්ආනයේ ස්වර්ගයේ මලාඉකාවරුන්ගේ කටයුතු ගැන මෙසේ පවසයි:

﴿والملائكة يدخلون عليهم من كل باب سلام عليكم بما صبرتم فنعم عقبى الدار﴾

*තවද, මලාඉකාවරු සියලු දොරටු මගින් ඔවුන් වෙත ඇතුල්වනු ඇත. 'ඔබ (ඔබ ජීවිතයේ කරදර)ඉවසා සිටි හෙයින් ඔබ හට ශාන්තිය උදාවේවා. (ඔබට මෙම) අවසන් නිවස උචිත වේ.* (අල්කුර්ආන් 13 : 23-24)

මුහම්මද් තුමා පැවසූ බව අබූහුරෙයිරා තුමා පැවසූ හදීසයක් බුහාරි ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ:

عن أبى هريرة رضى ا الله عنه عن النبى صلى ا الله عليه وسلم قال إذا أحب ا الله العبد نادى جبريل إن ا الله يحب فلانا فأحبه ؛ فيحبه جبريل ؛ فينادى جبريل أهل السمآء إن ا الله يحب فلانا فأحبوه؛ فيحبه أهل السمآء ؛ ثم يوضع له القبول فى الأرض (البخارى)

අල්ලාහ් තම අතවැසියෙකු කෙරෙහි ප්‍රිය වූවා නම් අග්‍ර සුරදූත ජිබ්රීල් අමතා 'මා මෙම අතවැසියා කෙරෙහි ප්‍රිය වෙමි. ඔබද ප්‍රිය වනු මැන' යනුවෙන් පවසනු ඇත. එසේම සුරදූත ජිබ්රීල්ද ඔහු කෙරෙහි ප්‍රිය වනු ඇත. පසුව ජිබ්රීල් ඒ පුවත අහසෙහිවූ අනෙකුත් සුරදූතයන් හටද දැනුම් දෙනු ඇත. 'සැබැවින්ම අල්ලාහ් එක්තරා අතවැසියෙකු කෙරෙහි ප්‍රියමනාප වෙයි. ඔබද ඔහු කෙරෙහි ප්‍රියමනාප වන්න' යනුවෙන් පවසනු ඇත. අහසෙහිවූ සියල්ල ඔහු ප්‍රිය කරනු ඇත.පසුව එම අතවැසියා පොළොවෙහි පිං වන්තයෙකු ලෙස අමතනු ඇත.

අබූ හුරෙයිරා (රලි) තුමා පවසන තවත් හදීසයක් බුහාරි ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ.

وعنه أيضا قال : قال النبى صلى ا لله عليه وسلم :إذا كان يوم الجمعة كـان على كل باب من أبواب المسجد الملآئكة يكتبون الأول فالأول فـإذا جلس الإمام طووا الصحف وجاؤو ا يستمعون الذكر.

ජුම්ආ දිනයේ මස්ජිදයේ සියලු දොරටු අසල මලාඉකාවරු වාඩි වී ජුම්ආ වෙනුවෙන් පැමිණෙන අය අනුපිළිවෙළින් පින් සටහන් කරනු ඇත. ඉමාම් මිම්බරය මත වාඩි වූවායින් පසු මලාඉකාවරු නම ලේඛණයන් අකුලා කුත්බා දේශනයට සවන්දීම පිණිස නැගිට යනු ඇත.

ඉහත සඳහන් වූ ශුද්ධවූ අල්කුර්ආන් වැකි සහ මුහම්මද් තුමාගේ හදීස් සංකල්පය මගින් පෙනී යන්නේ සුරදූතයන් දේහයක් ඇති අල්ලාහ්ගේ නිර්මාණයක් බවත්, දුදනන් පවසන සේ මානසික ශක්තීන් නොවන බවත්, සියලුම මුස්ලිම්වරු ඒ ගැන ශුද්ධවූ අල්කුර්ආනය සහ හදීස් සංකල්පය පැහැදිලි කරන අයුරු විශ්වාස කළ යුතු බවත්ය.

❀❀❀

# අල්ලාහ්ගේ පුස්තක (දේව ග්‍රන්ථයන්) කෙරෙහි විශ්වාසය

අල්කුතුබ් (දේව ග්‍රන්ථ) යන්න 'කිතාබ්' යන අරාබි වචනයෙහි බහු වචනය වේ. කිතාබ් යනු ලියන ලද්දක් යනුවෙන් තේරුම වේ. මෙහි දේව ග්‍රන්ථ යනුවෙන් පැහැදිළි කරන්නේ සර්ව බලධාරී අල්ලාහ් වක්තෘවරු කෙරෙහි පහළ කළ දේව හෙළිකිරීම් වන ග්‍රන්ථවේ. මිනිසා හට අනුග්‍රහය සහ මගපෙන්වීම පිණිසද, එමගින් මිනිසා දෙලොවෙහි ඉතා උන්නතියක් ලබාගැනීමේ පරම චේතනාවෙන්ද අල්ලාහ් දේව ග්‍රන්ථයන් පහළ කළේය.

දේව ග්‍රන්ථයන් කෙරෙහි විශ්වාස කිරීම සිව කරුණු මත රඳා පවතී.

1. සත්‍ය වශයෙන්ම ඒවා සර්වඥාන අල්ලාහ් වෙතින් පහළ වූ බව විශ්වාස කිරීම.

2. අප දැනගත් දේව ග්‍රන්ථවල නම් සහ ඒවා පහළවූ වක්තෘවරු ගැන ඒ ආකාරයෙන්ම විශ්වාස කිරීම.

උදාහරණයක් වශයෙන්:

1. අල්කුර්ආනය මුහම්මද් තුමා වෙත පහළ විය.
2. තව්රාත් ආගම මූසා තුමා වෙත පහළ විය.
3. ඉන්ජීල් ආගම ඊසා තුමා වෙත පහළ විය.
4. සබූර් ආගම දාවූද් තුමා වෙත පහළ විය.

අප නම් වශයෙන් නිශ්චිතව නොදන්නා ආගම් ගැන ඒ ආකාරයෙන්ම විශ්වාස කර පිළිගත යුතුය.

3. එම ආගම් ඉදිරිපත් කරන පණිවුඩවලින් සත්‍ය බව තහවුරු වූ ඒවා පමණක් ඒ අයුරින්ම පිළිගැනීම.

උදාහරණයක් වශයෙන් අල්කුර්ආනයේ පණිවුඩය එයට පෙරවූ ආගම්වල ඇති වෙනස් නොවූ සහ විකල්ප නොවූ තොරතුරු අනුව ඒ ආකාරයෙන්ම පිළිගැනීම.

4. ඒ ග්‍රන්ථවල අවලංගු නොවූ සත්‍යයන් අල්කුර්ආන් මගින් අනුමත නීතින් මත ක්‍රියාකිරීම සහ ඒ නීතිවල ප්‍රවීණතාවය නොවැටහුනද ඒවා පිළිගැනීම.

අල්කුර්ආනය පහළ වීමෙන් පසු එයට පෙර පහළවූ සියලු ආගම් ග්‍රන්ථයන් අහෝසි විය. ඒ කරුණ අළලා අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿وأنزلنا إليك الكتاب بالحق مصدقا لما بين يديه من الكتاب ومهيمنا عليه﴾

*තවද (තබිතුමනි සම්පූර්ණ) සත්‍යයෙන් හෙබි මෙම ආගම අප ඔබ වෙත පහළ කෙළෙමු. මෙය අල්කිතාබ් (පෙරවූ සුද්ධ ග්‍රන්ථයන්)හී ශේෂවූ වැදගත් (සත්‍ය) කරුණු හට අනුකූලතා දක්වමින් ඒවා ආරක්ෂා කරයි.*

(අල්කුර්ආන් 5 :48)

මේ අනුව පෙර පහළවූ ආගම්වල නීතින් අනුව ක්‍රියා නොකළ යුතු බව පැහැදිලිය. අල්කුර්ආන්හී නීතිවලට විකල්ප නොවන අයුරින් ඇති දේ අනුව ක්‍රියා කිරීම ධර්ම දෘෂ්ඨියෙන් වැරද්දක් නැත.

දේව ග්‍රන්ථයන් කෙරෙහි විශ්වාස කිරීම මතු සඳහන් ප්‍රයෝජනයන් ගෙන දේ. ඒවා මෙසේය:

1. ඍජු මග පෙන්වීමක් ලෙස අල්ලාහ් සෑම සමාජයකටම ආගම පහළ කිරීම, මිනිසා කෙරෙහිවූ අල්ලාහ්ගේ දයාව සහ කරුණාව බව වටහා ගැනීම.

2. සියලුම සමාජයන් හට සුදුසු අන්දමට සර්වඥාන අල්ලාහ් ෂරීආ (ආගම නීතිරීතින්) ඉදිරිපත් කිරීම කෙරෙහි අල්ලාහ් තආලා ඉදිරිපත් කළ ෂරීආ නීතියෙහි ප්‍රවීනතාවය අවබෝධ කර ගැනීම.

සුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

﴿لكل جعلنا منكم شرعة ومنهاجا﴾

*අප ඔබගේ සියලු සමාජයන් හට (සත්‍යයෙන් හෙබි) ධර්මයක්ද අනුගමණය කිරීමට ඍජු මගක්ද නියම කෙළෙමු.* (5 : 48)

3. අල්ලාහ් මිනිසාට ඍජුමග පෙන්වා දී ඔහු වෙත හෙළූ දයාවන් හා වරප්‍රසාධයන් වෙනුවෙන් අති දයාබර අල්ලාහ්ට ස්තුතිවන්ත වීම.

## වක්තෘවරු කෙරෙහි විශ්වාසය

රසූල් නම් වචනය 'අර්රුසූල්' නම අරාබි වචනයේ ඒක වචනයයි. රසූල් යනු පිටත්කළ අය යන තේරුම වේ. එනම් යම් කරුණක් වෙනත් අය හට භාර කිරීමට පැමිණි අය වේ.

මෙහි රසූල් (වක්තෘ) වරු යනුවෙන් අදහස් කරන්නේ අල්ලාහ්ගේ සත්‍ය දහම ප්‍රචාරය කිරීම පිණිස දිව්‍යමය පණිවුඩය ලබා ඒවා සමාජය වෙත ඉදිරිපත් කළ අය වේ.

වක්තෘ වරුන්ගේ මූලාරම්භකයා වන්නේ නූහ් නබි තුමාය. අවසාන වක්තෘ වරයා මුහම්මද් තුමා වේ.

මුහම්මද් තුමාට දිව්‍යමය හෙළිකිරීම් පහළ කිරීම ගැන සර්වබල අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසයි :

﴿إِنَّا أَوْحَيْنَا إِلَيْكَ كَمَا أَوْحَيْنَا إِلَى نُوحٍ وَالنَّبِيِّينَ مِن بَعْدِهِ﴾

*(නබි තුමනි) සැබැවින්ම නූහ්ට සහ ඔහුට පසු පැමිණි වක්තෘවරුන් හට වහි (දිව්‍යමය පණිවුඩය) හෙළි කළ සේ ඔබ වෙතද වහි පහළකළෙමු.* (4 : 163)

පරමාන්ත දිනයේ මුහම්මද් තුමා තම අනුගාමිකයන් හට ෂෆාඅත් පිණිස දෙවියන් වෙත මැදිහත් වීම සම්බන්ධ හදීසයක් බුහාරි ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ.

අනස් බින් මාලික් තුමා පවසයි : මිනිස්සු තමන් වෙනුවෙන් අල්ලාහ් වෙත මැදිහත් වී පාපොච්චාරනය කරනු පිණිස ආදම් තුමා වෙත යනු ඇත. එයට ආදම් තුමා තමාට නොහැකි බව ප්‍රතික්ෂේප කර මුලින් මෙලොවට

පහළ වූ වක්තෘවරයා වන නුහ් තුමා වෙත යන ලෙස පවසනු ඇත.

මුහම්මද් තුමා ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ما كان محمد أبا أحد من رجالكم ولكن رسول الله وخاتم النبيين﴾

*(මනුෂ්‍යයිනි) (වක්තෘ) මුහම්මද් ඔබගේ පිරිමින්ගෙන් කිසිවෙකුගේ පියා නොවන්නේය. නමුදු එතුමා අල්ලාහ්ගේ වක්තෘවරයා සහ නබිවරුන්ගේ අවසාන මුද්‍රාවද වේ.*

(33 : 40)

වක්තෘවරයෙකු බිහි නොවූ සමාජයක් මෙලොවෙහි නැත. අල්ලාහ් සියලුම වක්තෘන් හට ආගමික නීතිරීතින් පවරා මවුන් තම සමාජයන් වෙත පිටත් කළේය. නැතහොත් මිනිසුන් වෙතින් ඇත්වී ගිය පෙර නීතිරීතින් ප්‍රතිසංස්කරණය සඳහා වක්තෘ කෙනෙකු පත්කර එයට පෙරවූ ආගමික නීතිරීතින් ගැනවූ දැනුම ලබා දුන්නේය.

මෙම කරුණ අළලා අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ولقد بعثنا في كل أمة رسولا أن اعبدوالله واجتنبوا الطاغوت﴾

*අල්ලාහ් පමණක් වැඳ තාඝූත් (ව්‍යාජ දෙවිවරුන් වැඳීම) වෙතින් ඉවත් වන්නා ලෙස වහි ඉදිරිපත් කරමින්, අප සියලු සමාජයන් හට වක්තෘවරු ඉදිරිපත් කෙළෙමු.*

(අල්කුර්ආන් 16 : 36)

වක්තෘවරුන්ගේ පැමිණීම ගැන සනාථ කරමින් තවත් අල්කුර්ආන් වැකියක් මෙසේ සඳහන් වේ:

﴿وإن من أمة إلا خلا فيها نذير﴾

*තවද අනුශාසකයෙක් මවුන් අතර පැමිණී මිස සමාජ යක් ලොවෙහි නැත.* (අල්කුර්ආන් 35 :24)

තවත් අල්කුර්ආන් වැකියක් මෙසේ සඳහන් කරයි:

﴿إنا أنزلنا التوراة فيها هدى ونور يحكم بها النبيون الذين أسلموا للذين هادوا﴾

*ඇත්තෙන්ම අප යහමග සහ කාන්තියක් ඇති තව්රාත් (ආගම) පහළ කෙළෙමු. (අල්ලාහ් හට) සම්පූර්ණයෙන්ම කීකරු වූ නබිවරු ඒ මගින් යුදෙව්වන් හට විනිශ්චය කළහ.* (අල්කුර්ආන් 5 : 44)

වක්තෘවරු අල්ලාහ් විසින් නිර්මාණය කළ සාමාන්‍ය මිනිසුන් වේ. නිර්මාණය කර පාලනය කිරීමේ ශක්තියක් හෝ වැඳීමට සුදුසු කිසිදු දිව්‍යමයභාවයක් හෝ එ වක්තෘවරුන් හට නැත.

වක්තෘවරුන් අතරින් අතිශ්‍රේෂ්ඨයා වූද, මවුනතරින් අති උත්තමයා වූද මුහම්මද් තුමා ගැන පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ قل لا أملك لنفسي نفعا ولا ضرا إلا ماشاء الله ولو كنت أعلم الغيب لاستكثرت من الخير وما مسني السوء إن أنا إلا نذير وبشير لقوم يؤمنون﴾

*(නබිතුමනි) පවසන්න, අල්ලාහ්ගේ මනාපය නොවන්නට සෙතක් හෝ විනයක් හෝ මා හට කරගැනීමට ශක්තියක් මා හට නැත. අදෘශ්‍යමාන දැනී ඥානය මා හට වේ නම්, කිසිදු නපුරක් මා වෙත නොඇද යහපත් දේ පමණක් අත්කර ගනිමි. එහෙත් මා බවදන් දෙන්නෙකු සහ විශ්වාසවන්ත ජනයන් හට සුභාරංචි පවසන්නෙකු පමණක් වෙමි.* (අල්කුර්ආන් 7 : 188)

මුහම්මද් තුමාගේ වක්තෘත්වය තහවුරු කරණු වස් තවත් අල්කුර්ආන් වැකියක් මෙසේ සඳහන් කරයි:

﴿قل إني لا أملك لكم ضرا ولا رشدا . قل إني لن يجيرني من الله أحد ولن أجد من دونه ملتحدا﴾

*(නබිතුමනි,) 'සැබැවින්ම මබ හට සෙතක් හෝ නපුරක් හෝ කිරීමට මා හට ශක්තියක් නැත' යනුවෙන් පවසනු මැනව. 'අල්ලාහ්ගේ අඬුවමෙන් මා ආරක්ෂා කිරීමටද කිසි වෙකුට නොහැකිය. තවද අල්ලාහ් හැර වෙනත් පිළිසරණයක්ද මා හට නැත' යනුවෙන් පවසනු මැනව.*
(අල්කුර්ආන් 72 : 21-22)

ලෙඩ, මරණය, බඩගින්න, පිපාසය සහ ආශාවන් වැනි මිනිස් ස්වභාවයන් වක්තෘවරුන් හටද ඇත.

ඉබ්රාහීම් නබි තුමා තම දෙවියාගේ හැකියාවන් ගැන මතක් කර කී බව අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ والذي هو يطعمني ويسقين.وإذا مرضت فهو يشفين.والذي يميتني ثم يحيين﴾

*ඔහු මා හට ආහාරය දෙන්නේය. පානය දෙන්නේ ඔහුය. මා රෝගාතුරවූ කළ නිරෝග කරන්නේ ඔහුය. මා මරණයට පත් කරන්නේය. අනතුරුව (නැවත) ජීවයද දෙන්නේය.* (අල්කුර්ආන් 26 : 79-81)

බොහෝ අවස්ථාවන්හීදී මුහම්මද් තුමා තම ශ්‍රාවකයන් හා මෙමසේ පැවසූහ:

إنما بشر مثلكم أنسى كما تنسون فإذا نسيت فذكرني.

*සැබැවින්ම මමද ඔබ වැනි මිනිසෙකු වෙමි. ඔබට අමතකවීම ඇතිවන සේ, මා හටද අමතක වේ. මා හට යමක් අමතක වූ කළ මතක් කර දෙනු මැනව!*

අල්ලාහ් ඔහුගේ වක්තෘවරුන් ගැන සඳහන් කරද්දි ඔවුහු අල්ලාහ්ගේ කීකරු අතවැසියන් බවද, මිනිස් භාවෙහි ඉතා උසස් ස්ථානයක් ලත් අය ලෙසද සඳහන් කරයි.

නූහු නබි තුමා ගැන අල්ලාහ් මෙසේ පවසයි:

﴿إنه كان عبدا شكورا﴾

*සැබැවින්ම ඔහු (නූහු තුමා) ස්තුතිවන්ත අතවැසියෙකු ලෙස විය.* (අල්කුර්ආන් 17 : 3)

මුහම්මද් තුමා අල්ලාහ්ගේ කීකරු අතවැසියෙක් බව ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ සාධක වෙයි:

﴿تبارك الذي نزل الفرقان على عبده ليكون للعالمين نذيرا﴾

*ලෝවැසියන් හට අනතුරු ඇඟවීමක් ලෙස ෆුර්කාන් (නම් සත්‍යාසත්‍ය වෙන්කරන ඉස්ලාම් ආගම) තම අත වැසියා (මුහම්මද් තුමා) කෙරෙහි පහළ කළා වූ දෙවියා අති උසස්ය.* (අල්කුර්ආන් 25 : 1)

තවද, ඉබ්රාහීම්, ඉස්හාක් සහ යඃකූබ් නබිවරු ගැන අල්කුර්ආනය මෙසේ සඳහන් කරයි:

*(නබි තුමනි, අල්ලාහ්ගේ ආඥාවන් ඉටු කරනා) හැකියාවන් හා (ආගමෙහි සූක්ෂ්මතාවයන් පැහැදෙන්නා) දෘෂ්ටියක් ඇති අප කීකරු අතවැසියන් වන ඉබ්රාහීම්, ඉස්හාක් සහ යඃකූබ් නබිවරු ගැන සිහි කරන්න.*

(අල්කුර්ආන් 38 : 45)

තවත් තැනක ඊසා නබිතුමා ගැන අල්කුර්ආනයේ වාක්‍යයක් මෙසේ සඳහන් කරයි:

﴿إن هو إلا عبد أنعمنا عليه وجعلناه مثلا لبني إسرائيل﴾

*(ඊසා (ජේසු) නම්) ඔහු (අපගේ) කීකරු වහලෙකු හැර (දෙවියෙකු) නොවේ. ඔහු කෙරෙහි අපගේ කරුණාව පෙළා ඉස්රායෙල් ජාතීන් හට උදාහරණයක් බවට පත් කෙළෙමු.* (අල්කුර්ආන් 43 : 59)

වක්තෘවරු කෙරෙහි විශ්වාස කිරීම සිව කරුණු මත රැඳේ.

1. ඔවුන්ගේ වක්තෘත්වයෙහිවූ වගකීම සැබැවින්ම සර්ව ඥාන අල්ලාහ් විසින් පිරිනමන ලද බව විශ්වාස කිරීම.

එක් වක්තෘවරුයෙකුගේ දිව්‍යමය පණිවුඩය ප්‍රතික්ෂේප කරන්නා සියලු වක්තෘවරුන් ප්‍රතික්ෂේප කරන්නා වේ. නූහු නබි තුමා ප්‍රතික්ෂේප කළ ජනයන් ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿كذبت قوم نوح المرسلين﴾

*නූහ් (නබි)ගේ සමාජයේ අය සියළු වක්තෘවරු බොරු කළහ.* (අල්කුර්ආන් 26 : 105)

නූහ් නබිගේ සමාජයේ වැසියන් සියලු වක්තෘවරු බොරු කළ බව අල්ලාහ් අල්කුර්ආනයේ පවසන්නේය. ඒවිට වෙනත් වක්තෘවරයෙක් ඔවුන් හට නොවූවා මෙන්ම මුහම්මද් තුමාගේ පණිවුඩය පිළි නොගෙන ප්‍රතික්ෂේප කරන ක්‍රිස්තියානිවරු මේරි තුමියගේ පුත්‍රයා ඊසා තුමාගේද පණිවිඩය ප්‍රතික්ෂේප කරන්නන් වේ. සැබැවින්ම වක්තෘ මුහම්මද් තුමා ප්‍රතික්ෂේප කරනා එම කිතුනුවන් ඊසා තුමාගේ නියම ඉගැන්වීම් පවා පිළි නොපදින්නා අයවේ.

තවද ඊසා තුමා මුහම්මද් තුමාගේ මතු පැමිණීම ගැන කිතුනුවන් හට පෙර නිමිති පළ කර ඇත. එයින් පැහැදිලි වන්නේ මුහම්මද් තුමා පවා ඒ සමාජයට පත්වූ වක්තෘ වරයෙකු යන්නයි. තවද, අල්ලාහ් වක්තෘවරු මගින් ඒ ඒ සමාජයන් හට යහමග පෙන්වීමට බලාපොරොත්තු විය යන්න සුපැහැදිලිය.

2. නම් වශයෙන් දන්නා ඒ වක්තෘවරුන් ගැන එසේම විශ්වාස කළ යුතුය. මුහම්මද්, ඉබ්රාහීම්, නූහ්, මූසා සහ මරියම්ගේ පුත්‍ර ඊසා වැනි වක්තෘ වරුන් කෙරෙහි විශ්වාස කරන්නා සේ, මෙම පස්දෙනා 'උලුල් අස්මිවරු' (ස්ථිර අධිෂ්ඨානයෙන් යුත් අය) ලෙස විශ්වාස කළ යුතුය.

මේ කරුණ අළලා සර්වබල අල්ලාහ් අල්කුර්ආනයේ දෙපොලක පැහැදිලිව පවසා ඇත. ඒවා මෙසේය :

﴿ وَإِذْ أَخَذْنَا مِنَ النَّبِيِّينَ مِيثَاقَهُمْ وَمِنكَ وَمِن نُّوحٍ وَإِبْرَاهِيمَ وَمُوسَى وَعِيسَى ابْنِ مَرْيَمَ ﴾

*තවද, නබිවරුන්ගෙන්ද, ඔබ සහ නූහ් තවද, ඉබ්රාහීම්, මූසා සහ මරියම්ගේ පුත්‍රඊසා යන අයගෙන් (අත් ස්ථිර) ප්‍රතිඥා ගත්තෙමු.* (33 : 7)

﴿شَرَعَ لَكُم مِّنَ الدِّينِ مَا وَصَّى بِهِ نُوحًا وَالَّذِي أَوْحَيْنَا إِلَيْكَ وَمَا وَصَّيْنَا بِهِ إِبْرَاهِيمَ وَمُوسَى وَعِيسَى أَنْ أَقِيمُوا الدِّينَ وَلَا تَتَفَرَّقُوا فِيهِ ﴾

*(විශ්වාස වන්න මිනිසුනේ,) නූහ් නබි වෙත නියම කළ දෙයම (අල්ලාහ්) ඔහු ඔබ හටද නියම කර ඇත. එහෙයින් (නබි තුමනි), අප ඔබ හට වහි මගින් ප්‍රකාශ*

*කළ දේ සහ ඉබ්රාහීම් මූසා සහ ඊසා (නබිවරුන්) හට ඉදිරිපත් කළ දේද, ඔබ (ඒක දේවවාද සත්‍ය) ආගම පිහිටුවව. එහි භේද ඇති කර නොගන්න (යනුවෙනි).*

(අල්කුර්ආන් 42 : 13)

ඒ හැරෙන්නට නම් වශයෙන් ස්ථිරව නොදන්නා වක්තෘවරු කෙරෙහිද මුළුමනින්ම විශ්වාස කළ යුතුය. පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ولقد أرسلنا رسلا من قبلك منهم من قصصنا عليك ومنهم من لم نقصص عليك﴾

*නවද, (නබිතුමනි) ඔබට පෙරද, අප නබිවරු පහළ කෙලෙමු. මවුන්ගෙන් සමහරෙකුගේ ඉතිහාසයන් ඔබ හට කීවෙමු. තවත් සමහරුන්ගේ ඉතිහාසයන් ඔබට නොකීවෙමු.*

(අල්කුර්ආන් 40 : 78)

3. මවුන් සම්බන්ධව ලබාගත් කරුණුවලින් සත්‍ය ඒවා එලෙසම පිළිගත යුතුය.

4. ඒ වක්තෘවරුන්ගෙන් අපතරට පැමිණි වක්තෘවරයාගේ පණිවුඩය සහ නීතිරීතින් ඒ ආකාරයෙන්ම පිළිගත යුතුය. අවසාන වක්තෘවරයා වන මුහම්මද් තුමා එක් සමාජයකට පමණක් සීමා නොවී මුළු මානවයාටම අයත්වේ.

එතුමා පිළිපැදීම කෙරෙහි අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿فلا وربك لا يؤمنون حتى يحكموك فيما شجر بينهم ثم لا يجدوا في أنفسهم حرجا مما قضيت ويسلموا تسليما﴾

*නබිතුමනි, ඔබ දෙවියාගේ නාමයෙන්, මවුහු තමනතර ඇතිවූ ආරාවුල් වෙනුවෙන්, ඔබ විනිසුරු කර ඔබගේ තීන් දුව තම සිත් තුළ කිසිදු අමනාපයකින් තොරව පිළිගෙන*

*සම්පූර්ණයෙන්ම කීකරු වන තුරු මවුහු සත්‍ය විශ්වාස වන්තයින් නොවන්නෝය.* (අල්කුර්ආන් 4 : 65)

වක්තෘවරු කෙරෙහි විශ්වාස කිරීමෙහිලා ඇති ප්‍රයෝජන:

1. අල්ලාහ් තම අනවැසියන් වෙත හෙලූ කරුණාව සහ පරෝපකාරය ගැන දැනගැනීම : එය කෙසේදයත් අල්ලාහ් මිනිසා හට මවුන්ගේ චින්තන මගින් වටහා ගත නොහැකි ඍජු මගපෙන්වීම සහ මවුන් කෙසේ තම නිර්මාතෘ වරයාහට කීකරු වී නමස්කාර කළ යුතුද යන්නද පැහැදිලි කර දීම පිණිස වක්තෘවරු ඉදිරිපත් කර කරුණාව දැක්විය.

2. අල්ලාහ් විසින් ප්‍රධානය කරන ලද මෙම විශාල පරෝපකාරය වෙනුවෙන් අල්ලාහ්ට ස්තුති වන්ත වීම.

3. අල්ලාහ්ගේ මගපෙන්වීම අනුව පැමිණි වක්තෘවරුන් වන මවුහු අල්ලාහ්ට කරනා වැඳුම්පිදුම් ගැනවූ නියම ස්වරූපය පහදා දී අල්ලාහ්ගේ දිව්‍යමය පණිවුඩය ලබාදී කරුණු පහදා දුන් නිසා ඒ රසූල්වරු කෙරෙහි ආදරය ගෞරවය සහ අනුමත කළ ආකාරයෙන් ප්‍රශංසා කිරීම.

නමුදු දුස්සාධ (මුරණ්ඩු) අය මිනිසෙකු වක්තෘවරයෙකු ලෙස පැමිනිය නොහැකිය යනුවෙන් තමන් වෙත පැමිණි වක්තෘවරු ප්‍රතික්ෂේප කළහ. ඒ අමූලික මතය අල්කුර්ආනය මෙසේ හෙළා දකියි :

﴿ وَمَا مَنَعَ النَّاسَ أَن يُؤْمِنُواْ إِذْ جَاءهُمُ الْهُدَى إِلاَّ أَن قَالُواْ أَبَعَثَ اللّهُ بَشَرًا رَّسُولاً . قُل لَّوْ كَانَ فِي الأَرْضِ مَلآئِكَةٌ يَمْشُونَ مُطْمَئِنِّينَ لَنَزَّلْنَا عَلَيْهِم مِّنَ السَّمَاء مَلَكًا رَّسُولاً ﴾

*මිනිසුනට සෘජු මගෙහි පණිවුඩය පැමිණ කළ, අල්ලාහ් (නම) දූතයා ලෙස එවා ඇත්තේ මිනිසෙක්ද යනුවෙන් පැව සීම හැර මවුන් සත්‍යය විශ්වාස කිරීම කෙරෙහි, අන්කිසි වක් නොවළක්විය. (එයට) පවසනු, 'මහපොළොවෙහි සුරදූතයන් (ජීවත්) වී (එහි) මවුන් නිදහසේ ඇවිදින්නේ නම්, සැබැවින්ම අප අහසෙන් සුරදූතයෙකුම වක්තෘ යෙකු ලෙස එවා ඇත්තෙමු.'* (අල්කුර්ආන් 17 : 94-95)

මහපොළොවෙහි ජීවත්වන්නේ මිනිසුන් හෙයින් මවුන් වෙත වක්තෘවරයෙකු ලෙස ඉදිරිපත් කරන්නේද මිනිසෙකි. ඒ හැර මහපොළොවෙහි ජීවත්වන්නේ සුරදූතයන් නම් මවුන් වෙත ඉදිරිපත් කළ යුත්තේද සුරදූතයන් විනා අන් කෙනෙකු නොව. මෙසේ විෂම පරිකල්පයෙන් වක්තෘවරු ප්‍රතික්ෂේප කළ අය ගැන සුද්ධවූ අල්කුර්ආනය මෙසේ සඳහන් කරයි:

﴿قالوا إن أنتم إلا بشر مثلنا تريدون أن تصدونا عما كان يعبد آباؤنا فأتونا بسلطان مبين. قالت لهم رسلهم إن نحن إلا بشر مثلكم ولكن الله يمن على من يشآء من عباده وما كان لنا أن نأتيكم بسلطان إلا بإذن الله﴾

*එයට ඒ සමාජයේ අය 'ඔබද අප වැනි මිනිසෙකු හැර අන් කෙනෙකු නොව. අප පියවරුන් වැඳුම්පිදුම් කළ දෙයින් වළක්වීමට ඔබ බලාපොරොත්තු වනවාද? එසේ නම් පැහැදිලි අණබලයක් අප වෙත ගෙනෙන්න' යනුවෙන් පැවසූහ. එයට පිළිතුරු වශයෙන් ඒ වක්තෘ වරු 'සැබැවින්ම අපද ඔබ වැනි සාමාන්‍යය අයවූ නමුදු අල්ලාහ් තම කැමැත්ත ප්‍රකාර තම අතවැසියන් හට තම අනුග්‍රහය දක්වන්නේය. අප ඔබ වෙත සාධකයක්*

ගෙන ඒම අල්ලාහ්ගේ අනුදැනුම මත හැර අප හට කිසිදු ශක්තියක් නැත' යනුවෙන් පැවසූහ.

(අල්කුර්ආන් 14 : 10 -11)

❀❀❀

## පරමාත්ත දිනය කෙරෙහි විශ්වාසය

පරමාත්ත දිනය යනු මෙලොව ජීවත්වූ සියලූ දෙනා නැවත පන පොවා නැගිටවා ඔවුන් මෙලොව ජීවිතයෙහි කළ කුසල් සහ අකුසල් කර්මයන් අනුව ප්‍රසාධ සහ අඩුවම නියම කරන දිනය වේ. මෙම දිනයට පරමාත්ත දිනය යනුවෙන් කීමට හේතුව: මෙයට පසු මහ පොලොවෙහි වෙනත් දිනයක් නොවන අතර එදින පැවැත්වෙන මහා විමසුමෙන් පසු ස්වර්ගයට තීන්දුවූ අය ස්වර්ගයෙහිද නිරයට තීන්දුවූ අය නිරයෙහිද සදාතනව පසුවන්නෝය.

පරමාත්ත දිනය කෙරෙහි විශ්වාස කිරීම කරුණු තුනක් මත රඳා පවතී.

1. <u>මියගිය සෑම ජීවයක්ම නැවත පනපොවා පෙර පරිදි මලවුන්ගෙන් නැගිටවීම.</u>

සූර් නම් කාහලය දෙවන වර පිඹිණු ලබනු කළ මල ආත්මයන් සියල්ල නැවත සජීවි වී පාවහන් නොමැතිව, නිර්වස්ත්‍රව සහ චර්මඡේදනය නොවූ අය ලෙස අල්ලාහ් ඉදිරියෙහි පැමිණෙනු ඇත. මේ සම්බන්ධව ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿كما بدأنا أول خلق نعيده وعدا علينا إنا كنا فاعلين﴾

*අප පළමුව නිර්මාණය ඇරඹුවාක් මෙන් නැවත නිර්මාණය කරමු. මෙය අප කෙරෙහිවූ ඒකාන්ත පොරොන්දුව වේ. සැබැවින්ම අප (එය) ඉෂ්ට කරන අය වෙමු.* (අල්කුර්ආන් 21 : 104)

පරමාන්ත දිනයේ මළ අය භට පත පොවා නැවත නැගිටවීම, ඉස්ලාමීය මූලික ප්‍රභාවයන් දෙක වන අල්කුර්ආනය සහ සුන්නා සංකල්පය මගින් ඉදිරිපත් කළ සහ මුස්ලිම් විද්වතුන්ගේ ඒකමතික තීරණය වෙ.

පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ثم إنكم بعد ذلك لميتون . ثم إنكم يوم القيامة تبعثون﴾

*(මනුෂ්‍යයනි,) පසුව සැබැවින්ම ඔබ මියයනු ඇත. පසුව අවසන් දිනයේ සැබැවින්ම (පනපොවා) ඔබ නැවත නැගිටවනු ඇත.* (අල්කුර්ආන් 23 : 15-16)

මුහම්මද් තුමා මෙසේ පැවසූහ:

يحشر الناس يوم القيامة حفاة غرلا.

පරමාන්ත දිනයේ ජනයන් පාවහන් නොමැතිව සහ චර්මඡේදනය නොමැතිව එක්තැන් කරනු ලබනු ඇත. (ග්‍රන්ථ : බුහාරි සහ මුස්ලිම්)

පරමාන්ත දිනයේ පැවැත්ම ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයක් බව සමස්ත මුස්ලිම්වරුන්ගේ නිගමණය වෙ. ප්‍රඥාවද එය සනාථ කරයි. අල්ලාහ් මිනිසාගේ මෙලොව ජීවිතයේ ක්‍රියාවන් වෙනුවෙන් ප්‍රතිවිපාක උදෙසා එලොවක්ද සකසා තිබිය යුතුය. සර්ව බලධාරිවූ අල්ලාහ් තම දූතයන් මගින් මිනිසා භට අනිවාර්යය කළාවූ වගකීම් සහ යුතුකම් මත එදින ඵලවිපාක ලබා දිය යුතු බව ප්‍රඥාවද හඟවයි.

මේ කරුණ අළලා අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ أفحسبتم أنما خلقناكم عبثا وإنكم إلينا لا ترجعون ﴾

*අප ඔබ නිකමින් නිර්මාණය කළ බවත්, ඔබ නැවත අප වෙත නොහැරෙන බවත් ඔබ සිතා සිටියෙහිද?*
(අල්කුර්ආන් 23 : 115)

අල්ලාහ් පරිශුද්ධවූ අල්කුර්ආනයේ තවත් තැනක මුහම්මද් තුමා ගැන මෙසේ සඳහන් කරයි:

﴿إن الذي فرض عليك القرآن لرآدك إلى معاد﴾

*(නබි තුමනි,) සැබැවින්ම ඔබ කෙරෙහි මේ කුර්ආනය පහළ කළ දෙවියා ඔබ ආපසු හැරෙනා තැන වෙතද ගෙනෙන්නේය.* (අල්කුර්ආන් 28 : 85)

## 2. අවසාන විමසීම සහ විපාක කෙරෙහි විශ්වාසය

මිනිසා සසර කළ ක්‍රියාවන් ගැන විමසා ඒ වෙනුවෙන් ප්‍රසාද හෝ අඩුවම් හෝ ලබනු ඇත. ශුද්ධවූ අල්කුර්ආනය සහ මුහම්මද් තුමාගේ සුන්නා සංකල්පය මෙම කරුණ පැහැදිලිව විස්තර කරන අතර මුස්ලිම්වරුන්ගේ ඒකමතික තීරණයද එය වේ.

ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿إن إلينا إيابهم . ثم إن علينا حسابهم﴾

*සැබැවින්ම ඔවුන්ගේ හැරීම අප වෙතය. පසුව සැබැවින්ම (ඵලවිපාක විඳිය යුතු) ප්‍රශ්ණ කිරීමද අප වෙතය.* (අල්කුර්ආන් 88 : 25-26)

ඔවුන්ගේ විපාකය ගැන අල්කුර්ආනය මෙසේද පවසයි:

﴿من جاء بالحسنة فله عشر أمثالها. ومن جاء بالسيئة فلا يجزى إلا مثلها وهم لا يظلمون﴾

යමෙකු හොඳක් රැගෙන ආව හොත්, ඔහුට එවැනි දස ගුණයක් වේ. යමෙකු නරකක් රැගෙන ආවහොත් ඔහුට එවැන්නක් හැර (අමතර) කිසිවක් නොදෙනු ඇත. ඔවුන්ට කිසිදු අසාධාරනයක් නොකරනු ඇත.

(අල්කුර්ආන් 6 : 160)

තවද ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ونضع الموازين القسط ليوم القيامة فلا تظلم نفس شيئا وإن كـان مثقـال حبة من خردل أتينا بها وكفى بنا حاسبين﴾

තවද, පරමාන්ත දිනයේ යුක්ති සාධාරණ තුලාවන් පිහිටුවා ඇත්තෙමු. කිසිදු ආත්මයකට සුළුවෙන් හෝ අයුක්තියක් සිදු නොවෙනු ඇත. අබ ඇටයක් බරක් තරම් වුවද, එයද (විනිශ්චය සඳහා) ඉදිරිපත් කරමු. ගණන් ගැනීමෙහිලා අපම සෑහේ. (ගණන් ගැනීමෙහිලා අන් කෙනෙකුගේ උදවුවක් නුවුවමනාය. අපම ප්‍රමාණවත්ය.)

(අල්කුර්ආන් 21 : 47)

මුහම්මද් තුමා දෙසූ බව ඉබ්නු උමර් තුමා මෙසේ පැවසූහ. පරමාන්ත දිනයේ විශ්වාසවන්තයෙකු අල්ලාහ් ඉදිරියට පමුණුවනු ඇත. අල්ලාහ් තම කරුණාව ඔහු වෙත හෙළා හෙතෙම කළ අසවල් පාපය ගැන දන්නවා දැයි විමසනු ඇත. එයට ඔහු 'එසේය අධිපතිය' යනුවෙන් පවසනු ඇත. හෙතෙම තම පාපයන් පිළිගෙන තම විනාශය ගැන පසුතැවිලි වෙද්දී අල්ලාහ් මෙසේ පවසනු ඇත. 'මෙම පාපයන් එලොවෙහිම මම වෙතින් ඉවත් කළෙමි. අද දින මාගේ සමාව මම වෙත පුදමි'. පසුව හෙතෙම තම කුසල් කර්මයන්හී වාර්තාව ලබා ගනු ඇත.

තමුදු ප්‍රතික්ෂේප කරන්නන් හා කුහකයන් අමතා අල්ලාහ් රැස්ව සිටින්නන් ඉදිරියෙහි මෙසේ පවසනු ඇත. 'අල්ලාහ් කෙරෙහි බොරු ගොතා පැවසූ අය මේ අය වේ. අපරාධකරුවන් කෙරෙහි අල්ලාහ්ගේ සාපය ඇති වේවා!' (බුහාරි සහ මුස්ලිම්)

තවද මුහම්මද් තුමා මෙසේ දෙසූහ:

යමෙකු යහපත් කර්මයන් උදෙසා එය පමණක් කළේ නම් අල්ලාහ් ඒ සඳහා තම පුස්තකයෙහි එවැනි දස ගුණයක්, හත්සිය ගුණයක්, තවද එයට වැඩි ගුණයක් සඳහන් කරන්නේය. යමෙකු අයහපත් කර්මයක් උදෙසා කළේ නම් එය එක් අකුසලක් ලෙස පමණක් සටහන් කර ගන්නේය.

පරමාන්ත දිනයේ කෙනෙකුගේ ක්‍රියාදාමය අනුව විනිශ්චයක් පවත්වනු ලබනු ඇත යන්න ප්‍රඥාව අනුවද, මුස්ලිම්වරුන්ගේද නිගමනය වේ.

අල්ලාහ් වක්තෘවරුන් පත්කර මවුන් මගින් ආගම ඉදිරිපත් කර ඒ ආගම පිළිපදිනා ලෙස තම අතවැසියන් හට නියෝග කර එය ප්‍රතික්ෂේප කරන අය හා පිහාද් කරන ලෙස පණවා ඇත. මිනිසාගේ ක්‍රියාවන් වෙනුවෙන් සාධාරණ ඵලවිපාකයක් නොවන්නට ඉහත සඳහන් නියෝගයන් ගෙන් කුමණ ඵලක්ද? සර්වඥානවූ අල්ලාහ් නුවුවමනා දේ කිරීමෙන් සුද්ධවන්තයා වේ.

ශුද්ධවූ අල්කුර්ආන් වැකිය එය මෙසේ සනාථ කරයි:

﴿فلنقصن عليهم بعلم وما كنا غائبين﴾

*(මවුන්ගේ ක්‍රියාවන් ගැන අප) දැනුවත්ව (විපාක සමයේ) සැබැවින්ම අප ඒවා මවුන්ට විස්තර කරමු. තවද අප (මවුන්ගෙන්) ඉවත්වූනු අය ලෙස නොසිටිමු.*

(අල්කුර්ආන් 7 : 6-7)

### 3. ස්වර්ගය හා නිරය කෙරෙහි විශ්වාසය.

අල්ලාහ්ගේ නිර්මාණයන් වන මිනිසුන් අවසාන වශයෙන් සේන්දු විය යුතු ස්ථානයන් ස්වර්ගය සහ නිරය වේ. ස්වර්ගය යනු අල්ලාහ්ගේ ආඥාවන් නිසි ලෙස පිළිපැද අල්ලාහ්ගේ වක්තෘවරයාට කීකරු වී සත්‍ය පිළිගෙන ජීවත්වූ බියබැති විශ්වාසවන්තයින් සඳහා තිමවූ විස්තර කළ නොහැකි ඉතා සුඛෝපභෝගී අවසන් ස්ථානයක් වේ. එහිවූ ප්‍රසාධයන් සහ අනෙකුත් පහසුකම් කිසිදු ඇසක් නුදුටු, කිසිදු කණක් නොඇසූ, කිසි චිත්ත සන්තානයකට පහසුවෙන් වටහා ගත නොහැකි විස්තර කළ නොහැකි තරම් අපූරු ජනක වේ.

ස්වර්ගය ගැන ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿إن الذين آمنوا وعملوا الصالحات أولئك هم خير البرية . جزاؤهم عند ربهم جنات عدن تجري من تحتها الأنهار خالدين فيها أبدا رضي الله عنهم ورضوا عنه ذلك لمن خشي ربه﴾

*සැබැවින්ම නිර්මාණයන්හී උසස්ම නිර්මාණයන් විශ්වාස කර යහපත් දේ කරන්නන්ය. මවුන්ගේ (ප්‍රසාධ) දීමනාව මවුන්ගේ දෙවියා වෙතින් පිරිනමනා අද්න් නම් ස්ථිර ස්වර්ගයවේ. එහි යට සදා මනහර ගංගාවන් ගලා බසී. මවුහු එහි ස්ථිරව (රැඳී) සිටින්නෝය. මවුන් අල්ලාහ් කෙරෙහි ප්‍රිය වූහ. අල්ලාහ්ද මවුන් කෙරෙහි ප්‍රිය විය.*

*තම ආරක්ෂක (දෙවි)යා හට බියවන්නේ කවරෙක්ද, එය ඔවුන් හටය.* (අල්කුර්ආන් 98 : 7-8)

තවද අල්කුර්ආනය මෙසේ පවසයි :

﴿ فَلا تَعْلَمُ نَفْسٌ مَّا أُخْفِيَ لَهُم مِّن قُرَّةِ أَعْيُنٍ جَزَاء بِمَا كَانُوا يَعْمَلُونَ ﴾

*ඔවුන්ගේ ක්‍රියාවෙහි (සුවිසල්) විපාක සඳහා දෙනුවන් පිනවන තරම් ප්‍රමුදිත දේ සඟවා ඇත්දැයි කිසිවෙකු නොදනී.* (අල්කුර්ආන් 32 : 17)

නිරය යනු විස්තර කළ නොහැකි, නොනිමි වේදනා සහ දඬුවම් සහිත අතිමහත් අගාධයකි. අල්ලාහ් සහ වක්තෘවරු ප්‍රතික්ෂේප කරමින්, පාපයෙහි නිරත වෙමින් නොමග ගිය අය වෙනුවෙන් එය නිමවී ඇත. විස්තර කළ නොහැකි, චින්තනයට නොවැටහෙන නානාවිධ දඬුවම් හා වේදනාවන් එහි පිළියෙල කර ඇත.

නිරය ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

﴿وَاتَّقُواْ النَّارَ الَّتِي أُعِدَّتْ لِلْكَافِرِينَ ﴾

*(දෙවිඳුගේ ආඥාවන්) ප්‍රතික්ෂේප කරන්නන් වෙනුවෙන් සකස්කර ඇති නිරයේ ගින්නට බියවව.*

(අල්කුර්ආන් 3 : 131)

තවද අල්කුර්ආනය මෙසේ පවසයි :

﴿وَقُلِ الْحَقُّ مِن رَّبِّكُمْ فَمَن شَاء فَلْيُؤْمِن وَمَن شَاء فَلْيَكْفُرْ إِنَّا أَعْتَدْنَا لِلظَّالِمِينَ نَارًا أَحَاطَ بِهِمْ سُرَادِقُهَا وَإِن يَسْتَغِيثُوا يُغَاثُوا بِمَاء كَالْمُهْلِ يَشْوِي الْوُجُوهَ بِئْسَ الشَّرَابُ وَسَاءتْ مُرْتَفَقًا ﴾

(නබි තුමනි) 'ඔබගේ දෙවියාගෙන් (මා ගෙනා) මේ දහම සත්‍ය එකකි. ප්‍රිය වන්නේ කවරෙක්ද හෙතෙම විශ්වාස කරපුදෙන්. තවද කැමති අය ප්‍රතික්ෂේප කරපු දෙන්' යි පවසනු මැනව. සැබැවින්ම ප්‍රතික්ෂේප කරනා අපරාධකරු වන් වෙනුවෙන් අප නිරයේ ගින්න සකස්කර ඇත්තෙමු. ඒ නිරයේ ගිනි ප්‍රකාරයන් මවුන් වටකර ගනු ඇත. එහි මවුන්(ගේ පිපාසය සඳහා ජලය ඉල්ලා) උදවු පැතු කල උතුරන ලොදිය වැනි දියරයක් මගින් මවුන්ට උදව් දෙනු ලබනු ඇත. එය මවුන්ගේ මුහුණ පුලුස්සා අකුලා දමනු ඇත. පානයන් අතරින් එය අතිමහත් නපුරුය. මවුන් සේන්දු වන ඒ ස්ථානය ඉතා නපුරු වේ. (18 : 29)

තවද ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿إن الله لعن الكافرين وأعد لهم سعيرا. خالدين فيها أبدا لا يجدون وليا ولا نصيرا . يوم تقلب وجوههم فى النار يقولون يليتنا أطعنا الله وأطعنا الرسولا﴾

සැබැවින්ම අල්ලාහ් කාෆිර්වරුන් හට සාප කර ඇත. තවද අල්ලාහ් මවුන් වෙනුවෙන් ජ්වලිත ගින්න පිළියෙළ කර ඇත. මවුන් එහි සදා නිරත වනු ඇත. (මවුන් හට) එහි ආරක්ෂා කරන්නන් හෝ උදව් කරන්නන් හෝ නොවන්නෝය. මවුන්ගේ මුහුණු ඒ නිරයේ ගින්නෙහි පෙරලා අකුල්ලන දිනයේ 'අප අල්ලාහ්ට සහ මහුගේ වක්තෘවරයා හට කීකරුව තිබිය යුතු නොවේද?' යනුවෙන් කාෆිර්වරු (දුක්බිතව) පවසනු ඇත.

(අල්කුර්ආන් 33 : 64-65)

මරණින් මතුව සිදුවිය හැකි සියලු දේ කෙරෙහි විශ්වාස කිරීම පරමාන්ත දිනයෙහි විශ්වාස කිරීමෙහිලා රැඳේ.

## 1. මිනීවලෙහි (ෆිත්නා) සත්තාපය:

ජීවිතක්ෂයට පත්වූ අය භූමදානයෙන් පසු (නිමේෂයකින් මිනිය වෙත පැමිණෙන මලාඉකාවරු දෙන්නා) මහුගේ දෙවියා, වක්තෘ සහ ආගම වැනි දේ ගැන විමසනු ලබනු ඇත. සසර වසන කළ දේව විශ්වාසයෙන් යුතුව බැතියුත්ව ජීවත්වූ අය අල්ලාහ් ස්ථිරතාවයකට පත්කරනු කළ 'මාගේ දෙවියා අල්ලාහ්, මාගේ ආගම ඉස්ලාම් මාගේ වක්තෘවරයා මුහම්මද් නබි' යනුවෙන් උත්තර සපයනු ඇත. නමුදු මිසදිටුවන් ලෙස නැසී ගිය අය ඒ ප්‍රශ්නයන් හට උත්තර දීමට නොහැකිව 'ආහ්, ආහ්, මම නොදනිමි' යනුවෙන් පවසනු ඇත. මුනාෆික් (කුහක) අය 'මිනිසුන් යම් යම් දේ කියනු අසා මාද එසේ කීවෙමි' යනුවෙන් පවසනු ඇත.

## 2. මිනිවලෙහි වේදනාව සහ අනුග්‍රහය:

අල්ලාහ්ගේ ආඥාවන් ප්‍රතික්ෂේප කරමින් සසර ජීවත්වූ අය හට සහ මුනාෆික්වරු (කුහකයන්) හට මිනිවලෙහි රළු වේදනාව සකස් කර ඇත.

කුහකයන් ගැන ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ولو ترى إذ الظـالمون في غمـرات المـوت والملائكـة باسطـوا أيديهـم أخرجوا أنفسكم اليوم تجزون عـذاب الهـون بمـا كنتـم تقولـون علـى اللـه غير الحق وكنتم عن آياته تستكبرون﴾

*මෙම අපරාධකරුවන් මරනාසන්නව පසුවන මොහොත ඔබ දකී නම් සුර දූතයන් තම අත් දික්කර '(ඔබගේ) පණනල පිටමං කරව, ඔබලා අල්ලාහ්ගේ නාමයෙන්*

*බොරු ගොතා පැවසීමෙන් සහ ඔහුගේ සාධකයන් උඩඟු ලෙස ප්‍රතික්ෂේප කරමින් සිටිය හෙයින් අද දින මෙම නින්දා සහගත වේදනාව විපාක ලෙස විඳවව්' (යනුවෙන් පවසනු ඇත).* (අල්කුර්ආන් 6 : 93)

තවද උඩඟු ලෙස අල්ලාහ්ගේ සාධකයන් ප්‍රතික්ෂේප කළ ෆිර්අවුන්ගේ ජනයන් ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿النار يعرضون عليها غدوا وعشيا ويوم تقوم الساعة أدخلوا آل فرعون أشد العذاب﴾

*(ෆිර්අවුන්ගේ ජනයන්) උදේ සහ සවස නිරයේ ගින්න වෙත ඉදිරිපත් කරනු ලබනු ඇත. තවද පරමාන්ත දිනය එළඹූ කළ 'ෆිර්අවුන්ගේ ජනයන් ඉතා රඑ වේදනාවට පමුණුවන්න' (යනුවෙන් පවසනු ඇත).* (40 : 46)

මුහම්මද් තුමා දෙසූ බව සෙයිද් බින් තාබිත් තුමා මෙසේ පැවසූහ:

'ඔබ වැළලී යෑම කෙරෙහි බියක් නොවී නම්, මිනිවලෙහි වේදනාව ඔබද දැනගැනීම පිණිස අල්ලාහ්ගෙන් මම ප්‍රාර්ථනා කර ඇත්තෙමි'. පසුව අප දෙස හැරී අප අමතා 'නිරයේ වේදනාවෙන් ආරක්ෂා පතන්න' යනුවෙන් එතුමා කී කළ 'නිරයේ වේදනාවෙන් ආරක්ෂා පතන්නෙමු' යනුවෙන් යහළුවන් පැවසූහ. පසුව නබි තුමා 'මිනිවලේ වේදනාවෙන් අල්ලාහ්ගෙන් ආරක්ෂා පතන්න' යනුවෙන් පැවසූ කළ 'එසේම මිනිවලේ වේදනා වෙන් ආරක්ෂා පතන් නෙමු' යනුවෙන් යහළුවන් පැවසූහ. නැවත නබි තුමා 'අභ්‍යන්තර හා බාහිර සියලු කරදර වලින් ආරක්ෂා පතන්න' යනුවෙන් පැවසූ කළ 'එසේම සියලු අභ්‍යන්තර හා බාහිර කරදරවලින් ආරක්ෂා පතන්නෙමු' යනුවෙන්

යහළුවන් පැවසූහ. පසුව නබි තුමා 'දජ්ජාල්ගේ උවදුරෙන් ආරක්ෂා පතාන්න' යනුවෙන් පැවසූ කළ දජ්ජාල්ගේ උවදුරෙන් ආරක්ෂා පතන්නෙමු' යනුවෙන් පැවසූහ.

(ග්‍රන්ථය : මුස්ලිම්)

මිනිවලෙහි ප්‍රීතිය හා සැනසිල්ල විශ්වාසදායී සත්‍යවන්තයන් හට පමණි.

ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿إن الذين قالوا ربنا الله ثم استقاموا تتنزل عليهم الملائكة ألا تخافوا ولا تحزنوا وأبشروا بالجنة التي كنتم توعدون﴾

*අපගේ දෙවියා අල්ලාහ් යනුවෙන් පවසා (ඒ මත) ස්ථිර වූ අය කෙරෙහි සැබැවින්ම (මැරෙණ මොහොතේ) සුරදූත යන් බැස (ඔබ පිටත්වීමට සූදානම් එලොව කෙරෙහි) බිය නොවව්. තවද, (ඔබ මෙලොව හැර යන සේසත් සහ නෑහිතමිතුරන් කෙරෙහි) දුක් නොවව්. ඔබට පොරොන්දු වූ සුවර්ගයේ සුභාරංචිය කෙරෙහි ප්‍රීතිවව් (යනුවෙන් පවසන්නෝය).*

(අල්කුර්ආන් 41 : 30)

තවද ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿فلولا إذا بلغت الحلقوم . وأنتم حينئذ تنظرون . ونحن أقرب إليه منكم ولكن لا تبصرون . فلولا إن كنتم غير مدينين . ترجعونها إن كنتم صادقين . فأما إن كان من المقربين . فروح وريحان وجنة نعيم .﴾

*(ඔබගෙන් මැරෙනා අයෙකුගේ ප්‍රාණය) එය උගුරදණ්ඩ වෙත ළඟා වනු ඔබ දකින්නේ නම්, (ඔහුගේ සකරාත් -මරණාසන්න මොහොතේ) අප ඔහුට ඉතා සමීපස්තව සිටිමු. නමුදු ඔබ කිසිවෙකු එය නොදකිනු ඇත. ඔබ*

(කිසිවෙකුගේ) ආධිපත්‍යයට යටත් නොවේ නම්, ඔබ සත්‍ය වන්ත නම් ඔහුගේ ප්‍රාණය මුදවා ගත හැකි නොවේද? එහෙයින් හෙතෙම (අල්ලාහ්ගේ) හිතවතෙකු නම් (ඔහු වෙනුවෙන්) විවේකය, අගනා සැපයීම සහ අනුග්‍රහය සහිත ස්වර්ගයද පිළියෙල කර ඇත. (56 : 83-89)

මුහම්මද් තුමා දෙසූ බව අල්බරාඋ බින් ආසිබ් (රලි) තුමා හෙළි කළහ: විශ්වාසවන්ත මවුහු මිනිවළෙහි සුරදූතයන් දෙන්නාගේ ප්‍රශ්නයන් හට උත්තර සපයන කළ අහසෙහි සිට (අල්ලාහ් වෙනුවෙන් හඬ දෙන්නෙකු)'මාගේ අනවැසියා සත්‍යය පැවසුවේය. ඔහු වෙනුවෙන් පාවාඩ එළන්න. ස්වර්ගයේ ඇඳුම් අන්දවන්න. ස්වර්ගයට පිවිසීම සඳහා දොර විවෘත කරන්න' යනුවෙන් පවසනු ඇත. ස්වර්ගයේ (ආවේණික) සුගන්ධය සහ මනනන්දනීය සුවඳ ඔහු වෙත වනු ඇත. ඔහුගේ දෑසනට පෙනෙන දුරතෙක් ඔහුගේ මිනිවළ විශාල වනු ඇත. (ග්‍රන්ථ : අහ්මද් සහ අබුදාවුද්)

පරමාන්ත දිනය කෙරෙහි විශ්වාස කිරීමෙන් ඇතිවන ප්‍රයෝජන:

1. එළඹීමට නියමිත යුගාන්ත දිනයේ ප්‍රසාධය කෙරෙහි බලාපොරොත්තු තබා කුසල් කර්මයන් කිරීමට උනන්දුවක් ඇතිවීම.

2. එදින පමුණුවීමට හැකි අඩුවම් කෙරෙහිවූ බිය නිසා අකුසල් කර්මයන් කිරීමට බියවීම.

3. විශ්වාසවන්තයන් හට මිහිපිට සම්පත් හෝ පහසුකම් හෝ නොලැබුනද, ඒ වෙනුවෙන් පරමාන්ත දිනයේ ලැබීමට හැකි ප්‍රසාධ උදෙසා ජීවිතයේ දුක් දොම්නස් ඉවසා සිටීම.

මිනිසා මිය යැමෙන් පසු පරමාන්ත දිනයේ නැවත පනපොවා නැගිටවීමක් සිදුවිය නොහැකියැයි කාෆිර්වරු ප්‍රතික්ෂේප කරති. ඒ මතය මුලුමනින්ම වැරදි බව ආගම් හැඟීම් සහ බුද්ධිය මගින් සාධක අපමණය.

**ආගමික සාධක :**

ඒ කරුණ ගැන අල්කුර්ආනය මෙසේ පවසයි :

﴿زَعَمَ الَّذِينَ كَفَرُوا أَن لَّن يُبْعَثُوا قُلْ بَلَى وَرَبِّي لَتُبْعَثُنَّ ثُمَّ لَتُنَبَّؤُنَّ بِمَا عَمِلْتُمْ وَذَلِكَ عَلَى اللَّهِ يَسِيرٌ﴾

*(සැබැවින්ම මරණයෙන් පසු පනපොවා ආපසු) ඔවුන් නොනැගිටවනු ඇතැයි කාෆිර්වරු සිතන්නෝය. (නබි තුමනි) පවසනු මැනවි, මාගේ දෙවිඳුගේ නාමයෙන්, සැබැවින්ම ඔබ නැවත නැගිටවනු ලබනු ඇත. පසුව ඔබ (මෙලොව) කළ දේ ගැන (ඔබට) දැනුම් දෙනු ලබනු ඇත. එසේ කිරීම අල්ලාහ්ට ඉතා පහසුය.*

(අල්කුර්ආන් 64 : 7)

සියලු දේවාගම් මෙම සත්‍ය තහවුරු කරන්නේය.

**හැඟීම් මගින් සාධක :**

මරණෙන් පසු ආපසු නැගිටවීම ගැන අල්ලාහ් මෙලොවෙහිම තම සමහර දැහැමි අතවැසියන් හට පෙන්වා දී ඇත. මේ සඳහා ශුද්ධවූ අල්කුර්ආන්හී දෙවැනි පරිච්ඡේදයේ උදාහරණ පහක් සඳහන් වේ.

1. මූසා නබි තුමාගේ සමාජයේ අය එතුමා වෙත පැමිණ තමන් අල්ලාහ් තම පියවි ඇසින් දකින තුරු එතුමාගේ වක්තෘත්වය පිළිගන්නට සූදානම් නැති බව පැවසූ කළ අල්ලාහ් ඔවුන් ක්ෂණික මරණයට පත් කළේය. ඒ ගැන ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ කරුණු පහදයි :

﴿ وَإِذْ قُلْتُمْ يَا مُوسَى لَن نُّؤْمِنَ لَكَ حَتَّى نَرَى اللَّـهَ جَهْـرَةً فَأَخَـذَتْكُمُ الصَّاعِقَةُ وَأَنتُمْ تَنظُرُونَ. ثُمَّ بَعَثْنَاكُم مِّن بَعْدِ مَوْتِكُمْ لَعَلَّكُمْ تَشْكُرُونَ ﴾

*'එම්බල මූසා, අප අල්ලාහ් අපගේ ඇසින් දකින තුරු ඔබව විශ්වාස නොකරමු' යනුවෙන් ඔබ පැවසූ අතර, ඒ අවස්ථාවේ නෙත් විදහා බලා සිටින ඔබට අකුණු සැර වදී ඔබ මැරුණු සිද්ධිය සිහිකරව. එසේ ඔබ මරුමුවට පත්වූ පසු ඔබලා කෘතඥා වනු වස් අප ඔබට නැවත ජීවය ලබා දුන්නෙමු.* (අල්කුර්ආන් 2 : 55-56)

2. මෙය රහසිගතව ඝාතන කරන ලද කෙනෙකුගේ පුවතක් හා සම්බන්ධ විස්තරයකි. මිනිමරුවා සොයා ගැනීමෙහිලා ඉස්රායෙල්වරු අතර මගභේද ඇති විය. එළදෙනෙකු මරා එයින් කොටසක් ගෙන මිනියට ගසන ලෙසද, එවිට මිනිය පණපෙවී මිනිමරුවා පෙන්වා දෙනු ඇත යනුවෙන්ද අල්ලාහ් නියෝග කළේය. ඒ ගැන අල්කුර්ආනය මෙසේ පවසයි :

﴿ وَإِذْ قَتَلْتُمْ نَفْساً فَادَّارَأْتُمْ فِيهَا وَاللّهُ مُخْرِجٌ مَّا كُنتُمْ تَكْتُمُـونَ . فَقُلْنَـا اضْرِبُوهُ بِبَعْضِهَا كَذَلِكَ يُحْيِي اللّهُ الْمَوْتَى وَيُرِيكُمْ آيَاتِهِ لَعَلَّكُمْ تَعْقِلُونَ ﴾

*තවද මෙම සිද්ධිය සිහිකරව. ඔබ මිනිසෙකු ඝාතනය කර එහි (මිනිමරුවා ගැන වූ රහස සඟවන්නට එකිනෙකා චෝදනා කරමින්) තර්ක කරමින් සිටි කළ (සිහිකරව). (එනමුදු) අල්ලාහ් ඔබ සැඟවූ දෙය එළි කරන්නට සමර්ථයාය. (කැප කළ) එළදෙනෙකුගේ (ශරීරයෙන් ගත්) කොටසක් ගෙන (මැරුම් කා මිනිසාගේ මළ සිරුරට) ගසන ලෙස අප අණ කළෙමු.*

*(එවිට ඔහු පණ පෙවී නැගිට අසුරෙන්ම) අල්ලාහ් මිය ගිය අයට පණ දෙන්නේය. තවද, ඔබ දැන ගැනීම පිණිස ඔහුගේ සාධකයන් ඔබට පෙන්වයි.*

(අල්කුර්ආන් 2 : 72-73)

3. මෙය මරණයට බියවී තම නිවස්වලින් නික්ම ගිය දහස් ගණන් ජනයන්ගේ ඉතිහාසයකි. අල්ලාහ් මවුන් මරණයට පත්කොට නැවත ජීවය ලබා දුන්නේය. ඒ සිද්ධිය ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

﴿ألم تر إلى الذين خرجوا من ديارهم وهم ألوف حذر الموت فقال لهم الله موتوا ثم أحياهم إن الله لذو فضل على الناس ولكن أكثر الناس لا يشكرون﴾

*මරණයට බියවී තම නිවෙස්වලින් පිටවී ගිය දහස් ගණන් වූ අය ගැන ඔබ දුටුවෙහිද? එබැවින් 'ඔබ මිය යනු'යි අල්ලාහ් මවුන්ට පැවසීය. අනතුරුව අල්ලාහ් මවුන්ට යළිත් ජීවය දුන්නේය. සැබැවින්ම අල්ලාහ් මිනිස් වර්ගයා හට ත්‍යාගශීලී වුවද මිනිසුන්ගෙන් බොහෝ අය ඔහු හට අකෘතඥය හ.* (අල්කුර්ආන් 2 : 243)

4. මෙය විනාශවී ගිය ගමක් හරහා ගමන් කළ කෙනෙකුගේ පුවතකි. මෙසේ විනාශ වී ගිය ගමක් අල්ලාහ් කෙසේ නැවත සජීවි කරන්නද යනුවෙන් ඔහු සුළු කොට නැකුහ. අල්ලාහ් ඔහු ජීවිතක්ෂයට පත්කොට අවුරුදු සියයක් පමණ එසේ තබා නැවත සජීවි කර නැගිටෙව්වේය. ඒ සිද්ධිය ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

*සම්පූර්ණයෙන්ම ගරා වැටී තිබුණු ගමක් හරහා ගමන් කළ අයෙකු එය දැක 'මෙය විනාශවූවායින් පසු අල්ලාහ්*

කෙසේ නැවත සජීවී කරයිද?' යනුවෙන් පැවසුවේය. එයට (මහුගේ සැකය දුරු කරනු වස්) අල්ලාහ් ඔහු ජීවිතක්ෂයට පත් කර සියවසක් තබා නැවත පණ පොවා 'ඔබ කොපමණ කලක් මෙසේ සිටියෙහිද?' යනුවෙන් විමසූ කල දවසක් හෝ එහි කොටසක් මෙසේ සිටියෙමි' යනුවෙන් උත්තර දුන්නේය. 'එසේ නොව. ඔබ මෙසේ සියවසක් සිටියෙහිය' යයි ඔහු (අල්ලාහ්) කීවේය. 'ඔබගේ ආහාරය සහ පානය දෙස බලව' ඒවා (කල් ගත වීමෙන්) නරක්වී නැත. ඔබගේ බූරුවා දෙස බලව. (එය ඇටසැකිල්ලක් වී ඇත). අප විසින් මෙසේ කරන ලද්දේ ජනතාවට ඔබ සාධකයක් බවට පත්කිරීම පිණිසය. (මෙසේ ඔබව පරීක්ෂණයට පත්කොට නැවත පන පොවා නැගිට වමු) දැන් අප (බූරුවාගේ) ඇටසැකිල්ල යාකොට පසුව මාංශ අන්දවා ජීවිතයට පත්කල අයුරු බලව' එසේ බලා සිටි ඔහු අල්ලාහ් සෑම දෙයක් කෙරෙහිම බලයක් ඇති බව මම දනිමි' යි කීවේය. (අල්කුර්ආන් 2 : 259)

5. මෙම උදාහරණය නබි ඉබ්රාහීම් තුමාගේ කාලය තුල සිදුවූ සිදුවීමකි. මල අය නැවත පණ පොවන අයුරු තමන් හට පෙන්වන ලෙස එතුමා අල්ලාහ්ගෙන් ඉල්ලා සිටියහ. එයට අල්ලාහ්, පක්ෂීන් සිව් දෙනෙකු අල්ලා ඒවා කැලිවලට කපා වෙන්කර අසල කඳුවල තබා අමතන ලෙසද, එවිට කැබැලි එක්වී පණ පෙවී පක්ෂීන් බවට පත්වී වහා පියාඹා ඔහු වෙත එනු ඇතැයිද කීවේය.

'මාගේ දෙවියනි, මල අය ඔබ නැවත පණ පොවන්නේ කෙසේ දැයි මා හට පෙන්වනු මැනව' යනුවෙන් ඉබ්රාහීම් විමසූ කල 'ඔබට මේ ගැන විශ්වාසයක් නැත්දැ'යි විමසුවේය. 'මම විශ්වාස කරමි දෙවියනි, නමුදු

*මගේ සිත පිනා යෑම පිණිසයි' යනුවෙන් එතුමා පැවසූහ. (එයට අල්ලාහ්) 'පක්ෂීන් සිව් දෙනෙකු අල්ලා ඒවා කපා කැබැලි කර එකෙකුගෙන් කැල්ලක් බැගින් එක් එක් කන්ද මත තබා අඬගසනා කළ ඒවා (පණ පෙවී) ඔබ වෙත වේගයෙන් එනු ඇත. අල්ලාහ් සර්ව බලසම්පන්න හා සර්වඥයා බව ඔබ දැන ගනු මැනව' යනුවෙන් පැවසීය.* (අල්කුර්ආන් 2 : 260)

මෙවා තේරුම් ගත හැකි සමහර උදාහරණයන් වේ. මරණයට පත්වූ අය නැවත පණ පෙවීමට අල්ලාහ්ට හැකිය යන්න මෙයින් ඔප්පු වේ. මල අය අල්ලාහ්ගේ අණ පරිදි නැවත පත පෙවීම සහ සොහොනෙන් පිට කිරීම කෙරෙහි අල්ලාහ් රසූල් නබි තුමාට බලය දුන් බව පෙර තැනක සඳහන් කළෙමු.

**ඥානය මගින් සාධක:**

අල්ලාහ් ඇති බවට සාධක කරුණු දෙකක් මත රැඳේ.

1. සැබැවින්ම අහස් සහ පොලොවෙහි නිර්මාතෘවරයා අල්ලාහ් වේ. කිසිවක් නොවී තිබුණු අවස්ථාවක ඒවා නිර්මාණය කිරීමට ශක්තියක් ඇති අල්ලාහ් හට, ඒවා විනාශ වීමෙන් පසු, ආපසු නිර්මාණය කිරීමටද කිසිදු අපහසුවක් නැත.

ඒ සම්බන්ධව ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿وهو الذي يبدأ الخلق ثم يعيده وهو أهون عليه﴾

*නිර්මාණයන් ප්‍රථමව උත්පාදනය කළේ ඔහුය. (විනාශ වීමෙන්) පසු නැවත නිර්මාණය කරන්නාද ඔහු වේ. එය ඔහු (අල්ලාහ්)ට ඉතා පහසුය.* (අල්කුර්ආන් 30 : 27)

තවත් ශුද්ධවූ අල්කුර්ආන් වැකියක් මෙසේ සඳහන් වේ:

﴿ كما بدأنا أول خلق نعيده وعدا علينا إنا كنا فاعلين ﴾

*අප මුල් නිර්මාණය ආරම්භ කළ සේම නැවත නිර්මාණය කරමු. මෙය අප කෙරෙහිවූ දිවුරුමකි. සැබැවින්ම අප එය ඉෂ්ට කරනා අය වෙමු.*

(අල්කුර්ආන් 21 : 104)

ඇටසැකිලි දිරාපත්වූ පසු ඒවාට නැවත ජීවය ලබාදීම ගැන ප්‍රතික්ෂේප කරන්නන් හට පිළිතුරු දෙන තවත් වැකියක් ශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

﴿قل يحييها الذى أنشأها أول مرة وهو بكل خلق عليم﴾

*(නබිතුමනි) පවසන්න, ඒවා මුළින් නිර්මාණය කළේ කවරෙක්ද, නැවත නිර්මාණය කරන්නේද ඔහුය. ඔහු සියළු නිර්මාණයන්හී ඥානය ඇත්තා වේ.*

(අල්කුර්ආන් 36 : 79)

2. සමහර අවස්ථාවන්හිදී මහපොළොව වියළී නිසරු බිමක් වන්නේය. කලකට පසු වර්ෂාව ලැබීමෙන් එය සශ්‍රිකවී විවිධ වෘක්ෂලතාදීන් හට ගෙන එම පොලොව කොළ පැහැ ගැන්වේ. වියළී මැරී ගිය මහපොළොව පණ ගන්වන අල්ලාහ් මිය ගිය මිනිසාට පන ගැන්වීම සාධාරණ දෙයකි.

ඒ කරුණ සම්බන්ධව ශුද්ධවූ අල්කුර්ආන්හී වාක්‍යයක් මෙසේ විස්තර කරයි:

﴿ومن آياته أنك ترى الأرض خاشعة فإذا أنزلنا عليه الماء اهتزت وربت إن الذى أحياها لمحيي الموتى إنه على كل شيء قدير﴾

*(තබිතුමති) මහපොළොව නිසරුව ඔබ දැකීමද සාධක යත් අතරින් වේ. ඒ මත (වැසි) ජලය වර්ෂා කරනා කළ එය සරුවී (වෘක්ෂලතාදීන්) හට ගන්නේය. සැබැවින්ම මෙසේ නිසරු (දේ) ප්‍රාණවත් කළ තැනැත්තා මළ අයද ආපසු පණ පෙවීමට හැකියාව ඇත්තෙකි. සැබැවින්ම ඔහු සියළු දේ කෙරෙහි බලය ඇත්තා වේ.*

(අල්කුර්ආන් 41 : 39)

තවද ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ونزلنا من السماء ماء مباركا فانبتنا به جنات وحب الحصيد . والنخل بسقات لها طلع نضيد . رزقا للعباد وأحينا به بلدة ميتا كذلك الخروج ﴾

*අප අහසෙන් ඉතා සුබිත (වැසි) ජලය පහළ කොට, ඒ මගින් දැකුම්කළු උයන් සහ (අස්වැන්න නෙළා ගන්නා) ධාන්‍යයන්ද නිෂ්පාදනය කෙළෙමු. තවද (ඒ ජලය මගින්) දිග පත් සහිත පොකුරු ඇති ඉඳිගස් වර්ගයන්ද හට ගන්නට සැළැස්වීමු. (එය අප) අතවැසියන් හට ආහාරය (කෙළෙමු), තවද, නිසරු බිම අප සාරවත් කළෙමු. (මළ අය නැවත සජීවී වී) පිටවීම සිදුවන්නේද මෙලෙසය.*

(අල්කුර්ආන් 50 : 9-11)

සමහර වලන බුද්ධිකයන් මිනිවලෙහි ඇතිවිය හැකි අඩුවම් සහ ප්‍රසාධ ප්‍රතික්ෂේප කරති. 'යථාර්ථයේ එසේ සිදුවිය නොහැකියැයි තීරණය කරති. ආදාහනයෙන් පසු වළ ආපසු හාරා බැලීනම් මෘදුදේහය එහි එසේම තිබෙනු ඇත' යනුවෙන්ද පවසනු අප අනන්තව අසා ඇත්තෙමු. එසේ නොව. ආගම, හැඟීම සහ බුද්ධිය අනුව එය වැරදි නිගමණයකි.

**ආගමෙන් සාධක:**

පරමාන්ත දිනය කෙරෙහි විශ්වාස කිරීම යටතෙහි මිනි වළෙහි වේදනාව සහ සන්තාපය ගැනද අප පෙර සමහර අල්කුර්ආන් වාක්‍යයන් මගින් විස්තර කර ඇත්තෙමු.

خرج النبي مع بعض الحيطان المدينة ، فسمع صوت إنسانين يعذبان في قبرهما، أن أحدهما كان لايستتر من البول ، وأن الآخر كان يمشي بالنميمة.

ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ පැවසූහ: නබි තුමා මදීනාවෙහි වූ (මිනි වළලා තිබුණු) උයනකින් පිටවෙමින් සිටිනා කළ මිනිවළෙහි වේදනාවට භාජනය වෙමින් වූ දෙදෙනෙකුගේ හඬ ඇසූහ. එයින් කෙනෙකු තම මූත්‍රා හරියාකාරව පිරිසිදු නොකළ අයෙකු වේ. අනෙකා කේලම් කියමින් ඇවිද කෙනෙකු වේ. (ග්‍රන්ථය : බුහාරි)

**හැඟීම මගින් සාධක.**

නින්දෙහි පසුවන කෙනෙකු තමා ඉතා සුඛෝපභෝගී තැනක පසුවන අයුරු හෝ ඉතා කරදර සහිත ස්ථානයක සිටින අයුරු හෝ සිහින දකී. වහා නින්දෙන් අවදි වන හෙතෙම තමා තම නිදි යහනෙහි පසුවන බව වටහා ගෙන මෙතෙක් තමා සිටියේ සිහින අවස්ථාවක බව අවබෝධ කර ගනී. නින්ද මරණයෙහි සහෝදරයා වේ. එහෙයින් අල්ලාහ් මරණය 'වෆාත්' යනුවෙන් අල්කුර්ආනයේ සඳහන්වේ.

ඒ කරුණු විස්තර කරණු වස් ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ الله يتوفى الأنفس حين موتها والتى لم تمت فى منامها فيمسك التي قضى عليها الموت ويرسل الأخرى إلى أجل مسمى﴾

ප්‍රාණයන් මැරෙනා මොහොතේද, තම නින්දෙහි නොමැරෙන ඒවාද අල්ලාහ් අත්පත් කර ගනී. පසුව කිනම් ප්‍රාණය කෙරෙහි මරණය නියම වීද, ඒවා (තමා වෙත) රඳවාගෙන ඉතිරි ඒවා නියමිත කාලය එළඹෙන තුරු ජීවත්වීම පිණිස මුදා හරින්නේය. ( 39 : 42)

**බුද්ධියෙහි සාධක:**

නින්දෙහි පසුවන්නෙක් යථාර්ථයට ඔබිනා සිහිනයක් දකී. උදාහරණයක් වශයෙන් ඔහු සිහිනයෙන් මුහම්මද් තුමා දකින්නේය. එසේ එතුමා දකින්නෙකු සැබැවින්ම එතුමා දුටු කෙනෙකු වේ. නමුදු නින්දෙහි පසුවන්නා තම යහනෙහි දුටු දේ හා සසඳන විට හෙතෙම සිහිනයෙහි දුටු කරුණට ඉතා ඈතින් සිටින්නේය. මෙලොව සිදුවීම් කෙරෙහි මෙසේ සිදුවිය හැකිනම් එලොවෙහි ස්ථාවරය අනුව මෙය සිදු විය නොහැකිද?

කෙනෙකු භූමදානය කළ වළ හාරා බලන කළ එහි පසෙන් විනාශවූ මෘදුදේහයේ ශේෂයන් සහ සමහරවිට මිනියට අන්දවන ලද රෙදි හැර අන් කිසිදු වෙනසක් දැකිය නොහැකිය. මිණීවළද පටුවී හෝ විනාශ වී හෝ නැත යනුවෙන් පවසන අයගේ මත විවිධාකාරය. එසේ නම් එයට පිළිතුරු මෙසේය:

1. සත්‍ය ආගම පවසන ස්ථිර කරුණු ඇතැමුන්ගේ මෙවන් බෙලහීන කරුණු මත ප්‍රතික්ෂේප කළ නොහැකිය. මෙසේ කරුණු ඉදිරිපත් කරන අය සත්‍ය

ආගම විස්තර කරන දේ මනා ලෙස අවබෝධ කර ගන්නේ තම තම සැකය වැරදි බව වටහා ගනු ඇත.

2. මිනිවල (ආලමුල් බර්සග්-අදෘශ ලොව)හි සිදුවන සියල්ල මිනිස් දෘෂ්ඨියෙන් ඈත්වූ ඒවා වේ. කෙනෙකු තම බුද්ධිය මගින් ඒවා වටහා ගැනීමට නොහැකිය. ඒවා බුද්ධිය මගින් අවබෝධ කර ගැනීමට හැකි නම් අදෘශ්‍යමාන දේ කෙරෙහි විශ්වාස කිරීම කිසිදු අර්ථයක් නොවන්නේය. තවද, අදෘශ්‍යමාන දේ කෙරෙහි විශ්වාස කරන්නන් සහ නොකරන්නන් අතර කිසිදු වෙනසක් නොවන්නේය.

3. මිණිවළෙහි සන්තාපය හෝ මිහිර හෝ එහි පටුවීම හෝ විශාල වීම හෝ හැඟෙන්නේ එහි තුලවූ අය හට මිස ජීවත්ව සිටින අන් අය හට නොවේ. මෙය නින්දෙහි පසුවන්නා දකින මිහිරි හෝ අමිහිරි හෝ සිහිනයක් හා සමාන වූවකි. හේ සිහිනයෙහිදී පසුවන තැන ගැන පිටස්තර කෙනෙකුගෙන් විමසූ කළ පිළිතුර වන්නේ හෙතෙම තම යහනෙහි තද නින්දක පසුවන බවය.

තවද, නබි තුමා තම යහළුවන් හා පසුවන බොහෝ අවස්ථාවන්හී එතුමාට වහි (දිව්‍යමය ආඥාවන්) පහළ විය. එතුමා එම ආඥාවන් හට සවන් දුන්හ. එහෙත් එතුමා අසල සිටි එතුමාගේ යහළුවන් ඒවා නොදැන සිටියහ. දිව්‍යමය පණිවුඩය රැගෙන ආ සුරදූතයන් නබි තුමා සියැසෙන් දුටුහ. නමුදු එතුමා වටා සිටි යහළුවන් නුදුටුහ. සමහර අවස්ථාවන්හී සුරදූතයන් මිනිස් ස්වරූපයෙන් දිව්‍යමය පණිවුඩය රැගෙන එතුමා හා

පිළිසඳරෙහි යෙදී සිටියද එතුමා වටා රොක්ව සිටි අය ඒවා කිසිවක් නොදත්හ.

4. මිනිස් ඥානය, අල්ලාහ් මිනිසා හට ලබාදුන් තරමට ඉහළින් නොපවතින්නේය. මිනිසාට තම ඥානයෙන් පමණක් සියලු දේ වටහා ගැනීමට නොහැකිය. යථාර්ථ යෙන්ම සප්ත අහස්, පොළොව සහ ඒවා අතරවූ සියළු දේ අල්ලාහ්ගේ තේජස ප්‍රශංසා කරමින් සදා තුති පුදමින් සිටී. සමහර අවස්ථාවන්හීදී අල්ලාහ් එය තම කැමැත්ත ප්‍රකාර අන් අයටද අසන්නට සළස් වන්නේය. ඒවා අප දෘෂ්ටියට හසු නොවන අයුරු පවතින්නේය.

එවැනි අද්‍යශ්‍යමාන කරුණු ගැන ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

﴿تسبح له السموات السبع والأرض ومن فيهن وإن من شيء إلا يسبح بحمده ولكن لا تفقهون تسبيحهم﴾

*සප්ත අහස්, පොළොව සහ ඒවා අතරවූ සියල්ල (අල්ලාහ්) මහුගේ තේජස ප්‍රශංසා කරමින් තුති පුදන්නේය. මෙයින් කිසිවක් මහුගේ තේජස ප්‍රශංසා නොකර නොසිටින්නේය. නමුදු, ඒ ප්‍රශංසාව වටහා නොගනී.* (17 : 44)

ෂෙයිතාන්වරු සහ ජින්වරු මහපොළොවෙහි ඔබ මොබ සැරිසරමින් සිටිති. වරෙක ජින්වරු මුහම්මද් තුමා වෙතද පැමිණියහ. එතුමා අල්කුර්ආනය පාරායනය කරනු සවන් දීගෙන උන්හ. පසුව අනතුරු ඇඟවීම පිණිස තම සමාජය වෙත ගියහ. එනමුත් මහුන් මිනිස් දෘෂ්ඨියෙන් ඈත්වූ නිර්මානයක් වේ.

මේ ගැන ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿يابني آدم لا يفتننكم الشيطان كما أخرج أبويكم من الجنة ينزع عنهما لباسهما ليريهما سوءاتهما إنه يراكم هو وقبيله من حيث لا ترونهم إنا جعلنا الشياطين أولياء للذين لا يؤمنون﴾

*ආදම්ගේ මිනිසුනේ, ෂෙයිතාන් ඔබ දෙමාපියන් ඔවුන්ගේ මර්මස්ථානයන් ඔවුන් හට පෙන්වීම පිණිස ඔවුන්ගේ වස්ත්‍ර ඉවත් කර (ඔවුන් ප්‍රීතියෙන් ජීවත්වූ) ස්වර්ගයෙන් පිටමං කළා සේ, ඔබද ෂෙයිතාන් මුළා කිරීමට ඉඩ නොදෙනු මැනව. සැබැවින්ම ෂෙයිතාන් සහ ෂෙයිතාන්ගේ සගයින් ඔබ ඔවුන් නොදකින අයුරු (සැඟවී සිට) ඔබ (නොමග යැවීම පිණිස) මග බලා සිටී. සැබැවින්ම අවිශ්වාසවන්තයින් හට එම ෂෙයිතාන්වරු සගයින් ලෙස පත් කර ඇත්තෙමි.* (අල්කුර්ආන් 7 : 27)

මිනිසුන් ස්වයංව සියල්ල වටහා ගැනීමේ ඥානයෙන් හීනව පවතින කළ ගුප්ත සත්‍යයන් තමා නොදුටු බැවින් සහ අවබෝධ කරගැනීමට නොහැකි බැවින් ප්‍රතික්ෂේප කළ නොහැකිය.

# පූර්ව සැලැස්ම කෙරෙහි විශ්වාසය

අල්-කදර් යනු සර්ව බලධාරි දෙවියා වන අල්ලාහ් විසින් සියලු නිර්මාණයන් හට නියම කරණ ලද තීරණය වේ. අල් කදර් යන වචනයෙහි තේරුම පෙර නියම කරන ලද දෛවය යන්න වේ. කදර් යනු නිර්මාණයන් සියල්ල ඒවා නිර්මාණය කිරීමට පෙර ඒවා කෙරෙහිවූ දැනුම මත සර්ව බලධාරිවූ අල්ලාහ් විසින් කරණ ලද තීන්දුව වේ.

දෛවය කෙරෙහි විශ්වාස කිරීම සිව් කරුණු මත රැඳේ.

1. අල්ලාහ් තම සියලු නිර්මාණයන් පොදුවෙන් සහ සවිස්තරව එහි මුල පටන් අවසානය දක්වා මනා ලෙස දැන සිටී යැයි විශ්වාස කළ යුතුය. එම දැනුම තම ක්‍රියාවන් ගැන හෝ වේවා, තම නිර්මාණයන්ගේ ක්‍රියාවන් ගැන හෝ වේවා අල්ලාහ් සියලු දේ කෙරෙහි සූක්ෂම දැනුමක් ඇත්තා වේ.

2. මෙම දැනුම් සියල්ල අල්ලාහ් 'ලව්හුල් මහ්ෆූළ්' නම් ආරක්ෂක පුවරුවක සටහන් කර ඇතැයි විශ්වාස කිරීම. මෙම කරුණු දෙක ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿ألم تعلم أن الله يعلم ما فى السماء والأرض إن ذلك فى كتاب أن ذلك على الله يسير﴾

*සැබැවින්ම අල්ලාහ් අහසේහි සහ පොළොවෙහි වූ සියල්ල ගැන මනා දැනුමක් ඇති බව ඔබ නොදන්නෙහිද? සැබැවින්ම මේවා (සියල්ල) ආරක්ෂක පුස්තකයක සටහන් කර ඇත. මෙය අල්ලාහ්ට ඉතා පහසු කාර්යයක් වේ.*

(අල්කුර්ආන් 22 : 70)

අබ්දුල්ලාහ් බින් අමර් බින් ආස් (රලි) තුමා හෙළි කළ හදීසයක් මුස්ලිම් ග්‍රන්ථයේ මෙසේ සඳහන් වෙ. 'නබි තුමා මෙසේ දෙසනු මා අසා ඇත්තෙමි. අල්ලාහ් අහස් සහ පොලොව නිර්මාණය කිරීමට අවුරුදු පනස් දහසකට පෙර සියලු නිර්මාණයන් සඳහා නියම වූ පූර්ව සැලැස්ම වන දෛවය සටහන් කර තැබීය.'

3. අල්ලාහ්ගේ ක්‍රියාවන් හෝ වෙවා නිර්මාණයන්ගේ ක්‍රියාවන් හෝ වෙවා සිදුවන්නාවූ සියලු දේ අල්ලාහ්ගේ කැමැත්ත පරිදි හැර සිදු නොවන බව විශ්වාස කිරීම.

අල්ලාහ් තම ක්‍රියාවන් ගැන ශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ පවසයි:

﴿وربك يخلك ما يشاء ويختار﴾

*තවද (නබිතුමනි) ඔබ දෙවියා තම කැමැත්ත පරිදි නිර්මාණය කරයි.(දූතයන් ලෙස තමා කැමැති අය) තෝරා ගනී.* (අල්කුර්ආන් 28 : 68)

තවත් අල්කුර්ආන් වාක්‍යයක් මෙසේ සඳහන් වෙ:

﴿ويفعل الله ما يشاء﴾

තවද, අල්ලාහ් තමා ප්‍රිය වූ දේ කරන්නේය. (14 : 27)

තවත් අල්කුර්ආන් වාක්‍යයක් මෙසේ සඳහන් වෙ:

﴿هو الذي يصوركم فى الأرحام كيف يشاء﴾

*(ඔබ මැණියන්ගේ) ගර්භාෂය තුල (අල්ලාහ්) ඔහු තම කැමැත්ත ප්‍රකාර අල්ලාහ් ඔබ නිර්මාණය කරන්නේය.*
(අල්කුර්ආන් 3 : 6)

තම නිර්මාණයන්ගේ ක්‍රියාවන් ගැන අල්ලාහ් ශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ පවසයි :

﴿وَلَوْ شَاء اللّهُ لَسَلَّطَهُمْ عَلَيْكُمْ فَلَقَاتَلُوكُمْ﴾

*අල්ලාහ් අධිෂ්ඨාන කළේ නම්, ඔබ කෙරෙහි ඔවුන් (ඒ මුනාෆික් වරුන් හට) බලය පවරා තිබෙන්නට ඇත. එවිට (ඔවුන්) ඔබට විරුද්ධව සටන් කර ඇත.*

(අල්කුර්ආන් 4 : 90)

තවත් අල්කුර්ආන් වැකියක් මෙසේ විස්තර කරයි :

﴿ وَلَوْ شَاء رَبُّكَ مَا فَعَلُوهُ فَذَرْهُمْ وَمَا يَفْتَرُونَ﴾

*ඔබ දෙවියා මනාප වූවා නම් ඔවුන් මෙසේ නොකරනු ඇත. එහෙයින් (නබි තුමනි), ඔබ ඔවුන් සහ ඔවුන්ගේ කාල්පනික ප්‍රබන්ධයන්ද අත්හැර පිටුපා දමනු.*

(අල්කුර්ආන් 6 : 112)

4. ලොවෙහි වූ සියල්ල ඒවාහී යථාර්ථය, එහි ගුණාංගය සහ ඒවායේ ක්‍රියාකාරීත්වය ඇතුළු සියල්ල නිර්මාණයන් යැයි අල්ලාහ්ගේ නිර්මාණත්වය විශ්වාස කිරීම.

නිර්මාණයන් ගැන අල්ලාහ් අල්කුර්ආයේ මෙසේ කියයි :

﴿اللّهُ خَالِقُ كُلِّ شَيْءٍ وَهُوَ عَلَى كُلِّ شَيْءٍ وَكِيلٌ﴾

*සියලු දේහී නිර්මාතෘවරයා අල්ලාහ් වේ. සියල්ලෙහි භාරකරුද ඔහු වේ.* (අල්කුර්ආන් 39 : 62)

﴿وَخَلَقَ كُلَّ شَيْءٍ فَقَدَّرَهُ تَقْدِيرًا﴾

*තවද, සියල්ල නිර්මාණය කළේ ඔහු (අල්ලාහ්)ය. පසුව ඒ ඒ නිර්මාණයන් අනුව සියල්ලෙහි දෛවය තීරණය කෙළේය.* (අල්කුර්ආන් 25 : 2)

ඉබ්රාහීම් නබි තුමා තම ජනයන් අමතා පැවසූ බව අල්කුර්ආනය මෙසේ සඳහන් කරයි:

﴿والله خلقكم وما تعملون﴾

*සැබැවින්ම ඔබද ඔබ (නිර්මාණය) කරනා සියල්ලද නිර්මාණය කළේ අල්ලාහ්ය.* (අල්කුර්ආන් 37 : 96)

මෙහි අප විස්තර කළ අයුරු දෛවය කෙරෙහි විශ්වාස කරනා කළ, ඒවා මිනිසාගේ ස්වකීය අභිප්‍රයයන් හට හා හැකියාවන් හට කිසිසේත් විරුද්ධ නොවන්නේය. මක්නිසාද යත් ආගමද, යථාර්ථයද, භාවයද, එය එලෙසම විග්‍රහ කරන හෙයිණ.

**ෂරීආ:** මිනිසා හට තම ස්වකීය ක්‍රියාවෙහි ස්වකීය කැමැත්තක් ඇති බව මතු සඳහන් ශුද්ධවූ අල්කුර්ආන් වැකිය පැහැදිලි කරයි:

﴿فمن شآء اتخذ الى ربه مآبا﴾

*එමනිසා, ප්‍රියවන්නේ කවරෙක්ද හෙතෙම තම දෙවියා කෙරෙහි වූ සෘජු මාවත සොයා ගනිද්දෙන්.*

(අල්කුර්ආන් 78 : 39)

තවත් ශුද්ධවූ අල්කුර්ආන් වැකියක් මෙසේ විස්තර වේ:

﴿نسآؤكم حرث لكم فأتو حرثكم أنى شئتم﴾

*(ඔබගේ භාර්යාවන් ඔබට කෙතක් වැන්න). ඔබ මනාපය පරිදි ඔබ සඳහාවූ කෙත වෙත (සතුටුවීම පිණිස) යන්න.* (අල්කුර්ආන් 2 : 223)

අල්ලාහ්ට බියවීම කෙරෙහි තවත් ශුද්ධවූ අල්කුර්ආන් වැකියක් මෙසේ පැහැදිලි කරයි:

﴿فاتقوا الله مااستطعتم و اسمعوا﴾

*ඔබ හැකිතාක් අයුරින් අල්ලාහ්ට බියවන්න. (ඔහුගේ) ආඥාවන් හට අවනත වන්න.* (අල්කුර්ආන් 64 : 16)

කරුණාබරිත අල්ලාහ් කිසිදු ආත්මයකට නොඉසිලිය හැකි බරක් ඒ මත නොපවරයි. එය විස්තර කරණු වස් ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ කරුණු විග්‍රහ කරයි:

﴿لا يكلف الله نفسا إلا وسعها لها ما كسبت و عليها ما اكتسبت﴾

*අල්ලාහ් කිසිදු ආත්මයකට එහි ශක්තියෙන් බැහැර වූ දෙයක් නොපවරයි. (හොඳින්) ඔහු සපයා ගත් දේ ඔහු සතුය. තවද, (නරකින්) සපයා ගත් දේද ඔහු සතුය.*
(අල්කුර්ආන් 2 : 286)

**යථාර්ථය:** මනාපයක් සහ යම් හැකියාවක් තමා වෙත ගැබ්ව ඇති බව සෑම මිනිසෙකුම මනාව දනී. හෙතෙම යමක් කරන්නට උත්සාහ දරන්නේ ඒ හැකියාව මතය.

මිනිසා තම මනාපය මත කරනා සමහර කාර්යයන් ගැන සසඳා බලන්නේය. ඇවිදීම වැනි ක්‍රියාවන් හෙතෙම තම ස්ව කැමැත්ත මත කරන කාර්යයක් වන අතර, කකුල් වෙවුලීම වැනි ක්‍රියාවන් තම නොමනාපය මත කෙරෙන බව වටහා ගන්නේය. නමුදු කෙනෙකුගේ මනාපය සහ හැකියාවන් අල්ලාහ්ගේ හැකියාව සහ මනාපය මත කෙරෙන්නේය.

මෙම කරුණ අල්ලා ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ කරුණු පැහැදිලි කරයි:

﴿إن هو إلا ذكر للعالمين . لمن شاء منكم أن يستقم . وما تشاءون إلا أن يشاء الله رب العالمين﴾

මෙ(ම සත්‍ය අල්කුර්ආන)ය ලොවැසියන් හට මාර්ගෝප දේශයක් මිස අනෙකක් නොව. (තවද,) *ඔබගෙන් යහමග සොයනා අය හට (මෙය) කදිම මග පෙන්වීමකි. තවද විශ්වයේ ආරක්ෂකයා වන අල්ලාහ්ගේ කැමැත්ත නොවන්නට ඔබ හට කිසිදු යහකමක් කැමැති වන්නේ නැත.* (අල්කුර්ආන් 81 : 27-29)

එපමණක් නොව. මුලු විශ්වයම අල්ලාහ්ට අයත් වේ. සර්ව බල අල්ලාහ්ට අයත් දේහි අල්ලාහ්ගේ අනුදැනුමෙන් තොරව කිසිවක් සිදු නොවේ.

අප විස්තර කළ ආකාරයට මිනිසා දෛවය කෙරෙහි විශ්වාස කළ යුතු අතර, හෙතෙම තම යුතුකම් ඉටු කිරීමෙන් වැළකී සිටීමට හෝ අකුසල් කර්මයන්හී නියැලෙන්නට හෝ කිසිදු සාධකයක් නැත. තමා අල්ලාහ්ගේ ආඥාවන් ඉටු නොකර එය පැහැර හැරීම පිණිස දෛවය සාධකයක් ලෙස ඉදිරිපත් කිරීම වැරදිය.

මෙයට මතු සඳහන් කරුණු සාධක වේ:

1. එය සනාථ කරමින් අල්ලාහ් ශුද්ධවූ අල්කුර්ආන්හී මෙසේ පවසයි:

*අල්ලාහ්ගේ මනාපය වීනම්, අපද අපගේ මුතුන් මිත්තන්ද '(අල්ලාහ්ට කිසිවක්) ආදේශ නොකළ ඇත්තෙමු. (අනුභව කළ හැකි)කිසිවක්(නුසුදුසු යැයි කිසිවිටෙක) අප තහනම් කර නොගන්නෙමු' යනුවෙන් ආදේශ කරන්නන් පවසති. මොවන්ට පෙරවූ සමාජයේ අයද අපගේ දඬුවම විඳින*

*කල් මෙසේ පවසමින් සත්‍ය ප්‍රතික්ෂේප කළහ. (එමනිසා නබිතුමනි, ඔවුන් හට) ඔබ පවසන්න, ඔබගේ කියමන් හට සාධක තිබේද? (එසේනම්) ඒවා හෙළි කරන්න. (ඔබගේ අප්‍රයෝජන) සිතුවිලි හැරෙන්නට ඔබ අන් කිසිවක් නොපිළිපදින්නෙහුය. තවද ඔබ අනුමාන කරන්නන් හැර අන් කිසිවෙක් නැත.* (අල්කුර්ආන් 6 : 148)

අල්ලාහ්ගේ පූර්ව සැලැස්ම වන දෛවය කෙරෙහි ඔවුන් හට සාධක වී නම් අල්ලාහ් ඔවුන් දඬුවම් විඳීමට නොසලස්වනු ඇත.

2. ශුද්ධවූ අල්කුර්ආනය මෙසේද පවසයි:

﴿رسلا مبشرين ومنذرين لئلا يكون للناس على الله حجة بعد الرسل وكان الله عزيزا حكيما﴾

*මෙම වක්තෘවරුන්ගේ පැමිණීමෙන් පසුද අල්ලාහ් කෙරෙහි මිනිසුන් හට කිසිදු සාධකයක් නොවන පිණිස බොහෝ වක්තෘවරු (ස්වර්ගය ගැනවූ) සුභාරංචිය පවසන අය ලෙසද, රුදුරු වේදනාව කෙරෙහි අවවාද කිරීම පිණිසද (අල්ලාහ් පිටත් කර යැවීය). තවද අල්ලාහ් සියල්ල අභිබවූ සූක්ෂ්ම ඥානය ඇත්තා වේ.*

(අල්කුර්ආන් 4 : 165)

ප්‍රතික්ෂේප කරමින් ජීවත්වූ ජනයන් හට දෛවය සාධකයක් වුවානම් වක්තෘවරු පත්කිරීමෙන් කිසිදු ප්‍රයෝජනයක් නොවන්නේය. මක්නිසාද යත් වක්තෘවරුන්ට පසුද, (දේව ආඥාවන්ට) විරුද්ධව ක්‍රියා කිරීමද, අල්ලාහ්ගේ පූර්ව නියමය මත සිදුවන නිසාය.

3. බුහාරි සහ මුස්ලිම් ග්‍රන්ථවල අලි බින් අබීතාලිබ්(රළි) තුමා විසින් වාර්තා කළ විස්තරයක් මෙසේ සඳහන් වේ. 'වරෙක මුහම්මද් තුමා මෙසේ පැවසූහ. 'ඔබ සියලු දෙනා කෙරෙහි මවුනොවුන් අවසානයේ සේන්දු වන ස්ථානය ස්වර්ගයද තිරයද යන්න සඳහන් නොකර නැත.' 'එසේ නම් අල්ලාහ්ගේ වක්තෘතුමනි, (දෛවය සාධකයක් කර ගෙන) කිසිදු කාර්යයක් නොකර සිටිය හැකි නොවේද?' යනුවෙන් සහාබිවරයෙකු විමසූ කළ 'නැත, ඔබ ක්‍රියා කරන්න. සියල්ලන් කුමක් පිණිස නිර්මාණය කරන ලද්දේද, එය කිරීමට මවුන් හට පහසු කර ඇත'යි පවසා මතු සඳහන් ශුද්ධවූ අල්කුර්ආන් වැකි කීපය පාරායනය කළහ.

﴿إن سعيكم لشتى . فأما من أعطى واتقى . وصدق بالحسنى . فسنيسره لليسرى﴾

*(මිනුෂ්‍යයිනි), ඔබගේ උත්සාහයන් විවිධය. එහෙයින් (තම සේසත් කුසල් පිණිස අනුන් හට) ප්‍රධානය කර (අල්ලාහ්ට) බියවී, තවද අල්ලාහ්ගේ කුසල් දේ සත්‍ය කරන්නා හට ස්වර්ගයේ මාවත් පහසු කරන්නෙමු.*

(අල්කුර්ආන් 92 : 4-7)

සහීහ් මුස්ලිම් ග්‍රන්ථයේ වාර්තාවක් මෙසේද සඳහන් වේ: මවුනොවුන් නිර්මාණය කළ හේතුන් මත සියලු දෙනා හට යහමග පහසු කර ඇත යනුවෙන් පැවසූහ. පසුව නබි තුමා මතු සඳහන් ශුද්ධවූ අල්කුර්ආන් වාක්‍යය පාරායනය කළහ.

*(මිනුෂ්‍යයිනි), ඔබගේ උත්සාහයන් විවිධය. එහෙයින් (තම සේසත් කුසල් පිණිස අනුන් හට) ප්‍රධානය කර*

*(අල්ලාහ්ට) බියවී, තවද අල්ලාහ්ගේ කුසල් දේ සත්‍ය කරන්නා හට ස්වර්ගයේ මාවත් පහසු කරන්නෙමු.*
(අල්කුර්ආන් 92 : 4-7)

දෙවියා අරභයා කුසල් කර්මයන් කිරීමෙන් වැළකී සිටීමට නබි තුමා කිසිවිටෙක කිසිවෙකුට අනුබල නුදුන්හ. හැකිතාක් අන්දමින් සෑම අවස්ථාවකදීම කුසල් කර්මයන්හී නියැලෙන ලෙස දෙසූහ.

4. සමහර යුතුකම් ඉටුකරනා ලෙසද සමහරෙන් වැළකෙන ලෙසද අල්ලාහ් දෙවිදු මිනිසාට අණ කරයි. තවද මිනසාගේ ශකිත්යට වාවාගත හැකි දේ පමණක් කරන ලෙසද අණ කරමින් සිටී.

﴿ فَاتَّقُوا اللَّهَ مَا اسْتَطَعْتُمْ ﴾

*හැකිතාක් අයුරින් (යුතුකම් ඉටුකිරීම පිණිස) අල්ලාහ්ට බියවන්න.*
(අල්කුර්ආන් 64 : 16)

﴿ لَا يُكَلِّفُ اللَّهُ نَفْسًا إِلَّا وُسْعَهَا ﴾

*අල්ලාහ් ඉසිලිය නොහැකි බරක් කිසිදු ආත්මයක් මත නොපවරන්නේය.*
(අල්කුර්ආන් 2 : 286)

ක්‍රියාවන් කෙරෙහි මිනිසා අනිවාර්යය කළේ නම් මහුට කළ නොහැකි දේ කෙරෙහි මහුට බල කරනු ඇත යනුවෙන් පවසයි නම් එය වැරැදි අර්ථ නිරූපණයකි. එහෙයින් යමෙකු නොදැනුවත්ව හෝ අමතක වීමකින් හෝ බලකිරීමකින් හෝ අකුසල් කර්මයන්හී නියළෙන කළ, කළ වරදට කිසිසේත් මහුට පව් අත් නොවෙ.

එයට හේතුව වන්නේ පාපයකට ලක් කිරීමට තරම් සාධක මහු කෙරෙහි නැති නිසාය.

5. අල්ලාහ් විසින් නියම කරන ලද දෛවය මිනිස් චින්තනයෙන් ඈත්වූ සැඟවුනු රහසකි. කෙනෙකු තම දෛවය ගැන දැනගන්නේ මහුට නියමවූ කාර්යයන් සිදුවීමෙන් පසු මිස පෙර නොව. තවද මිනිසාගේ බලාපොරොත්තු සහ පරමාර්ථයන් මහු විසින් කරන කාර්යයන්ට වඩා පෙරට සිටී. මිනිසා කාර්යයක් කිරීමට සුහුසුලු වන්නේ, එම කාර්යයන් පසු ඇති විය හැකි විපාකය ගැනවූ සම්පූර්ණ දැනුමකින් තොරවය. සියල්ල සිදුවන්නේ අල්ලාහ් නියම කරන ලද පූර්ව සැලැස්ම හෙවත් දෛවය මතය. කෙනෙකු මෙසේ ක්‍රියා කර තම කාර්යයන් සඳහා දෛවය සාධකයක් ලෙස පෙන්වීමට නොහැකිය. මක්නිසාදයත්, නියම වශයෙන්ම අවසානයක් ගැන නිරසාර අවබෝධයක් නැති කරුණක් වෙනුවෙන් ලැබුණු විකෘතිවූ ප්‍රතිවිපාකයක් සාධකයක් ලෙස මහුට පෙන්වීමට කිසිවිටෙක නොහැකි නිසාය.

6. සාමාන්‍යයෙන්, මිනිසා ලෞකික කටයුතුවලදී තමාට සම්මත හා ප්‍රිය වන දේ කෙරෙහි වැඩි කැමැත්තක් දක්වා එය ලබාගැනීමේ චේතනාවෙන් ක්‍රියා කරන අතර, තමා ප්‍රිය නොකරන දේ කෙරෙහි හෙතෙම නොඇදෙන් නේය. වෙනුවට තම කැමැත්ත සහ අකැමැත්ත ඒ සඳහා සාධකයක් ලෙසද නොපෙන්වන්නේය. එසේනම් ආඥාදායී සත්‍ය ආගමික කටයුත්තන් කෙරෙහි මරණින් මතු ප්‍රයෝජනය වන ක්‍රියාවන් නොකරන්නේ මක්නිසාද? අල්ලාහ්ගේ ආඥාවන් පැහැර හැර ඒ සඳහා කෙසේ දෛවය සාධකයක් ලෙස හෙතෙම ඉදිරිපත්

කරන්නද? එසේ ඉදිරිපත් කිරීම පරස්පර විරෝධී ක්‍රියාවක් නොවේද?

මතු සඳහන් උදාහරණය මඳක් සිතා බලන්න:

මිනිසෙකු ඉදිරියෙහි මාවත් දෙකක් වේ. එයින් එකක් අයුක්ති සහගත, මිනිමැරුම්, මංකොල්ල, ලැජ්ජා සහ බියෙන් යුත් ස්ථානයක් කරා ගමන් කරන්නාවූ මාවතකි. අනෙක යුක්තිය රජයන සාමය සමාදානය සලස් වන්නාවූ, කෙනෙකුගේ ජීවිතය, ඝේසත සහ ගෞරවය කෙරෙහි ආරක්ෂාව සලස්වන්නාවූ තැනක් කරා ගමන් කරන්නාවූ මාවතකි. මෙම මාවත් දෙකෙන් ඉහතෙම තෝරා ගන්නේ කුමණ මාවතක්ද?නිසැකයෙන්ම ඔහු තෝරා ගන්නේ යුක්තිය සහ ආරක්‍ෂා සහිත ඍජු මාවත නොවේද? අයුක්ති සහගත සහ ආරක්ෂා රහිත මාවත තෝරා ගෙන ඒ සඳහා දෛවය සාධකයක් ලෙස ඉදිරිපත් කිරීම අනුවණ ක්‍රියාවකි. එසේ නම් මරණෙන් මතු ජීවිතය සඳහා ස්වර්ගය ලබාගැනීමේ මාවත පිටුපා රුදුරු නිරයේ මාවත තෝරාගන්නේ කුමණ හේතුවක් නිසාද? එසේ තමා තෝරාගත් නිරයේ මාවත සඳහා කෙසේ දෛවය හේතුවක් ලෙස පෙන්විය හැකිද?

තවත් උදාහරණයක්:

රෝගියෙකු හට වෛද්‍යවරයෙකු විසින් රෝගය සුවවීම පිණිස බෙහෙත් පාවිච්චි කරන ලෙස දැනුම් දෙනු ලැබේ. රෝගය සුව කරගැනීම පිණිස රෝගියා අකැමැත්තෙන් හෝ වෛද්‍යවරයා විසින් නියම කරණ ලද බොහෙත් ගිල දමයි. තමා ඉතා ප්‍රිය කරන ප්‍රණීත ආහාරපාන පවා වෛද්‍යවරයාගේ උපදෙස් මත වළකා ගනී. ඔහු මෙසේ කරන්නේ තම රෝගය හැකිතාක්

ඉක්මණින් සුව කර ගැනීමටය. රෝගියා බෙහෙත්ද පාවිච්චි නොකර, රෝගයට අහිතකර කෑමබීමවලින්ද නොවැළකී රෝගය වැඩිවී මරණාසන්න මොහොතට පත්වී දෛවය මත වරද පැටවීම අනුවණ ක්‍රියාවක් නොවේද? එසේම අල්ලාහ් සහ අල්ලාහ්ගේ වක්තෘ තුමා විසින් දෙසූ දේ නොකර නොසැලකිල්ලෙන් පසුවන්නේ කුමණ හේතුවක් මතද? අල්ලාහ් සහ අල්ලාහ්ගේ වක්තෘ තුමා වැළක්වූ දේ කිරීමට උත්සාහ කර පසුව දෛවය මත බර පටවන්නේ මක් නිසාද?

7. යුතුකම් පැහැර හැරීමට හා අකුසල් කර්මයන්හී නියැළීමට දෛවය සාධකයක් ලෙස විදහා පාන්නෙකු කෙරෙහි, වෙනත් කෙනෙකු අයුක්ති ලෙස හැසිරී හෝ මහුගේ සේසත් අයුක්ති සහගත ලෙස උදුරාගෙන හෝ අගෞරව කර හෝ ඒ සඳහා දෛවය සාධකයක් ලෙස ඉදිරිපත් කළානම් (මා කුමක් කරන්නද? දෛවය නිසා මා අතින් ඔබට මෙවැනි දෙයක් සිදුවුනා කියා පැවසුවා නම්) මහු එය පිළිගනීද? කෙනෙකු කෙරෙහි තවත් කෙනෙකු අයුක්ති සහගතව ක්‍රියාකර ඒ සඳහා දෛවය සාධකයක් ලෙස ඉදිරිපත් කරන්නේ නම්, මහු එවැනි සාධකයක් කිසිවිටෙක නොපිළි ගනී. එසේ නම් අල්ලාහ් කෙරෙහි අයුක්ති සහගතව ක්‍රියාකිරීමෙහිලා දෛවය සාධකයක් ලෙස ඉදිරිපත් කරන්නේ කෙසේද?

ඉස්ලාමීය පාලනය සමයේ දෙවන කලීෆා (ජනාධිපති) වන උමර් බින් කත්තාබ් තුමාගේ පාලන සමය තුල සිදුවූ කරුණක් ගැන මෙහිලා සිතා බැලීම අවස්ථාවෝචිතය. අත සිඳිය යුතු තරමට වූ සොරකමක් කළ සොරෙකු විනිශ්චය සඳහා එතුමා වෙත ඉදිරිපත් කරන

ලදී. විචෘත විභාගයකින් පසුව සොරාගේ අත සිඳින ලෙස උමර් බින් කත්තාබ් තුමා අණ කළහ. එවිට සොරා 'විශ්වාසවන්තයින්ගේ නායක තුමනි, අල්ලාහ්ගේ දෛවය මත මා සොරකම් කළෙමි' යනුවෙන් පැවසුවේය. එයට එතුමා 'අප ඔබ අත සිඳින්නේද දෛවය මත වේ' යනුවෙන් උත්තර දුන්හ.

දෛවය කෙරෙහි විශ්වාස කිරීමෙන් ඇති ප්‍රයෝජන:

1. යම් දෙයකට වූ කාරණ සහ කාර්යයන්හී තියලෙන අවධියෙහි එය කෙරෙහි පමණක් සම්පූර්ණ ලෙස ඉවහල් නොවී, අල්ලාහ්ගේ දෛවය මත විශ්වාසය තැබීම. මක්නිසාද යත් සියල්ල අල්ලාහ්ගේ පෙර නිමිත්ත වූ පූර්ව සැලැස්ම හෙවත් දෛවය මත සිදුවන නිසාය.

2. තමා සිතුපැතු කාර්යයන් සපල වන කළ උඩඟු නොවිය යුතුය. මක්නිසාද යත්, සියල්ල සිදුවන්නේ අල්ලාහ් විසින් නියම කරන ලද පූර්ව සැලැස්ම හෙවත් දෛවය මත නිසාය. කුසල් සහ ජය කෙරෙහිවූ කාර්යයන් සඳහා තීරණය කරන්නේ අල්ලාහ්ය. තම කාර්යයන් සපල වන කළ උඩඟුවීම දෙවියන් හට ස්තුති වන්ත වීමෙන් මිනිසා පැහැර හරින්නේය.

3. අල්ලාහ්ගේ පෙරනිමිති කාර්යයන් සිදුවන කළ, මිනිසා ඉවසිලිවන්තව සිටිය යුතුය. තමා බලාපොරොත්තු වූ දේ සිදු නොවිය යනුවෙන් හෝ තමා අකැමැති දෙයක් සිදුවිය යනුවෙන් හෝ සිත් තැවුල් නොවිය යුතුය. මක් නිසාද යත්, අහස් සහ පොලොවෙහි පාලනය කා අතෙහි වේදෝ, ඒ සර්ව බලධාරි අල්ලාහ්ගේ අනුදැනුම හා නියමය මත සියලු කාර්යයන් සිදුවන නිසාය.

මෙම කරුණ සම්බන්ධ අල්කුර්ආන් වැකියක් මෙසේය:

﴿مَا أَصَابَ مِنْ مُصِيبَةٍ فِى الأَرْضِ وَلاَ فِى أَنْفُسِكُمْ إِلاَّ فِى كِتَابٍ مِنْ قَبْلِ أَنْ نَبْرَأَهَا إِنَّ ذَلِكَ عَلَى اللَّهِ يَسِيرٌ، لِكَيْلاَ تَأْسَوْا عَلَى مَا فَاتَكُمْ وَلاَ تَفْرَحُوا بِمَا آتَاكُمْ ، وَاللَّهُ لاَ يُحِبُّ كُلَّ مُخْتَالٍ فَخُورٍ﴾

*අහසේහි හා පොළොවෙහි හෝ ඔබ කෙරෙහි සිදුවන සියලු දුඃඛිත දේ අප එය සිදු කරන්නට පෙර (ලව්හුල් මහ්ෆූල් නම්) ආරක්ෂක පුස්තකයේ සඳහන් නොවී නැත. සැබැවින්ම එය අල්ලාහ්ට පහසු දෙයකි. ඔබගෙන් ගිලිහී ගිය යමක් කෙරෙහි දුක් නොවී සිටීමද, ඔහු (අල්ලාහ්) ඔබට ප්‍රධානය දේ කෙරෙහි ඔබ අධික සතුටට නොපත්වන ලෙසටද (අල්ලාහ් ඔබට දැනුම් දෙයි). අල්ලාහ් කිසිසේත් උඩඟු සහ ආඩම්බර අය ප්‍රිය නොකරන්නේය.* (අල්කුර්ආන් 57 : 22-23)

මුහම්මද් තුමා මෙසේ දෙසූහ:

عجبا لأمر المؤمن إن أمره كله خير ، وليس ذاك لأحد إلا للمؤمن إن أصابته سراء شكر فكان خيرا له ، وإن أصابته ضراء صبر فكان خيرا له.

'විශ්වාසවන්තයෙකුගේ තත්වය ගැන මම පුදුම වෙමි. ඔහුගේ සියලු දේ යහපත්ව ඇත. නියම විශ්වාසවන්තයා හැරෙන්නට මෙම තත්වය අන් කිසිවෙකු හට නොලැබෙන්නේය. හෙතෙම සතුටට පත්වූ කළ, අල්ලාහ්ට ස්තුති කරන්නේය. එය ඔහුට මහත් යහපත් වන්නේය. දුකට පත්වූ කළ ඉවසිලිවන්ත වන්නේය. එයද ඔහුට යහපතක් වන්නේය.' (ග්‍රන්ථය : සහීහ් මුස්ලිම්)

දෛවය කෙරෙහි දෙපාර්ශවයක් නොමග ගොස් ඇත. ඒවා:

ජබරියියාවරු[7] : මිනිසා තම ක්‍රියාවන් කෙරෙහි බල කරනු ලද ඇත. තම ක්‍රියාවෙහි මිනිසාට ස්ව කැමැත්තක් හෝ හැකියාවක් හෝ නොමත්තේය යනුවෙන් පවසන්නන්ය.

කදරියියාවරු[8]: මිනිසා ස්ව ක්‍රියාවෙහි කැමැත්තෙන් හා ස්වෛරී හැකියාවෙන් ස්ථාවරව සිටී. එහි දෙවියන්ගේ කැමැත්තට හෝ හැකියාවන් හට හෝ කිසිදු ඉඩක් නැත යනුවෙන් පවසන්නෝය.

ජබරියියාවරුන් හට ආගම හා යථාර්ථය මගින් පිළිතුරු:

ආගම: සැබැවින්ම අල්ලාහ් මිනිසා හට ස්වකැමැත්තක් හා මනාපය මත මහුගේ ක්‍රියාව සම්බන්ධ කර ඇත.

ඒ කරුණ විස්තර කර ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පැහැදිලි කරයි:

[7] *ජබ්ර්: බලකිරීම, (Compulsion) මිනිසාගේ ස්වකැමැත්තට එරෙහිව අල්ලාහ්ගේ බලකිරීම ඇති බව ජහ්ම් බින් සෆ්වාන්ගේ (ක්‍රි:ව: 745) මගපෙන්වීමෙන් බිහිවූ කොටසක් පිළිගනී. මවුන්ගේ මතය අනුව මිනිසා සුළඟට අසුවූ පරඬැල්ලක් සේය.*

[8] කදරියියාවරු (Predestinarianism) මොවුන් ජබරියියාවරුන්ට හාත් පසින්ම විරුද්ධ මතයක් දරති. 'මොවුන් මෙම සමාජයේ අග්නි පූජකයන් වේ' යනුවෙන් නබිතුමා පැවසූ බව අබ්දුල්ලා බින් උමර් තුමා හෙළි කරන හදීසයක් අබූදාවුද් ග්‍රන්ථයේ සඳහන් වේ.

﴿منكم من يريد الدنيا ومنكم من يريد الآخرة﴾

ඔබගෙන් මෙලොව කෙරෙහි කැමැත්ත දක්වන අයද වෙති. තවද,ඔබගෙන් මතුලොව කෙරෙහි කැමැත්ත දක්වන අයද වෙති. (අල්කුර්ආන් 3 : 152)

තවද ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

﴿وقل الحق من ربكم فمن شاء فليؤمن ومن شاء فليكفر إنا أعتدنا للظلمين نارا أحاط بهم سرادقها﴾

(නබිතුමනි) මෙම සත්‍ය ආගම ඔබගේ (අධිපති) දෙවියාගෙන් (ආ) එකකි. එහෙයින් කැමැති අය (එය) විශ්වාස කරත්වා. කැමැති අය (එය) ප්‍රතික්ෂේප කරත්වා. අප අපරාධකරුවන් සඳහා නිරයේ ගින්න සකස් කර ඇත්තෙමු. එම ගින්නෙහි (දළ) පවුරු ඔවුන් වටකර ගන්නේය. (අල්කුර්ආන් 18 : 29)

තවත් අල්කුර්ආන් වැකියක් මෙසේ විස්තර කරයි:

﴿من عمل صالحا فلنفسه ومن أساء فعليها وما ربك بظلام للعبيد﴾

සාලිහ්වූ (කුසල්) කර්මයන් කරන්නේ කවරෙක්ද, එය ඔහු හට යහපත්වේ. අකුසල් කර්මයන් කරන්නේ කවරෙක්ද, එය ඔහුට විරුද්ධ වනු ඇත. තවද, ඔබ දෙවියා තම වහලුන් හට කිසිදු අයුක්තියක් නොකරන්නේය. (අල්කුර්ආන් 41 : 46)

යථාර්ථයේ පිළිතුර: කෑම, බීම සහ ගනුදෙනු කිරීම වැනි ස්ව කැමැත්තෙන් කරන කටයුතු සහ ලෙඩරෝග නිසා ඇතිවන වෙවලීම, ඉහළ මාලයෙන් හෝ ගසෙකින් ඇදගෙන වැටීම වැනි තමා අකැමැති ක්‍රියාවන් අතරවූ

වෙනස මිනිසා හොඳාකාරව දන්නේය. මිනිසා කැමතීම සහ ගනුදෙනු වැනි ක්‍රියාවන්හී කිසිදු බල කිරීමකින් තොරව ස්ව කැමැත්තෙන් ක්‍රියා කරන්නේය. වෙවුලීම සහ ඇදගෙන වැටීම වැනි ක්‍රියාවන් අකැමැත්තෙන් සහ නොමනාපයෙන් සිදු වන්නේය.

දෙවන පාර්ශවයේ අය ගැන ආගම සහ යථාර්ථය මගින් පිළිතුරු මෙසේය:

සැබැවින්ම සියලු දේහී මැවුම්කරුවා අල්ලාහ් වේ. සියලු කාර්යයන් ක්‍රියා වන්නේ ඔහුගේ මනාපය, අධිෂ්ඨානය මතය. මිනිසුන්ගේ සියලු ක්‍රියාවන් ඇතිවන්නේ ඔහුගේ කැමැත්ත ප්‍රකාරයැයි සර්ව බල අල්ලාහ් ශුද්ධවූ අල්කුර්ආනයේ මෙමසේ පවසයි:

﴿ولو شاء الله ما اقتتل الذين من بعدهم من بعد ما جاءتهم البينات ولكن اختلفوا فمنهم من آمن ومنهم من كفر ولو شاء الله ما اقتتلوا ولكن الله يفعل ما يريد﴾

*අල්ලාහ්ගේ මනාපය වූවානම්, තමන් වෙත පැහැදිලි සාධක පැමිණි පසුවද, වක්තෘවරුන්ට පසු පැමිණි ජනයන් (තමනතර) කෝලාහල නොකර සිටිනු ඇත. නමුදු ඔවුහු භේද වූහ. ඔවුනතර විශ්වාසවන්තයින්ද වේ. තවද, ඔවුනතර ප්‍රතික්ෂේප කළ අය (කාෆිර්වරු) ද වේ. අල්ලාහ් මනාප වූවානම් ඔවුහු (මෙසේ) තමනතර කෝලාහල නොකර ගනු ඇත. නමුදු අල්ලාහ් තම මනාපය මත ක්‍රියා කරයි.* (අල්කුර්ආන් 2 : 253)

තවත් ශුද්ධවූ අල්කුර්ආන් වැකියක් මෙසේය:

﴿ولو شئنا لآتينا كل نفس هداها ولكن حق القول مني لأملأن جهنم من الجنة والناس أجمعين ﴾

*තවද, අප මනාප වූවානම් සියලු ආත්මයන් හට යහමග සකස් කර දී ඇත්තෙමු. නමුදු 'මා සැබැවින්ම නිරය මිනිස් සහ ජින් වර්ග මගින් පුරවන්නෙමි' යි යනුවෙන් පෙරවදන් මා වෙතින් (පෙරම) විය.* (32 : 13)

බුද්ධියෙන් සාධක:

මුලු විශ්වයම අල්ලාහ්ට අයත් වේ. මිනිසාද මේ විශ්වයේ එක් කොටසකි. එහෙයින් මිනිසාද අල්ලාහ්ට අයත් වේ. තම ස්වාමියාගේ කැමැත්තක් නොවන්නට මහු යටතෙහි යැපෙන දාසයෙකු මහුගේ පාලනයෙහි අතගැසිය නොහැකිය.

## ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ඉලක්කය

ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ඉලක්කයන් යනු ඉස්ලාම් ආගම හරියාකාරව පිළිපැද ජීවත්වීමෙන් ඇතිවන්නාවූ උසස් සමෘධිය සහ ප්‍රතිලාභය වේ. ඒවායේ සමහරක් මෙසේය:

1. පිරිසිදු චේතනාවෙන් කරනා අව්‍යාජ අධිෂ්ඨානයන් සහ ඉබාදා (සියලු නිදොස් වැඳුම් පිදුම්) අල්ලාහ්ට පමණක් අයත් විය යුතුය. මහු කේවලය. මන්දයත් සියල්ලෙහි මැවුම්කාරයා මහු නිසාය. මහුට සමව අන් කෙනෙකු නැත. එහෙයින් ඍජු අධිෂ්ඨානයන් සහ සියලු වැඳුම් පිදුම් අල්ලාහ්ට පමණක් සීමා විය යුතුය.

2. සිතෙහි නිභතමානී ඍජු ප්‍රතිපත්තීන් නොවන්නට ඇතිවිය හැකි චලනයෙන් බුද්ධිය සහ අදහස්

ස්වාධීනත්වය ලබන්නේය. මෙම ප්‍රතිපත්තීන් නොපිළිගන්නා අය දෙයාකාරය වේ. කොටසක්, තම සිත කිසිදු ප්‍රතිපත්තියක් නොපිළිගෙන තම සිතට එකඟවූ කරුණු මත පමණක් කුසල් කර්මයන් කිරීම. අනෙක් කොටස, නොමග හා විවිධ මිථ්‍යා මත කෙරෙහි පැටලී ඒවා පිළිගෙන ආගම අනුමත නොකළ අසුරු ක්‍රියා කිරීමට පෙර දරණ අය වේ.

3. සිත සහ චින්තන සංසුන් වීම: කෙනෙකු මෙම ප්‍රතිපත්තීන් ස්ථිරව විශ්වාස කරන කළ එ ප්‍රතිපත්තීන් තම නිර්මාතෘවරයා වෙත අනලස්ව ළඟා කරන අතර, සිත් සැනසුම සහ චින්තනයද සංසුන් වන්නේය. අල්ලාහ් තම පාලකයා සහ නීති සම්පාදකයා ලෙසද හෙතෙම පිළිගන්නේය. එම දෙවියා තීරණය කරන ලද පෙරමිනුම මත මනුගේ සිත් සන්තානය සංසුන් වී ඉස්ලාම් ආගම කෙරෙහි විවර වන අතර අන් මිසදිටු ආගමක් වෙත නොහැරෙන්නේය.

4. සර්වබල එකම දෙවියා අල්ලාහ්ට පමණක් වැඳුම් පිදුම් කිරීම හැර, අල්ලාහ්ගේ නිර්මාණයන් කෙරෙහි වැඳුම්පිදුම් කර නොමග යැමෙන් වැළකී චින්තනය සහ ක්‍රියාවන් ප්‍රගතියක් ලැබීම. වක්තෘවරු කෙරෙහි විශ්වාස කිරීමද මෙම ප්‍රතිපත්තියෙහි එක් කොටසක්වේ. මෙම විශ්වාසය වක්තෘවරයාගේ අනුශාසන පිළිගෙන ජීවත්වන්නන් හට ශාන්තියක් හා සමාධියක් කෙරෙහි තිරසාර වගකීමක් සහිත වන්නේය.

5. සෑම කටයුත්තකදීම ස්ථිරව සන්සුන්ව සිටීම: කුසල් කර්මයන් කිරීමට ලැබෙන සෑම අවස්ථාවක්ම අල්ලාහ්ගේ වරප්‍රසාදයන් උදෙසා ප්‍රයෝජනයට ගෙනද අල්ලාහ්ගේ

බලවත් අඬුවමට බියවී අකුසල් කර්මයන් සිදුවන්නා ස්ථානයන්ගෙන් පවා ඈත්වී සිටීමට අවස්ථා උදාවෙයි. මන්දයත්, කළ කුසලාකුසලයන් අනුව මරණින් මතු ජීවිතයේ ඵලවිපාක ලැබීම කෙරෙහි විශ්වාස කිරීමද මෙම විශ්වාස පද්ධතියේ තවත් ප්‍රධාන ලක්ෂණයක් ලෙස තිබිමයි. ඒ ගැන පරිශුද්ධවූ අල්කර්ආනය මෙසේ විස්තර කරයි :

﴿وَلِكُلٍّ دَرَجَاتٌ مِّمَّا عَمِلُواْ وَمَا رَبُّكَ بِغَافِلٍ عَمَّا يَعْمَلُونَ﴾

*සියලු දෙනා හට මනුක්ගේ ක්‍රියාවන් හට නිලයන් වේ. ඔබ කරනා කාර්යයන් ගැන ඔබ දෙවියා අපරීක්ෂාරීව නොසිටී.* (අල්කුර්ආන් 6 : 132)

මුහම්මද් තුමා දෙසූ මතු පවසන හදීසය මෙම පරමාර්ථය කෙරෙහි මිනිසා දිරිගන්වයි :

المئمن التقوي خير وأحب الى الله من المئمن الضعيف ، وفى كل خـــيرا ، احرص على ما ينفعك وا تعن بالله ، ولا تعجز ، وإن أصابك شيئ فلا تقل لو أنى فعلت كان كذا وكذا قل : قدر الله وما شاء فعل ، فإن لو تفـــتح عمل الشيطان .

ස්ථිර විශ්වාසවන්තයෙකු බෙලහීන විශ්වාසවන්තයෙකුට වඩා අල්ලාහ් ප්‍රිය කරයි. නමුදු සියල්ලන්ට යහපත් කර්මයන් වේ. යුක්තිසහගත, ඔබට ප්‍රයෝජනය ගෙන දෙන දේ කෙරෙහි ඇලුම් කරන්න. තවද, අල්ලාහ්ගෙන් පමණක් උදව් පතන්න. අධෛර්යය නොවන්න. ඔබට අයහපතක් සිදුවූ කල්හී මා මෙසේ කළා නම් මෙය

සිදුවන්නේ නෑ නොවේද, යනුවෙන් වලන බුද්ධියෙන් නොපවසන්න. අල්ලාහ් විසින් තීරණය කළ පූර්ව සැලැස්ම වන දෛවය සිදුවිය යනුවෙන් පමණක් පවසන්න. මා මෙසේ කළා නම් යනුවෙන් පවසන යමෙකුගේ වදන් ෂෙයිතාන්ගේ ක්‍රියාවන් හට මග පාදන්නේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

6. නියම සමාජයක් බිහිකිරීම: නියමාකාරයෙන් ඉස්ලාමීය ආගම ස්ථිර කිරීම මගින් ඒ ආගම ව්‍යවස්ථාවීම පිණිස උත්සාහ දරණ ශක්තිමත් සමාජයක් බිහි කිරීම. එසේ අල්ලාහ්ගේ මාවතෙහි නිහතමානීව තම ජීවිතය යොමු කරන කළ ඇතිවිය හැකි කිනම් කරදරයක් වුවද එය ඉවසා ගත හැකි එඩිතර සමාජයක් ඇතිකිරීම.

අල්ලාහ් ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿إنما المؤمنون الذين آمنوا بالله ورسوله ثم لم يرتابوا وجاهدوا بأموالهم وأنفسهم فى سبيل الله أولئك هم الصادقون﴾

*සැබැවින්ම (සත්‍ය) විශ්වාසවන්තයින් කවරෙකු වේ නම්, මොවුහු අල්ලාහ් කෙරෙහි සහ අල්ලාහ්ගේ වක්තෘවරයා කෙරෙහි විශ්වාස කර, පසු සැක නොකොට තම ජේසන් ප්‍රාණයන් අල්ලාහ් වෙනුවෙන් පරිත්‍යාග කරන්නන් වේ. නියම සත්‍යවන්තයින් මොවුන්ය.* (අල්කුර්ආන් 49 : 15)

7. නනි පුද්ගලයා සහ සමාජය සෘජු ලෙස සදාතනික අයුරින් යහමගට යොමුකිරීමෙන් එලොව, මෙලොව

ජයගැනීම සහ යහපත් ප්‍රතිලාභයක් හා කීර්තියක් ලබා ගන්නට හැකිවීම.

﴿من عمل صالحا من ذكر أو أنثى وهو مؤمن فلنحيينه حياة طيبة ولنجزينهم أجرهم بأحسن ما كانو يعملون﴾

*පුරුෂයෙකුගෙන් හෝ ස්ත්‍රියන්ගෙන් හෝ යමෙකු විශ්වාසවන්තයෙකු ලෙස වී (අව්‍යාජ) යහකමක් කළේද, සැබැවින්ම අප ඔහු, යහ දිවිපෙවෙතක් වෙත යොමු කරන්නෙමු. තවද, (එළොව) ඔවුන් හට, ඔවුන් කරමින් හුන් යහ දේ මගින් ඉතා අගනා ප්‍රතිලාභද ලබා දෙමු.*

(අල්කුර්ආන් 16 : 97)

ඉහත විස්තර වූයේ ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි සමහර ප්‍රගති ඉලක්කයන් වේ. මෙම අසහාය ප්‍රතිපත්තීන් නිදොස්ව, නිසියාකාරව සහ ක්‍රමිකව පිළිපැදීමට අපට සහ අන් සියලු මුස්ලිම්වරු හට සර්ව බලධාරී අල්ලාහ් අවස්ථාව උදා කරත්වා!

සියල්ල දන්නේ අල්ලාහ් පමණි!

تم بعون الله وتوفيقه ترجمة وإصدار هذا الكتاب
**بالمكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات**
**بحـي الروضـــة**

**تحت إشراف وزارة الشؤون الإسـلاميـة والأوقـاف**
**والدعوة والإرشاد**

الرياض ١١٦٤٢ ص.ب ٨٧٢٩٩
هاتف ٤٩٢٢٤٢٢ فاكس ٤٩٧٠٥٦١

يسمح بطبع هذا الكتاب وإصداراتنا الأخرى بشرط عدم التصرف في أي شيء ما عدا الغلاف الخارجي.

**حقوق الطبع ميسره لكل مسلم**

# شرح أصول الإيمان

تأليف-فضيلة الشيخ- **محمد بن صالح العثيمين** (رحمه الله)

# ෂර්හ් උසූල් අල්-ඊමාන්

## (ඉස්ලාමීය විශ්වාස පද්ධති විග්‍රහය)

ترجمه - أبو شاعره محمد حسين

مكتب الدعوة بحي الروضة

راجعه - محمد سلسبيل - مكتب الدعوة بالزلفي

نور محمد حفيظ أمين - مكتب الدعوة بالأحساء

**කතෘ**

**මුහම්මද් බින් සාලිහ් අල් උථෛමීන්**

**සිංහලෙන්**

**අබුෂාඉරා මුහම්මදු හුසෙයින්**

# قيمة طباعة النسخة الواحدة ريال واحد . . .
# تنقذ يه كافرا من كفره أو جاهلاً من جهله



مطبعة النرجس: ت: ٢٣١٦٦٥٣ ف: ٢٣١٦٨٦٦

ردمك: ٢-١-٩٥٣٩-٩٩٦٠

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بحي الروضة بالرياض
تحت إشراف وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف: ٤٩٢٢٤٢٢ فاكس: ٤٩٧٠٥٦١ البريد الإلكتروني: mrawdhah@hotmail.com ص.ب ٨٧٢٩٩ الرياض ١١٦٤٢